# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# 2012




## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

## ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ගැන

1988 පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කොට 1990 අප්‍රේල් මස විධිමත්ව නෛතික සංයුතියක් ලෙස ගැසට් නිවේදනයකින් පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති ආයතනය (IPS) ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීමට අදහස් කරන ලද සංස්ථාවකි. රටේ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රමුඛතම පර්යේෂකයා ලෙස ස්ථාපනය වී ඇති මෙම ආයතනය අද එහි ස්වාධීනත්වය හා ආර්ථික ප්‍රතිපත්ති සමීක්ෂණ පිළිබඳ විශිෂ්ටත්වය ගැන දකුණු ආසියානු කලාපයේ පිළිගැනීමක් දිනා ගෙන සිටී.

ආරම්භයේ සිටම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට පර්යේෂණ වැඩ සටහන් තෝරා ගැනීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සැලකිය යුතු ස්වාධීනත්වයක් තිබිණ. මෙම ආයතනය පාලනය වන්නේ පාලන මණ්ඩලයකින් හා විධායක අධ්‍යක්ෂක වරයෙකුගෙනි. ආයතනික ව්‍යුහය අනුව මෙම ආයතනයට රජය, පෞද්ගලික අංශය, ශාස්ත්‍රඥයන් හා සිවිල් සමාජය වැනි සමාජයේ හරස්කඩක් සමග සමීපව වැඩ කිරීමට ඉඩ ප්‍රස්ථාවක් ඇතිව ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණයේ දී ප්‍රබල හා ස්වාධීන හඬක් හිමි කර ගැනීමට හැකි විය.

### මෙහෙවර

මෙම ආයතනයේ මෙහෙවර වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික සංවර්ධනයට හා සමාජ ආර්ථික ප්‍රතිපත්ති සැකසීම පිළිබඳව පර්යේෂණ පදනම් වූ විශ්ලේෂණ ලබා දීමෙන් එහි ජනතාවගේ ජීවිතයේ ගුණාත්මක භාවය නගා සිටුවීමට දායකවීමය.

### දැක්ම

ආයතනයේ දැක්ම වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික සංවර්ධනයක් සඳහා වූ ජාතික ආර්ථික ප්‍රතිපත්ති ප්‍රශ්නුත පිළිබඳ සංවාදයට කාලීන, ස්වාධීන හා උසස් ගුණාත්මක භාවයෙන් යුත් පර්යේෂණ පදනම් විශ්ලේෂණ සැපයීමෙන් දැනුවත් හා බලපෑමෙන් යුත් ප්‍රසිද්ධ ප්‍රතිපත්ති සංවාදයේ නායකයා වීමය.

# පාලන මණ්ඩලය



ඩබ්ලිව් ඩී ලක්ෂ්මන් ( සභාපති)

ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් (නිල බලයෙන්)

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති (නිල බලයෙන්)

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කරමින්
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්

එස් ටී හෙට්ටිගේ - කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා මහාචාර්ය

ඒ ඒකනායක - සභාපති, ශ්‍රී ලංකා වානිජ මණ්ඩලය

එල් ගුණරුවන් - කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

# සභාපති තුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2012 වසරේ දී සිය විසි අටවැනි සංවත්සරය සැමරුවේය. පසුගිය දශක ගණනාවක් තිස්සේම නිරීක්ෂණය වූ එහි ව්‍යාප්තිය සහ ප්‍රගමනය මෙම වාර්ෂික වාර්තාවෙන් කදිමට දක්වෙන ආකාරයට පසුගිය වසරේ ද නොකඩවා පැවතිණ. එහි පර්යේෂණ සහ වෙනත් කටයුතු, වෘත්තීය සහ ආධාරක කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාවෙන් සහ ගුණාත්මක භාවයෙන්, ජාතික ආර්ථික ප්‍රතිපත්ති බුද්ධි සංචිතයක් ලෙස දේශීය හා අන්තර්ජාතික පිළිගැනීම යනාදී වශයෙන් එහි ප්‍රගතිය විවිධ කෝණයන්ගෙන් කැපී පෙනේ.

මෙම වසරේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විවිධ රාජ්‍ය ආයතන වලට සහ වෙනත් දේශීය හා විදේශීය සංවිධාන වලට බොහෝ වැදගත් හා ප්‍රතිපත්ති අදාල පර්යේෂණ ව්‍යාපෘති වලින් දායක වීමෙන් ප්‍රයෝජනවත් දැනුම් නිර්මාණයට සහ ප්‍රතිපත්ති විශ්ලේෂණයට දායක වූයේය. සේවා දායකයන් සඳහා කරන ලද එවැනි කාර්යන්ට අමතරව මෙම ආයතනය අදාල සහ වැදගත් ප්‍රතිපත්ති ගැටලු ගැන වූ තමන්ගේම පර්යේෂණ ගණනාවක් සිදු කරන ලදී. මෙම පර්යේෂණ වලින් සැලකිය යුතු සංඛ්‍යාවක් මුද්‍රණ සහ ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් ප්‍රකාශයට පත් කෙරිණ. ආර්ථික තත්වය පිළිබඳ වාර්ෂික වාර්තාව මෙම ප්‍රකාශන අතර ඉහළම ස්ථානය ගන්නා අතර ආයතන සහ පුද්ගල පාඨකයන් විශාල සංඛ්‍යාවක් සමකාලීන ශ්‍රී ලාංකික සන්දර්භයේ දී අදාල සමාජ ආර්ථික ප්‍රතිපත්ති ගැටලු පිළිබඳ ස්වාධීන විශ්ලේෂණයක් සඳහා රැඳී සිටින්නේ ඒ කෙරේය.

මෙම ආයතනය දේශීය විශ්ව විද්‍යාල සහ වෙළඳ මණ්ඩල මෙන්ම කලාපීය හා අන්තර්ජාතික පර්යේෂණ සංවිධාන වැනි සමාන අරමුණු ඇති දේශීය හා අන්තර්ජාතික සංවිධාන සමග සම්බන්ධතා පවත්වා ගැනීම සහ පුළුල් කිරීම දිගටම සිදු කර ගෙන යයි. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ගෝලීය සම්බන්ධතා සම්බන්ධයෙන් බුද්ධි සංචිත මුලපිරුම් සංචිත ව්‍යාපෘතියේ කොටසක් වශයෙන් කැනඩාවේ අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ කේන්ද්‍රයේ සහාය ඇතිව 2011 සිට ක්‍රියාත්මක වන වැඩ සටහන මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

ආයතනයේ සාර්ථකත්වය පසු පස වන්නේ එහි ප්‍රවීන කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ ස්වාධීන ප්‍රතිපත්ති පර්යේෂණයට ඇති කැපවීමයි. නිරීක්ෂණයට ලක් වන වසර තුළ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් කීප දෙනකු ඉල්ලා අසු වුවද එම පුරප්පාඩු ආයතනයේ කාර්යක්ෂමතාවයට බලපෑමක් නොවන ආකාරයට පුරවා ගැනීමට හැකි විය. අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතව සිටි සමහර වෘත්තීයවේදීහු ආයතනයේ ශක්තිය තවත් වැඩි කරමින් 2012 වසර තුළ ආචාර්ය උපාධි ලබා ආපසු පැමිණියහ. දේශීය සහ විදේශීය ශාස්ත්‍රීය/ පුහුණු ආයතන වලින් තම ශිෂ්‍යයන් සහ අභ්‍යාසලාභීන් ගේ සීමාවාසික පුහුණුව සඳහා ආයතනයෙන් කරන ඉල්ලීම් වැඩි වෙමින් පවතී. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට අවශ්‍ය අවස්ථාවක මෙය සරු මානව සම්පත් මූලාශ්‍රයක් විය හැකි බැවින් සැලකිල්ල යොමු විය යුතුය.

නිරීක්ෂණයට ලක් වන කාල පරිච්ඡේදය තුළ ආයතනයේ වැඩ වලට කටයුතු කාර්යක්ෂමව මග පෙන්වූ පාලන මණ්ඩලයේ සේවාව අගය කිරීමෙන් මෙම පණිවුඩය අවසන් කරනු කැමැත්තෙමි. විධායක අධ්‍යක්ෂක වරයා ආයතනයට ලබා දුන් දූර දර්ශී කළමනාකරණ නායකත්වයත් ආයතනය ඉන් පරිබාහිර ලෝකයට නියෝජනය කිරීමේ දී ඉටු කළ භූමිකාවත් අගය කළ යුතුය. ආයතනය මූල්‍යමය හා ආයතනික වශයෙන් වඩාත් ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියකට පිවිස ඇත. ප්‍රතිපත්ති සම්පාදකයන් ඉදිරි වසර වලදී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය වැඩි දියුණු වූ ආයතනික තත්වයන්ගෙන් හා නිරන්තරයෙන්ම ප්‍රවීනත්වයෙන් වර්ධනය වන මානව සම්පත් පදනමක් ඇති ප්‍රතිපත්ති පර්යෙෂණ ආයතනයක් ලෙස වඩාත් වැඩි විශ්වාසයකින් බලනු ඇතැයි මට නිසැකය.



**මහාචාර්ය (සම්මානික) ඩබ්ලිව් ඩී ලක්ෂ්මන්**

# විධායක අධ්‍යක්ෂක වරයාගේ වාර්තාව



ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට 2012 වසර ඉහළ මට්ටමේ කාර්යන් ගණනාවක් සංවිධානය කිරීමෙන් හා විශේෂ අමුත්තන් ගණනාවකගේ පැමිණීමෙන් සනිටුහන් කරන කාර්ය බහුල වූවකි. මෙම වසරේ දී ආයතනයට සහාය කාර්ය මණ්ඩලයේ පළපුරුදු සේවකයන් ගණනාවක්ම අහිමි විය. කෙසේ වුවත් සහාය සේවාවන් කාර්යක්ෂමව පවත්වා ගැනීමට හා සංක්‍රාන්ති පිරිවැය අවම කිරීමටත් පියවර ගන්නා ලදී.

මෙම වසරේ දී අප ආයතනය ව්‍යාපෘති 10 ක් නිම කර නව ව්‍යාපෘති 14 කට මුල පුරන ලදී. අප ආයතනයට ලැබුණු ඉතා වැදගත් ව්‍යපෘතියක් වන්නේ සමාජ ආරක්ෂණය සහ සුභ සාධන විශ්ලේෂණය යි. පසුගිය වසර තුන තුළ ව්‍යාපෘති වලින් ලැබුණු සාමාන්‍ය ආදායම රුපියල් දශ ලක්ෂ 30 කට වඩා වැඩිය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සංචිත වලින් ලැබුණු පොලී සහ එන්ඩොව්මන්ට් ෆන්ඩ් (Endowment - Fund ) සහාය ඇතිව ආයතනයේ වර්ධනය වන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් සාර්ථක ලෙස උපයා ගැනීමට හැකි විය. ආයතනයේ ශ්‍රවනාගාරය 2012 වසරේ සියලු ප්‍රධාන කාර්යන් සඳහා සම්පූර්ණයෙන්ම යොදා ගත් අතර එය ආයතනයට ආදායම් ජනනය කිරීමේ මාර්ගයක් ද විය. එන්ඩොව්මන්ට් ෆන්ඩ් යොදා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පාලක මණ්ඩලය එය භාරයක් බවට පත් කිරීමට තීරණය කරන ලද අතර මෙම වසර තුළ එහි සූදානම්වීමේ සියලු කටයුතු සිදු කෙරිණ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රබල හඬක්වීමේ කීර්තියක් දිනා ගැනීම, 2012 වසරේ දී විශේෂ අමුත්තන් ගණනාවක් අප ආයතනයට පැමිණීමෙන් පිළිබිඹු වේ. ඔවුන් අතර සිංගප්පූරුවේ විදේශ කටයුතු හා අධිකරණ ඇමති කේ ෂන්මුගම් මහතා, එ ජා සහකාර මහ ලේකම් ආචාර්ය අජේ චිබර් මහතා, ලෝක බැංකුවේ දකුණු ආසියානු දෙපාර්තමෙන්තුවේ ප්‍රධනි, ආචාර්ය කල්පනා කොචාර්, අයි එම් එෆ් ආයතනයේ අධ්‍යක්ෂ ආචාර්ය ෂාමිනි කුරේ වෙති. මෙම අමුත්තන්ට අමතරව 2013 හා 2014 එ ජා මානව සංවර්ධන වාර්තා සකස් කිරීම සඳහා කලාපීය උපදේශන දකුණු ආසියානු විද්වතුන් ගණනාවක සහභාගිත්වයෙන් අප ආයතනයේ දී පවත්වන ලදී. දකුණු ආසියාවේ කෘෂිකාර්මික අංශය පිළිබඳ ය්‍යහ සමුළුව හා ARTNet සමුළුව අප ආයතනයේ සහයෝගයෙන් පැවැත්විණ. අප ආයතනයේ විධායක අධ්‍යක්ෂකවරයාට ටෝකියෝ හි පැවති ලෝක බැංකු - ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන රැස්වීමේ සිවිල් සමාජ සංවිධාන නගර සභා (Civil Society Organization Townhall) සඳහා සම්පත්දායකයෙකු වශයෙන් ආරාධනය කරන ලද අතර පර්යේෂණ ආර්ථික විද්‍යඥයාට වොෂින්ටනයේ පැවති ලෝක බැංකු ජාත්‍යන්තර මූල්‍ය සංවිධාන වසන්ත රැස්වීමට දායක වන ලෙස ආරාධනය කෙරිණ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රබල හඬක්වීමේ කීර්තියක් දිනා ගැනීම, 2012 වසරේ දී විශේෂ අමුත්තන් ගණනාවක් අප ආයතනයට පැමිණීමෙන් පිළිබිඹු වේ.

අප ආයතනය මෙම වසරේ දී ප්‍රකාශන 12 ක් එළි දක්වන ලදී.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2012 වසරේ විශාල ජයග්‍රහණයක් වන්නේ ජාතික මානුෂික සංවර්ධන වාර්තාව සකස් කොට එළිදැක්වීමයි. 2005 - 2009 කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකාවේ ජාතික සෞඛ්‍ය ගිණුම් වල 4 වැනි කලාපය නිකුත් කිරීම ද එවැනිම ජයග්‍රහණයකි.

අප ආයතනයේ 'ආර්ථිකයේ තත්වය පිළිබඳ වාර්තාවේ' අවධානය යොමු වූයේ ශ්‍රී ලංකාව සීඝ්‍රගාමී වර්ධන මාවතකට යොමු කිරීමයි. මෙම වාර්තාවෙන් 2012 දී ප්‍රකාශන වල විසිවැනි සංවත්සරය සැමරිණ. ආයතනයේ වාර්ෂික සමුළුවට පදනම් වූයේ දැන් වාර්ෂිකව පැවැත්වෙන අවස්ථාවක් වන 2011 වසරේ දී අප ආරම්භ කළ ආර්ථිකයේ තත්වය පිළිබඳ වාර්තාවයි. 2012 වසරේ දී ආර්ථිකයේ තත්වය පිළිබඳ වාර්තාව ප්‍රථම වරට පරිගණක සංඛ්‍යාංක මාර්ගයෙන් ද එළිදැක්විණ.

ආයතනයේ ප්‍රජා ව්‍යාප්තිය වැඩි දියුණු කිරීම සඳහා මෙම වසරේ දී නව සමාජ මාධ්‍ය මෙවලම් ද (New Social Media tools) ද භාවිතයට ගැනිණ. 2012 වසරේ මුල් භාගයේ දී ආයතනයේ ෆේස් බුක් පිටුවක් හා ට්විටර් ගිණුමක් විවෘත කෙරිණ. බ්ලොග් රචනා 35 කට ආසන්න සංඛ්‍යාවක්, සම්මුඛ සාකච්ඡා 8 ක්, මාර්ග ගත බා ගැනීම් හා වෙනත් ඇතුළත් කිරීම් එහි ඇත. Talking Economics බ්ලොග් පිටුව අයිපෑඩ් හි හොඳින් දර්ශනය වීම සඳහා නැවත ෆෝමැට් කරන ලද අතර අප ආයතනයේ පර්යේෂකයින්ට කෙටි නොවිධිමත් අදහස්, සාකච්ඡාව සඳහා ඉදිරිපත් කිරීමට නෝට්පෑඩ් හඳුන්වා දෙන ලදී. Climate Net සහ දකු-ණු ආසියානු එසටර්එසදබ හැළු ආයතනයේ වෙබ් පිටුවේ යදපැ පිටුවට ගෙන යාමට ද පියවර ගන්නා ලදී.

රජයට මෙම ආයතනයෙන් ලබා දුන් වැදගත් දායකත්වය වන්නේ පහත සඳහන් වාර්තා සකස් කිරීමය. ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තිය, ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුවේ වැඩ, ශ්‍රී ලාංකීය සංක්‍රමණ පැතිකඩ සකස් කිරීම සහ සංක්‍රමණිකයන් සඳහා නව වෙළඳ පොළ ගවේෂණය ගැන අධ්‍යයනය, ජාතික සෞඛ්‍ය ගිණුම් සකස් කිරීම, උතුරු

නැගෙනහිර පළාත් පාලන සමීක්ෂණය, රාජ්‍ය කළමනාකරණ ප්‍රතිශෝධන ප්‍රතිපත්තිය සකස් කිරීම, කුඩා සහ මධ්‍යම කර්මාන්ත සංවර්ධන කාර්ය සාධක බලකාය, ඉන්දියානු සාගර වළල්ලේ ශාස්ත්‍රඥ කණ්ඩායම සහ තවත් බොහෝ දේය.

පෞද්ගලික අංශය සමග මෙම ආයතනයේ පැවති සහයෝගිතාවය බොහෝ ක්ෂේත්‍ර වල කැපී පෙනෙන සුළුය. ඒ අතර, 2012 ශ්‍රී ලංකාවේ ආර්ථික නායක හමුව, ජපන් ශ්‍රී ලංකා 60 වනි සංවත්සරය, ශ්‍රී ලංකා වානිජ මණ්ඩලයේ 2012 වසරේ හොඳම සංස්ථා පුරවැසි ත්‍යාග ප්‍රදානය ලෝක පාරිභෝගික දිනය වෙනුවෙන් වානිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය සමග පැවැත් වූ උත්සවය. අපගේ පර්යේෂණ කාර්ය මණ්ඩල සාමාජිකයෝ පෞද්ගලික අංශයේ පාලන මණ්ඩල ගණනාවක සේවය කරන අතර ඔවුන්ගේ වැඩ කටයුතු වලට දායක වෙති.
ප්‍රදානකයන් සමග පැවති කාර්යන් පෙර වසර වල මෙන්ම සිදු විය. මෙම ආයතනය ආසියානු සංවර්ධන බැංකුව සමග සමාජ ආරක්ෂණය, අසමානතාවය, සමානතාවය සහ යහ පැවැත්ම පිළිබඳ කරුණු ගැනත්, ලෝක බැංකුව සමග ආරක්ෂණ ජාලයන් සහ සමාජ ආරක්ෂාව ගැනත්, එ. ජා. සං. වැඩ පිළිවෙළ UNDP සමග මානව සංවර්ධන වාර්තා ගැනත්, ජාත්‍යන්තර මූල්‍ය සංවිධානය සමග ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රශ්නුත පිළිබඳ සංවාදයත් යනාදි වශයෙනි.

> අපගේ පර්යේෂණ කාර්ය මණ්ඩල සාමාජිකයෝ පෞද්ගලික අංශයේ පාලන මණ්ඩල ගණනාවක සේවය කරන අතර ඔවුන්ගේ වැඩ කටයුතු වලට දායක වෙති.

2010 වසරේ දී අපට ලැබුණ බුද්ධි සංචිත මුලපිරුම (TTI) ප්‍රදානය ආයතනයට ඉමහත් සේවයක් සිදු විය. මෙම ආයතනය, TTI ආයතනය වසර තුළ සංවිධානය කළ වැඩ ගණනාවකට සහභාගි වූ අතර ඒවා මෙම වාර්තාවේ සවිස්තරව දක්වා ඇත. TTI ආයතනයේ කේප්ටවුන් රැස්වීමේ දී අප ආයතනය පශ්චාත් 2015 සහශ්‍රක සංවර්ධන ඉලක්ක පිළිබඳ දකුණු හඬ ව්‍යාපෘතිය මුල පිරුමට අනෙකුත් ආයතන සමග හවුල්විය. එය 2012 අවසානයේ යථාර්ථයක් විය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2013 ප්‍රධාන අවස්ථා දෙකක් සංවිධානය කිරීමට මුල පිරුවේය. එනම්, TTI 3 වැනි රැස්වීම සහ 6 වැනි දකුණු ආසියානු ආර්ථික නායක හමුවයි. මෙම අවස්ථා සඳහා වූ සමහර සංවිධානාත්මක වැඩ 2012 දී ආරම්භ කර තිබිණ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයේ දකුණු ආසියානු අධ්‍යයන ආයතනය සමග දැනට කෙරීගෙන යන වැඩ විධිමත් කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කෙරිණ. අප ආයතනය පළමු වරට සියලුම විශ්ව විද්‍යාල වල ආර්ථික පීඨ නියෝජිතයන්ගේ විශ්ව විද්‍යාල සංවාද මණ්ඩපයක් සංවිධානය කොට දින දෙකක සංවාදයකට ඔවුන්ට ආරාධනය කෙළේය. මෙම මණ්ඩපය තුළින් දේශීය විශ්ව විද්‍යාල සමග ජාලයක් ගොඩ නැගීමේ අප වැඩ පිළිවෙළ ශක්තිමත් විය.

අපගේ පර්යේෂණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු 2012 වසරේ දී තම ආචාර්ය උපාධි සම්පූර්ණ කොට නැවත පැමිණි අතර අපගේ පුස්ථකාලයාධිපතිනිය ආචාර්ය උපාධියක් දිනා ගනිමින් ශ්‍රී ලංකාවේ එවැනි උපාධි හිමි අතළොස්ස අතරට පත් විය. වසර තුළ දී අලුතින් පර්යේෂණ සහකරුවෙකු, වෙබ් නිර්මාණකරුවෙකු (Web Developer) හා විද්‍යුත් කර්තෘ වරයෙකු බඳවා ගන්නා ලදී.

මෙම වසරේ දී සේවය කළ ව්‍යාපෘති සීමාවාසීන්ගේ සංඛ්‍යාවේ ඉහළ යෑමක් ද දක්නට ලැබිණ. කෙසේ වුවත් ආයතනයට දශකයක් හෝ ඊට වැඩි කාලයක් සේවය කළ මූල්‍ය සහ පරිපාලන අධ්‍යක්ෂක, ප්‍රවීන ලේකම්වරුන් දෙදෙනෙක් සහ ජ්‍යෙෂ්ඨ බාහිර අධි සාමාජිකයන් දෙදෙනෙක් ආයතනයෙන් ඉවත් වූහ. ප්‍රථම වරට ආයතනයට වසර 15 කට වැඩි කාලයක් සේවය කළ කාර්ය මණ්ඩලයේ සේවය ඇගයීමක් ද පැවැත්විණ.

TTI ප්‍රදානය වසර තුළ ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමහර අය පුහුණු කිරීමේ දී ඉමහත් පිටුවහලක් විය. 2013 දී එහි ආධාරක සේවා තුළින් මානව සම්පත් සංවර්ධන ඒකකයක් පිහිටුවීමට අප ආයතනය සැලසුම් කරයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පාලක මණ්ඩලය ආයතනයේ ව්‍යාප්තිය හා විවිධාංගකරණ වැඩ සටහනට පුළුල් සහයෝගයක් දැක් වූයේය. අභියෝගාත්මක වසරක් පුරා මෙම ආයතනය මෙහෙයවීමට හා කළමනාකරණයට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ කාර්ය මණ්ඩලය ලබා දුන් සහායට හා ආධාරයට මම ස්තුතිවන්ත වෙමි.

සමන් කැලේගම
විධායක අධ්‍යක්ෂක
2013 ජුලි.

# ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ වැඩ සටහන්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ වැඩ පිළිවෙළේ කේන්ද්‍රීය අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ මධ්‍ය කාලීන ආර්ථික ප්‍රතිපත්ති ප්‍රමුඛතා පිළිබඳ සාකච්ඡාවට සහ විවාදයට ඵලදායී ලෙස දායක වීමය. පසුගිය කාලයේ ආයතනයේ පර්යේෂණ වැඩ කටයුතු විරැකියාව, කලාපීය විසමතා හා ග්‍රාමීය දරිද්‍රතාවය වැනි රටට අදාල සංවර්ධන ගැටලු ගණනාවක් කෙරේ යොමු විය. පවතින පර්යේෂණ වැඩ සටහන් වල අරමුණ වන්නේ මෙතෙක් කරන ලද සියලු වැඩ කටයුතු වඩාත් ඉදිරියට යෑම, කරන ලද පර්යේෂණ වැඩ කටයුතු වල ඇති හිඩැස් හඳුනා ගැනීම හා මධ්‍ය කාලීන වැඩ සටහන් සඳහා සංයුක්ත වැඩ සටහනක් සකස් කිරීමයි. මෙම වැඩ සටහන රටේ සංවර්ධන ප්‍රමුඛතා සඳහා වඩාත් චිරස්ථායී සහ සාධාරණ වර්ධනයක් සාක්ෂාත් කර ගැනීමේ උපාය මාර්ග කෙරේ යොමු වේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ න්‍යාය පත්‍රය ඉටු කරනුයේ අපගේ කාර්ය මණ්ඩල ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් පර්යේෂණ ඒකකයක් විසිනි. එක් ඒකකයක් ආයතනයේ වැඩ වල සමස්ත දිශානතියට අනුකූල වීම තහවුරු කිරීම සඳහා සකස් කරන ලද මධ්‍ය කාලීන පර්යේෂණ න්‍යාය පත්‍රයක් තුළ වැඩ කරයි. පර්යේෂණ ඒකක මෙසේය:

**සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය**

**අන්තර්ජාතික ආර්ථික ප්‍රතිපත්තිය**

**ශ්‍රම, සේවා නියුක්තිය හා මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය**

**කර්මාන්ත, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිශෝධන සහ නියාමන ප්‍රතිපත්තිය**

**දරිද්‍රතාවය සහ සමාජ සුභ සාධන ප්‍රතිපත්තිය**

**කෘෂිකාර්මික ආර්ථික ප්‍රතිපතිය**

**පාරිසරික ආර්ථික ප්‍රතිපත්තිය**

වැඩි දුරටත් 2011 සිට අපගේ පර්යේෂණ න්‍යාය පත්‍රය පුළුල් තේමා ක්ෂේත්‍ර හයක් කෙරේ යොමු වේ. සමස්ත, බහුවිධ කෝණයන්ගෙන් යුත් පිවිසුමක් කෙරේ මාරුවීම පිළිබිඹු කරමින් මෙම වසරේ ඇරඹුණ පර්යේෂණ අධ්‍යයන ඒකක වශයෙන් නොව තේමා යොමුව අනුව වෙන් වේ. තේමා යොමු හයක් මෙසේය:

1. සංක්‍රමණය හා සංවර්ධනය

2. මානව සංවර්ධනය හා සමාජ යටිතල පහසුකම්

3. පශ්චාත් ගැටුම් වර්ධනය

4. බාහිර තරගකාරිත්වය

5. දරිද්‍රතාවය හා අවදානම් සහගත භාවය

6. නව්‍යකරණ හා බාහිර වර්ධන ධාවකයන්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පර්යේෂණ වැඩ සටහන් මූල්‍යනය වන්නේ ආයතනයේ අරමුදල් වලින් සහ දේශීය හා ජාත්‍යන්තර හවුල්කරුවන් සමග කරන ඒකාබද්ධ ව්‍යාපෘති වශයෙන් බාහිරව ලැබෙන අරමුදල් වලිනි.

# සංක්‍රමණය හා සංවර්ධනය

දැනට ශ්‍රී ලාංකිකයන් දශ ලක්ෂ 1.7 කට ආසන්න සංඛ්‍යාවක් විදේශ රැකියා සඳහා සංක්‍රමණය වී ඇතැයි ගණන් බලා ඇත. ගණන් බල ඇති වාර්ෂික සංක්‍රමණික සංඛ්‍යාව ශ්‍රම වෙළඳ පොළට වාර්ෂිකව අලුතින් එකතු වන සංඛ්‍යාවට වඩා වැඩිය. මෙසේ සංක්‍රමණය වූ වැඩිම සංඛ්‍යාව සිටින්නේ මැද පෙරදිග රටවල් වන අතර ඉන් සියයට 70 ක් ස්ත්‍රීන්ය. මෙසේ බාහිර සංක්‍රමණයේ මූලික ගාමක බලය වන්නේ තම රටේ ප්‍රමාණවත් ජීවන මාර්ග නොතිබීම හා රැකියා අවස්ථා නොතිබීමය. අනෙක් අතට සියයට 25 ක් වන පුහුණු සංක්‍රමණිකයන් ගේ අපේක්ෂාව වන්නේ පිටරට වල වඩාත් හොඳ රැකියා අවස්ථා සහ මූල්‍ය අවස්ථා ලබා ගැනීමය.

අදාල ප්‍රේෂණ ගලා ඒමේ සාර්ව ආර්ථික බලපෑම වන්නේ ශ්‍රී ලංකාවේ විදේශ විනිමය හිඟතාවය පහසු කිරීමෙන් හා ගෙවුම් ශේෂ සහාය ලබා දීමෙන් විනිමය අනුපාතය කෙරේ ඇති බලපෑම ලිහිල් කොට ද.දේ.නි. වර්ධනයට දායක වීමය.

ක්ෂුද්‍ර මට්ටමේ දී මෙම ප්‍රේෂණ දුප්පත්ම ගෘහස්ථ වලට ආදායම් ගලා එන වැදගත් මාර්ගයකි. කෙසේ වුවත් ප්‍රේෂණයේ බලපෑම සංක්‍රමණිකයාගේ සහ ඔවුන්ගේ පවුලේ චරිත ස්වභාවය අනුව පවුලේ සුභ සාධනය සම්බන්ධයෙන් සාධනීය හෝ නිෂේධනීය විය හැකිය. රැකියා සඳහා සංක්‍රමණය වීමේ සමාජ පිරිවැයක් ද විය හැකිය. ඒ පවුල් කඩාකප්පල්වීම, ගිවිසුම් කඩා දැමීමෙන් සංක්‍රමණිකයන්ට ඇතිවිය හැකි අවදානම, වැඩ කරන කාලය දීර්ඝවීම, වැටුප් නොගෙවීම හා සේවාදායකයන්ගේ අතවර වලට ලක්වීම ආදී වශයෙනි. එය රටේ බුද්ධි ගලනයට ද දායකවේ.

2012 වසරේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය '2012 වසරේ දී සංක්‍රමණය හා ප්‍රේෂණ ශ්‍රී ලංකවේ ආර්ථිකය කෙරේ ඇති කරවන බලපෑම්' ගැන විමර්ශන ගණනාවක නිරතවිය.

## පර්යේෂණ අධ්‍යයනයන්:

සංක්‍රමණ පැතිකඩ: 2011 ශ්‍රී ලංකාව විදේශ රැකියා ප්‍රවර්ධන හා සුභ සාධන අමාත්‍යාංශයේ අරමුදල් වලින්. (කණ්ඩායම: රොෂිනි ජයවීර සහ නිෂා අරුණතිලක)

*සංක්‍රමණය පිළිබඳ දත්ත සීමිතය. විවිධ අමාත්‍යාංශ අතරත්, මුල් රට සහ ගමනාන්තය වන රටවල් අතරත් විසිරී ඇති නිසා සංයුක්ත සංක්‍රමණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සමහර විට වඩාත් දුෂ්කර කරවයි. ඒ අනුව යුරෝපා කොමිසම 2005 දී සංක්‍රමණයට අදාල තොරතුරු ලබා දීම හා රටක සංක්‍රමණ චිත්‍රය එක වරම වඩාත් පැහැදිලිව දැක ගැනීමේ ප්‍රධාන පරමාර්ථයෙන් සංක්‍රමණික පැතිකඩ (Migration Profiles) සකස් කිරීමට යෝජනා කෙළේය. එතැන් සිට විවිධ රටවල් එවැනි සංක්‍රමණික සාරාංශ සකස් කර ඇත.*

*ශ්‍රී ලංකාවේ ද සංක්‍රමණික දත්ත වල සීමිත හා විසිරුණ බව සංක්‍රමණ සැලසුම් කිරීමේ සහ කළමනාකරණයේ ප්‍රධාන බාධකයක් බවට පත්ව ඇත. ශ්‍රී ලංකාවේ සංක්‍රමණික සාරාංශය රටේ සංක්‍රමණික ප්‍රවනතා ගැන සවිස්තරාත්මක තොරතුරු ලබා දීමට හා සංවර්ධනයේ නොයෙකුත් ලක්ෂණ වලට එහි බලපෑම විශ්ලේෂණය කිරීමට අරමුණු කර ගනී. එමෙන්ම සංක්‍රමණික පැතිකඩ ශ්‍රී ලංකාවෙන් යන සංක්‍රමණිකයන් මුහුණ දෙන ප්‍රධාන අභියෝග ගැන දළ සටහනක් ලබා දීමට අරමුණු කර ගනී. මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ සංක්‍රමණයේ සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය සම්බන්ධයෙන් වැඩි දියුණු කළ යුතු මූලික ක්ෂේත්‍ර ඉස්මතු කර දක්වයි.*

## ප්‍රකාශණ:

Karunaratne, C. and Abayasekara, A. (2012), *Managed Migration: Review of Readmission Agreements and a Case Study of Sri Lanka.* Jointly published with the International Organization for Migration (IOM), funded by the European Union.

Kelegama, S. and Jayaweera, R. (2012), "Life and People in Diaspora: Entrepreneurship and Remittances," in Reeves, P. (ed.) *Encyclopedia of the Sri Lanka Diaspora,* Institute of South Asian Studies, Singapore.

Parakrama, A., Jayaweera, R. and Perera, N. (2012), *Impact of Migration and Remittances on Investment in Agriculture and Food Security in Sri Lanka,* IPS Research Studies: Agricultural Economic Policy Series No.8, February.

# මානව සංවර්ධනය සහ සමාජ යටිතල පහසුකම්

ගෝලීය වෙළඳ පොළට අවශ්‍ය කරන නිපුණතා නිතරම වෙනස් වන සුළුය. ආයෝජන සහ ව්‍යාපාර ආකර්ෂණය කර ගන්නා අතර තරගකාරීව සිටීම සඳහා නිපුනතාවයෙන් යුත් ශ්‍රම හමුදාවක වැදගත්කම දූන් හොඳින් පිළිගනී. ශ්‍රී ලංකාවේ නිපුනතාවයෙන් යුත් ශ්‍රමිකයන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යමින් පවතී. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) වැනි සමහර ක්ෂේත්‍රවල ශ්‍රම ඌනතාවයක් පවතී. රටේ හදිසි මානව සම්පත් අවශ්‍යතාවය වන්නේ ඉහළ යන ඉල්ලුම සපුරාලීමයි. කෙසේ වුවත් රටට ගෝලීය දැනුම් ආර්ථිකයේ කැපී පෙනී සිටීමටත්, ගෝලීය වෙළඳ පොළ තරගකාරීව සිටීමටත් නව අදහස් නිර්මාණය කරන හා නව තාක්ෂණයට පහසුවෙන් අනුගත වන ශ්‍රම හමුදාවක් දිගු කාලයේ දී අවශ්‍යය.

වෙනස් වන ඉල්ලුමට මුහුණ දීමට රටේ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා වෙළඳ පොළ වෙනස්වන අවශ්‍යතාවයන්ට නිසි අවධානය යොමු කරන ගු- ණාත්මක භාවයෙන් උසස් තෘතීය මට්ටමේ අධ්‍යාපනයට පිවිසීම වැඩි දියුණු කිරීමත් නව නිපුණතා ඉගෙන ගැනමට හැකි ශ්‍රමිකයන් පුහුණු කිරීමත් අවශ්‍යය. මෙය රටේ අනාගතයට තීරණාත්මකව පවතින අතර ඒ සඳහා තෘතීයික අධ්‍යාපන අංශය ව්‍යාප්ත කිරීම හා වැඩි දියුණු කිරීම පමණක් ප්‍රමාණවත් නැත. උසස් විද්‍යා සහ තාක්ෂණයට අදාල විෂයන් හි තවදුරටත් පුහුණු කිරීම් සහ ගැටලු විසඳීමේ සහ නිර්මාණාත්මක භාවය සඳහා පදනම් ප්‍රාථමික මට්ටමේ දී දැමිය යුතුය.

ඊට අමතරව සෞඛ්‍යය අධ්‍යාපනයේ සාර්ථකත්වය තහවුරු කිරීම හා ශ්‍රමයේ වැඩි ඵලදායිතාවයක් ඇති කරවීමෙන් එය මානව සම්පත් සංවර්ධනයේ තීරණාත්මක සාධකයක් වේ. එමනිසා ජන සංඛ්‍යාවේ සෞඛ්‍යය නගා සිටුවීම පවතින මානව සම්පත් හොඳින්ම යොදා ගැනීමේ තීරණාත්මක සාධකයකි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රටේ සංවර්ධන ප්‍රතිඵලය තක්සේරු කිරීම සඳහා මානව සංවර්ධනයේ ජයග්‍රහණ සහ ව්‍යාප්තිය පිළිබඳව අධ්‍යයන ගණනාවක් කර ඇත.

## පර්යේෂණ අධ්‍යයනයන්:

**"Sri Lanka Skills Development Study: Cost and Financing,"** funded by the World Bank.
(කණ්ඩායම: සමන්ති බණ්ඩාර සහ නිෂා අරුණතිලක)

*නිපුණතා සංවර්ධනය, සංවර්ධනය වූ රටවල මෙන්ම සංවර්ධනය වන රට වලද ජාතික සංවර්ධන උපාය මාර්ගයේ ඉතා වැදගත් අංගයකි. ගෝලීය ආර්ථිකයේ සහභාගිත්වය සඳහා නිපුණ හා පහසුවෙන් පුහුණු කළ හැකි ශ්‍රම බලකායක් තීරණාත්මක වේ. අධ්‍යාපනය, නිපුණතා සංවර්ධනය හා ශ්‍රම වෙළඳ පොළට අදාල ප්‍රතිපත්ති බොහෝ රටවල ආර්ථික ප්‍රතිපත්තියේ වැදගත් ලක්ෂණ ලෙස සැලකේ. ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයට පිවිසීම වැඩි දියුණු කිරීමේ කැපී පෙනෙන ජයග්‍රහණ අත් කර ගත් නමුත් ජන සංඛ්‍යාවේ අඩු නිපුනතා මට්ටම රටේ වර්ධනයට හා තරගකාරිත්වයට බාධාවකි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ නිපුණතා ඉල්ලුම සහ සැපයුම පිළිබඳ තීරණාත්මක ප්‍රතිපත්ති ගැටලු ගැන අධ්‍යාපන බලධාරීන් දැනුවත් කිරීම සහ තරගකාරී මධ්‍යම මට්ටමේ ආදායම් ලබන රටක් බවට පත් කිරීමේ රජයේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට රජයේ නිපුණතා සංවර්ධන උපාය මාර්ගයේ ප්‍රතිපත්ති දිශානතීන් හා විකල්ප පිළිබඳ දැනුවත් සංවාදයක් ශ්‍රී ලංකා රජය සහ මූලික පාර්ශ්වකරුවන් අතර ගොඩ නැගීමය.*

**"Socio-Economic Determinants of Child and Maternal Malnutrition in the Estate Sector of Sri Lanka"**, funded by IPS Core Research.
(කණ්ඩායම: ප්‍රියංකා ජයවර්ධන)

*2015 සහශ්‍රක සංවර්ධන ඉලක්ක අත් කර ගැනීමේ සමස්ත සෞඛ්‍ය දර්ශක නිසි ලෙස පවතින නමුත් මන්දපෝෂණය ශ්‍රී ලංකාවේ බරපතළ සෞඛ්‍ය ගැටලුවක්ව පවතී. වතු අංශයේ ළමා සහ මාතෘ මන්ද පෝෂණය රටේ සාමාන්‍යය හා සසඳන විට දෙගුණයකි. එමනිසා මෙම අධ්‍යයනයේ උත්සාහය වන්නේ වතු අංශයේ මන්දපෝෂණ විෂම චක්‍රය ඉවත් කිරීමට යොමු විය යුතු ප්‍රමුඛතා ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රතිපත්ති වලට දායකවීමය.*

*මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ ජනවිද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය දත්ත පිළිබඳ මූලික මූලාශ්‍රය ලෙස යොදා ගෙන ඇත. මෙම පර්යේෂණය වතු අංශයේ ළමා සහ මාතෘ මන්දපෝෂණයේ තීරණාත්මක කරුණු හඳුනා ගැනීමට සම්භාවික විශ්ලේෂණය යොදා ගත්තේය. සොයා ගැනීම් අනුව වතු අංශයේ ළමා සහ මාතෘ මන්දපෝෂණයේ ප්‍රධාන ලක්ෂණ වලට හේතු වන්නේ මන්දපෝෂණයේ ජීවන චක්‍රයේ සිට අහාර අනාරක්ෂිත භාවය, මත් පැනට ඇබ්බැහිවීම, දරිද්‍ර සමාජ ආර්ථික තත්වයන් හා ස්ත්‍රීන්ට අධ්‍යාපනය හා දැනුම නොමැතිවීම දක්වා අන්තර් සම්බන්ධිත සාධක ගණනාවකි. වතු අංශයේ ළමා සහ මාතෘ මන්දපෝෂණයට කැපී පෙනෙන හේතුවක් වන්නේ 'වැරදි' ආහාර - ප්‍රෝටීන් නොමැති ආහාර පරිභෝජනය බව පැහැදිලිය. වැඩි දුරටත් වතු අංශයේ මත් පැනට ඇබ්බැහිවීම ස්ත්‍රී මන්දපොෂණය වැඩිවීම කැපී පෙනෙන ආකාරයෙන් වැඩි කෙරිණ. පවුල් වල දරිද්‍ර සමාජ ආර්ථික තත්වයන් හා බැඳුණු මෙම සාධක වතු අංශයේ මන්දපෝෂණ විෂම චක්‍රය පවත්වා ගැනීමට හේතු වේ.*

"ශ්‍රී ලංකා මානව සංවර්ධන වාර්තාව" funded by UNDP.
(කණ්ඩායම: නිෂා අරුණතිලක, විමල් නානායක්කාර, අනුෂ්ක විජේසිංහ, ප්‍රියංකා ජයවර්ධන, සුනිමලි මදුරාවල සහ අයෝධ්‍යා ගලප්පත්තිගේ)




*ප්‍රචණ්ඩ ගැටුම් අවසන් වුවද ගැටුම් වලට මුහුණ දුන් සමාජයන් හි අවදානම් සහගත තත්වයක් පවතී. මෙවැනි තත්වයක් යටතේ පශ්චාත් ගැටුම් පරිසරයක සැලසුම් කරන ප්‍රතිපත්ති, සහන, යළි ඉදිකිරීම් හා යළි අන්තර්ග්‍රහණයට පමණක් නොව ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම සඳහා එහි මූලයන් විසඳීම කෙරේ ද යොමු විය යුතුය. 2009 මැයි මාසයේ දී ප්‍රචණ්ඩ ගැටුම් අවසන් වීමෙන් පසු සංවර්ධනය කඩිනම් කරනු ඇතැයි රට අපේක්ෂා කරයි. ඕනෑම නව සංවර්ධන උපාය මාර්ගයක් ප්‍රමුඛතා පිහිටුවා , අවස්ථා හඳුනා ගෙන, අභියෝග වලට මුහුණ දීමට මාර්ග සොයා චිරස්ථායි බව තහවුරු කළ යුතුය. විශේෂයෙන්ම මානව සංවර්ධනය ඉලක්කය වන්නේ නම් මෙය කෙටි කාලීන වැඩක් නොවේ. ස්වභාවයෙන්ම ඒ සඳහා අදාල සියලු පාර්ශ්වයන්ගේ දීර්ඝ කාලීන කැපවීමක් අවශ්‍යවේ.*

*ඉහත සඳහන් පසුබිම යටතේ දැනුවත් ප්‍රතිපත්ති සංවාදයක් සඳහා මානව සංවර්ධනයේ ඇති හිඩැස් තක්සේරු කිරීම සඳහා අධ්‍යයන ගණනාවක්ම ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ආරම්භ කර ඇත. මේ සම්බන්ධයෙන් අප ආයතනය ආරම්භ කර ඇති එක් ප්‍රධාන ක්‍රියාකාරකමක් වන්නේ ශ්‍රී ලංකාවේ දෙවන මානව සංවර්ධන වාර්තාව (NHDR) සකස් කිරීම ය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනෙන් (**UNDP**) අරමුදල් ලැබුණු මෙම ව්‍යාපෘතිය අප ආයතනයට ලැබුණේ ඉදිරිපත් කරන ලද තරගකාරී යෝජනා සැලකිල්ලට ගැනීමෙනි. දෙවන ජාතික මානව සංවර්ධන වාර්තාවේ ප්‍රධාන අරමුණක් වූයේ විවිධ ජන කණ්ඩායම් අතර පවතින අසමානතා වල මූලික ලක්ෂණ වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමෙන් පශ්චාත් ගැටුම් තත්වය යටතේ ප්‍රචණ්ඩ ක්‍රියා නැවත ඇතිවීම සමනය කෙරෙන ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ වැදගත් පළමු පියවර වශයෙනි.*

**"Sri Lanka Green Job Mapping Study"** funded by ILO/GHK Consulting Ltd – UK.

(කණ්ඩායම: කාංචනා වික්‍රමසිංහ සහ නෙත්මිණි පෙරේරා)

*මෙම අධ්‍යයනය යොමු වන්නේ ශ්‍රී ලංකාවේ විවිධ ආර්ථික අංශ වල පරිසර හිතකාමී රැකියා (Green Jobs) සිතියම් ගත කිරීම පිළිබඳවය. ඒ අනුව අධ්‍යයනයට ඇතුළත් වන්නේ වඩාත් පාරිසරිකව චිරස්ථායී ක්‍රියාකාරකම් සහ පාරිසරිකව චිරස්ථායී උප අංශ හඳුනාගැනීම, එක් එක් අංශ සඳහා චිරස්ථායී උප අංශ හඳුනාගැනීම සඳහා තෝරා ගැනීමේ නිර්ණායකයන් හඳුනා ගැනීම සහ හඳුනාගත් අංශ වල රැකියා අවස්ථා ගණනය කිරීම ය. අධ්‍යයනය සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගත්තේ තොරතුරු ලබා දුන් මූලික පුද්ගලයන් සමග සම්මුඛ සාකච්ඡා කිරීමෙන් හා ද්විතීය මූලාශ්‍ර වලිනි. මෙම අධ්‍යයනයෙන් ආවරණය වූ මූලික ආර්ථික අංශ වන්නේ ඉදි කිරීම්, බලශක්ති, ධීවර, වන සම්පත්, නිෂ්පාදන, සංචාරක, ප්‍රවාහන සහ අපද්‍රව්‍ය කළමනාකරණය යි.*

**"Development of Action Plan for Households with Undernourished Children and Pregnant Women in Districts of Monaragala and Nuwara Eliya"**, (Part 2) funded by UNICEF.

(කණ්ඩායම: විමල් නානායක්කාර, සුනිමලි මදුරාවල සහ සමන්ති බණ්ඩාර)

*ශ්‍රී ලංකාවේ ළමයින්ගේ පෝෂණ තත්වය ළමයින්ගේ ජීවත්වීම හා රටේ ඒක පුද්ගල දීදේනී සමග ගැලපෙන්නේ නැති පෝෂණයේ බහු – අංශීය ස්වභාවය තේරුම් ගත් රජය මෑතක දී ජාතික පෝෂණ මණ්ඩලයක් පිහිටුවීයී එම මණ්ඩලයට ප්‍රතිපත්ති විකල්ප සහ වැඩ සටහන් යෝජනා කිරීම සඳහා මෙතෙක් ක්‍රියාත්මක වූ දේ ගැන සාක්ෂි සහ පවතින සේවා වඩාත්ම අවශ්‍ය කරන අයට ලබා ගැනීමට ඇති අවස්ථාවල අසමානතාවය ඇතුළත් හිඩැස් හඳුනා ගැනීම අවශ්‍ය යී ඌණ පෝෂණය අඩු කිරීමට හා යුක්තිය වැඩි දියුණු කිරීමට බහු – අංශීය පිවිසුමක අකෘතියක් සඳහා නියමු පදනමක් යටතේ නුවර එළිය සහ මොනරාගල දිස්ත්‍රික්ක වල විශේෂ අධ්‍යයනයක් පවත් වන ලදී මෙම අධ්‍යයනයේ පරමාර්ථය වූයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ලබා දෙන සේවාවල ඵලදායිතාවය කෙසේදෘ ස්ත්‍රීන්ගේ සහ ළමයින්ගේ පෝෂණ තත්වයට අදාල ගැටලු අවම කිරීම සඳහා එම සේවා ලබා දෙන අයගෙන්ම යෝජනා ලබා ගැනීමට හා සේවා ලබා දීමේ දී පවතින හිඩැස් හා දුෂ්කරතා විශ්ලේෂණය කිරීම යී*

## ප්‍රකාශන:


Arunatilake, A. et al. (2012) *Sri Lanka Human Development Report 2012*, UNDP, Colombo.

Arunatilake, N., Jayawardena, P., Wijesinha, A., and Perera, N. (2012), *Will a Tax on Public Servants Improve Progressivity?* PEPnet Working Paper.

Arunatilake, N. (2012), "Equity in Access for Education and Health" in *Economic Review*, Research Department People's Bank, Vol. 37, No. 11 & 12, pp 20-24.

Dayaratne, G.D. (2012), *National Health Accounts 2005 - 2009*, IPS, Colombo.

Dayaratne, G.D. (2012), "Census of Private, Co-operative and Estate Hospitals 2012", Series No.1, Issue No.5, IPS, Colombo.

Kelegama, S. and Gunawardena, D. (eds.), (2012), *Economic and Social Development under a Market Economy Regime in Sri Lanka, Buddhadasa Hewavitharana Felicitation Volume 2* , Vijitha Yapa Publication, Colombo.

Wijesinha, A. (2012), "What Is an Appropriate Path for Sri Lanka as an Emerging Economy," in *E. F. Schumacher Centenary Birth Celebrations Volume*, Practical Action, Colombo.

# පශ්චාත් ගැටුම් සමයේ වර්ධනය

2009 මැයි මාසයේ දී බෙදුම්වාදී සන්නද්ධ ගැටම අවසන් වීමෙන් වසර හතරකට පසු ශ්‍රී ලංකාව දීර්ඝ කාලීන ස්ථාවරත්වයට හා චිරස්ථායී සමාජ ආර්ථික සංවර්ධනයක් සඳහා වඩාත් ආසන්න වෙමින් පවතී. සාමයේ ආර්ථික ප්‍රතිලාභ, මානව සහ සමාජ ප්‍රාග්ධනය හා එහි යටිතල පහසුකම් විනාශවීමේ සිට එහි ආර්ථිකය ගැන නව විශ්වාසයක් ඇතිවීම දක්වා විවිධාකාර වේ. වෙළඳ පොළ විවෘතවීමෙන් සහ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රතිඅන්තර්ග්‍රහණයෙන් ද දායක විය. පශ්චාත් ගැටුම් සමයේ උතුරු හා නැගෙනහිර පළාත් වල පුනරුත්ථාපන හා යළි ඉදිකිරීමේ කටයුතු ඇරඹීම නිසා එම ප්‍රදේශ වල වෙළඳාමත් ගැටුම් වලින් පීඩාවට පත් ජනතාවට සේවා නියුක්තිය හා ජීවන මාර්ග ඵලදායිකව තහවුරු කිරීමටත් අවස්ථාව සැලසේ.

ශ්‍රී ලංකාවේ පශ්චාත් ගැටුම් සමයේ සංවර්ධනය සැලසුම් කිරීමේ දී මූලික ගැටලුව වන්නේ සමාජ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට හා දීර්ඝ කාලීන ස්ථාවරත්වය පවත්වා ගැනීමට වඩාත් හොඳින් ඉවහල් වන්නේ කවර ආකාරයේ ආර්ථික ප්‍රතිපත්ති ද යන්න තීරණය කිරීමය. කණ්ඩායම් අතර සාධාරණත්වය පිළිබඳ ගැටලු ගැන සංවේදී වන ආර්ථික ප්‍රතිපත්ති දේශපාලන ස්ථාවරත්වය සඳහා කැපී පෙනෙන බලපෑමක් විය හැකිය.



ඡායාරූපය: ඔක්තෝබර් 7 වැනි දින ''ශ්‍රී ලංකාවට වර්ධනයේ අධිවේගී මාර්ගයේ රැඳී සිටිය හැක්කේ කෙසේද?'' තේමාව යටතේ පැවති ජාතික වාර්ෂික සමුළුව. එම අවස්ථාවේ ප්‍රධාන අමුත්තා වූයේ විද්‍යා කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය තිස්ස විතාරණ මහතාය.

## පර්යේෂණ අධ්‍යයන:

**Sri Lanka: State of the Economy 2012**




*ආර්ථික වර්ධනය පමණක් රාජ්‍යයන්ගේ සුජාත භාවය ලබා ගැනීමේ ප්‍රයත්නයන් මනින කෝදුවක් නොවන නමුත් වර්ධනය වැදගත්ය. වසර ගණනාවක් වේගවත් වර්ධනයක් පවත්වා ගැනීමෙන් ශ්‍රී ලංකාව වැනි රටවලට පහළ ආදායම් මට්ටමේ සිට ඉහළ ආදායම් මට්ටමට පත්විය හැකිය. රටේ යටිතල පහසුකම් වැඩ සටහන් කැපී පෙනෙන ලෙස ශක්තිමත්වීම මෑත වසර වල වේගවත් වර්ධනය සනිටුහන් කරයි. කෙසේ වුවත් මෙම ප්‍රවේගය දීර්ඝ කාලීනව පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවේ සමස්ත සාධක ඵලදායිතා වර්ධනය (Total factor productivity growth) එනම් ශ්‍රමිකයන් සහ ප්‍රාග්ධනය යොදා ගන්නා කාර්යක්ෂමතාවය නගා සිටුවීම අවශ්‍යය. වැඩ කරන වයසේ ජන සංඛ්‍යාවේ අඩුවීමත් සමග දීර්ඝ කාලීන වර්ධනය තීරණාත්මකව රඳා පවතින්නේ වෙනත් සාධක අතර තාක්ෂණ නව්‍යතාවය හා නිපුණ, ඵලදායී සහ නම්‍යශීලී ශ්‍රම හමුදාවක් පැවතීම මතය. පශ්චාත් ගැටුම් සමයේ පරිවර්තනයේ දී ශ්‍රී ලංකාවට ශක්තිමත් හා දේශපාලන වශයෙන් සහජීවන වර්ධන ක්‍රියාවලියක් අවශ්‍ය කෙරෙන සුජාත වූ ආර්ථික, දේශපාලන හා සමාජ අපේක්ෂා ඉස්මතු කරයි. රටේ දීර්ඝ කාලීන වර්ධන ගතිකත්වය තීරණය කරන්නේ ප්‍රතිපත්ති, රජයේ භූමිකාව සහ නියාමන ආයතනයි. මෙවැනි සන්දර්භයක දී 'ශ්‍රී ලංකාව: 2012 ආර්ථිකයේ තත්වය' වාර්තාව ඉදිරි වසර වලදී ශ්‍රී ලංකාවේ චිරස්ථායී යුක්ති සහගත වර්ධනයක් පවත්වා ගැනීමේ මාර්ගයේ ඇති බොහෝ අවස්ථා සහ අභියෝග පරීක්ෂා කරයි.*

**"Global Competitiveness Report 2012/2013,"** funded by the World Economic Forum (WEF), and the Information and Communications Technology Agency (ICTA).
(කණ්ඩායම: අනුෂ්ක විජේසිංහ, අයෝධ්‍යා ගලප්පත්තිගේ සහ ඩිලානි හිරිමුතුගොඩගේ)

*ගෝලීය තරගකාරිත්ව වාර්තා (GCR) මාලාව දශක තුනකට අධික කාලයක් තිස්සේ ලොව බෙහෙවින්ම සම්මානයට පත් ජාතික තරගකාරිත්ව තක්සේරුවක් ලබා දේ. ගෝලීය තරගකාරිත්ව වාර්තාව 2005 වසරේ හඳුන්වා දුන් ගෝලීයතරගකාරිත්ව දර්ශකයේ තරා (Rankings) ඉදිරිපත් කරයි. තරගකාරිත්වයේ කුළුණු 12 ක් මත පදනම් වූ මෙම වාර්තාව ආර්ථික සංවර්ධනයේ විවිධ අවස්ථා වල පසුවන ලෝකයේ රටවල් 144 ක තරගකාරී භූ දර්ශනයේ සවිස්තරාත්මක චිත්‍රයක් දක්වයි. මෙම තරා ජාතීන්ගේ ඵලදායිතා විභවයන් පෙන්නුම් කරන අතර විදේශීය හා දේශීය ආයෝජන තීරණ ගැනීමේ දී පුළුල්ව යොදා ගනී.*

*වසර 2000 දී පළමු වරට මෙම වාර්තාවට ඇතුළත් කර ගත් ශ්‍රී ලංකාව 2012 වසරේ දී නොකඩවා දහතුන් වැනි වරටත් ඊට ඇතුළත් විය. මෙම අධ්‍යයනය පැවැත්වෙන්නේ තොරතුරු ලබා දීමට හැකි හා ප්‍රකාශයට පත් කරන ලද වෙනත් මූලාශ්‍ර වලින් ලබා ගත නොහැකි රටට වැදගත් වන තරගකාරී ගැටලු මතු කෙරෙන ව්‍යාපාරික නායකයන් අතර කෙරෙන විධායක මත සමීක්ෂණයක ආකාරයෙනි. ශ්‍රී ලංකාවේ සමීක්ෂණය පවත්වන ලද්දේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය විසිනි.*

**"Environmental Management Practices in the Hotel Sector in Sri Lanka"**, funded by SANDEE.
(කණ්ඩායම: කාංචනා වික්‍රමසිංහ)

*මෙම අධ්‍යයනයෙන් අදහස් කරනුයේ හෝටල් අංශයේ බලශක්ති, ජලය හා අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුළත් පාරිසරික කළමණාකරණ භාවිතාවන් තක්සේරු කිරීමය. මෙම අධ්‍යයනයෙන් ඊට අමතරව විවිධ හෝටල් කාණ්ඩ වලට අයත් ශ්‍රී ලංකාව පුරාම ඇති සංචාරක හෝටල්වල ජලය, බලශක්ති හා අපද්‍රව්‍ය කළමනාකරණය යොදා ගැනීම තීරණය කෙරෙන සාධක හඳුණා ගැනීම ද අදහස් කෙරේ. මෙම අධ්‍යයනයට පදනම් වූයේ ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ ලියා පදිංචි හෝටල් පමණි. අධ්‍යයනය සඳහා දත්ත සහ තොරතුරු රැස්කිරීම සඳහා හෝටල් සමීක්ෂණයක්, සිද්ධි අධ්‍යයනය, මූලික තොරතුරු ලබා දුන් අය සමග සම්මුඛ සාකච්ඡා කිරීම හා ද්විතීයික තොරතුරු මූලාශ්‍ර යොදා ගන්නා ලදී.*

**"Tax Reforms in Sri Lanka – Will a Tax on Public Servants Improve Progressivity?"** funded by Poverty and Economic Policy Research Network (PEP).
(කණ්ඩායම: තිෂා අරුණතිලක, අනුෂ්ක විජේසිංහ, ප්‍රියංකා ජයවර්ධන, නෙත්මිණි පෙරේරා)

*රජයේ ආදායම් වැඩි කිරීමෙන් අයවැය පරතරය අඩු කිරීමේ අභියෝගයට මුහුණ දී සිටින ශ්‍රී ලංකා රජය පසුගිය දශක තුනක් තිස්සේම රාජ්‍ය සේවකයන් උපයන වැටුප් ආදායම් බදු වලින් නිදහස් කර තිබිණ. මෙවැනි සන්දර්භයක දී 2011 දී හඳුන්වා දුන් බදු ප්‍රතිශෝධන අනුව බදු ආදායම් වැඩ කිරීමේ අදහසින් සහ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන් අතර බදු සාධාරණත්වය නැවත හඳුන්වා දීම සඳහා රාජ්‍ය අංශයේ සේවකයන්ටත් ආදායම් බදු පැනවිණ. මෙම අධ්‍යයනය 2007 සහ 2011 බදු පද්ධතිය ඇගයීම සඳහා 2006/07 ඍෂ්‍ෂි දත්ත යොදා ගත් අතර රාජ්‍ය අංශයේ සේවකයන් මත බදු පැනවීමෙන් බදු ආදයමට හා බදු පදනමට බලපාන්නේ කෙසේද යන්න සහ යෝජිත ප්‍රතිශෝධන බදු සහ ආදායම පුනර්ව්‍යාප්තිය වන්නේ කෙසේද යන්න පරීක්ෂා කරයි.*

**"Business-Led Growth and Development Matrix"** for UNDP, Sri Lanka.
(කණ්ඩායම: අනුෂ්ක විජේසිංහ)

*මෙම ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික වාතාවරණයේ සීමාවන් පිළිබඳව ලබා ගත හැකි ද්විතීය තොරතුරු පදනම් කරගෙන ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සංවර්ධනයේ දී මුහුණ දීමට ඇති මූලික අවහිරතා ගැන පශ්චාත් විශ්ලේෂණයක් (Meta-analysi) කරයි. කෙටි කාලීන හා දිගු කාලීන වශයෙන් ප්‍රතිශෝධනය කළ හැකි ක්ෂේත්‍ර හඳුනා ගන්නා ලදී. අවසාන ලේඛනය ලංකා වානිජ මණ්ඩලය හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පෞද්ගලික අංශය භාර කොට්ඨාශය ඇතුළත් පෞද්ගලික අංශයේ සංවර්ධනය පිළිබඳ ක්ෂේත්‍ර වල අදාල අයට ඔවුන්ගේම සාකච්ඡාව සඳහාත් අවශ්‍ය කෙරෙන පසුවිපරම් කටයුතු සඳහාත් ලබා දෙන ලදී.*

**"Baseline Survey of North and East Local Services Improvement Project (NELSIP): Local Authority Survey,"** Ministry of Economic Development, funded by the World Bank.
(කණ්ඩායම: විමල් නානායක්කාර, අයෝධ්‍යා ගලප්පත්තිගේ සහ රොෂිනි ජයවීර)

*දූන් පුර නැගුම නමින් හැඳින්වෙන උතුරු- නැගෙනහිර පළාත් සේවා වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (NELSIP) උතුරු හා නැගෙනහිර පළාත් වල පළාත් පාලන ආයතන වලට සහායට ආර්ථික කටයුතු සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලෝක බැංකුවේ ආධාර ලබන ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ මූලික සංවර්ධන පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් පාලන ආයතන මගින් සපයන යටිතල පහසුකම් සේවාවන් වගවීමෙන් හා ප්‍රතිචාරාත්මක ආකාරයෙන් වැඩි දියුණු කිරීමය. අප ආයතනය ආර්ථික කටයුතු සංවර්ධන අමාත්‍යාංශය සමග එක්වී උතුරු නැගෙනහිර ප්‍රදේශ වල පළාත් පාලන ආයතනයන් හි දූනට පවතින තත්වය තක්සේරු කිරීම සඳහා එම පළාත් දෙකේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන ආකාරයට පළාත් පාලන ආයතන 79 ක පාදරේඛා (Baseline) සමීක්ෂණයක් සිදු කෙළේය.*

*ජන විද්‍යාත්මක, පළාත් පාලන ආයතනවල මූල්‍ය කළමනාකරණය සහ ඒවා යටතට ගැනෙන ක්‍රියාකාරකම් වැනි ක්ෂේත්‍රයන්හි වැදගත් දත්ත රැස්කොට, විශ්ලේෂණය කිරීමෙන් පසු ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට හා ලෝක බැංකුවට ලබා දෙන ලදී.*

**"Research and Advocacy for Improved Sub-regional Business Climates"**, funded by the Asia Foundation (TAF).
(කණ්ඩායම: අනුෂ්ක විජේසිංහ)

*කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය (SME) කලාපීය ආර්ථික සංවර්ධනයේ කොඳු ඇට නාරටිය වන අතර ඒවා මුහුණ දෙන ව්‍යාපාරික වාතාවරණය පිළිබඳ ගැටලු ජාතික මට්ටමේ දක්නට ලැබෙන ඒවාට වඩා සුවිශේෂීය. ආසියා පදනම අරමුදල් සපයන මෙම ව්‍යාපෘතියේ වත්මන් අදියර යටතේ අප ආයතනය ශ්‍රී ලංකාවේ ජාතික වානිජ මණ්ඩලය සමග එක්ව රටපුරාම ඇති කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය පිළිබඳව සමීක්ෂණයක් පැවැත් වීය. එම සොයා ගැනීම් සමීක්ෂණ වාර්තාවක් ලෙස සකස් කොට මූල්‍ය, තාක්ෂණය හා ව්‍යාපාර සංවර්ධනය ලබා ගැනීම වැනි කුඩා සහ මධ්‍යම ව්‍යවසාය අභියෝග විසඳීම සඳහා වූ ආසියානු මුලපිරුම් පිළිබඳ විවරණයක් සමග ප්‍රකාශයට පත් කෙරිණ.*

## ප්‍රකාශන:


Arunatilake, N., P. Jayawardena, A. Wijesinha, (2012), *Assessing the Impact of the 2011 Tax Reforms on Tax Revenues and Income Distribution in Sri Lanka*, PEP Policy Brief 101.

Arunatilake, N,, P. Jayawardena, A. Wijesinha, (2012), *Tax Reforms In Sri Lanka – Will a Tax on Public Servants Improve Progressivity?*, PEP Working Paper 13.

Brahmanage, B. (2012), Book Review of "Business and Polity: Dynamics of a Changing Relationship," in *South Asia Economic Journal*, 13 (2),

Ekanayake, R. (2012), "Non-tariff Barriers Facing South Asia: The Case of Sri Lanka", *Trade Insight*, Vol.8, No.3, 2012, SAWTEE, Kathmandu.

Kelegama, S. (2012), "Socio-Economic Challenges of Post-Conflict Reconstruction in Sri Lanka" in V.R. Raghavam (ed.), *Post Conflict Sri Lanka: Rebuilding of Society*, Vij Book India Pvt. Ltd.

Weerakoon, D. (2012), "Sri Lanka's Economic Reform Process: Progress and Constraints," in Dee, P. (ed.), *Economic Reform Process in South Asia: Toward Policy Efficiency*, Routledge, Oxford.

Wickremasinghe, K. (2012), "Ecotourism as a Tool for Sustainable Forest Management in Sri Lanka", *Journal of Environment Professionals Sri Lanka*, Vol. 1 : No. 2, pp. 16 – 25.

Wijesinha, A. (2012), "Budget 2012: Incentives for Industry and Small and Medium Enterprises (SMEs)," *Economic Review*, People's Bank, Colombo.

# බාහිර තරගකාරිත්වය

ශ්‍රී ලංකාව වැනි කුඩා විවෘත ආර්ථිකයකට ගෝලීය වාණිජ සම්බන්ධතා හැර වෙනත් මගක් නැත යන්න සාධකයක් වන බැවින් ප්‍රශ්නය වන්නේ ගෝලීය ආර්ථිකය හා බැඳෙන්නේ ද යන්න නොව ප්‍රායෝගික ආකාරයෙන් එසේ කරන්නේ කෙසේද යන්නයි. වරණාත්මක වෙළඳ ගිවිසුම් වල සහභාගිවීම හා රට ඇතුළත වෙළඳ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම ඇතුළත් ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ තරගකාරිත්වය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් ඇති ගැටලු ගණනාවක් සැලකිල්ලට ගත යුතුය.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙම වසරේ දී වෙළඳාම පහසුකරණය හා විශේෂයෙන්ම අපනයන අංශයේ කර්මාන්ත සහ වෙළඳාමට විවෘත වන අවස්ථා ගැන අධ්‍යයන ගණනාවකට සම්බන්ධ විය.

## පර්යේෂණ අධ්‍යයන

**"The Impact of EPZs on Poverty Reduction and Trade Facilitation in Sri Lanka,"** funded by the United Nations Economic and Social Commission for Asia and the Pacific (UNESCAP).

(කණ්ඩායම: චන්දන කරුණාරත්න සහ අශානි අබයසේකර)

*මෙම අධ්‍යයනයෙන් තෝරා ගත් අපනයන සැකසුම් කලාප වල අත්දැකීම් විශ්ලේෂණයෙන් හා රේගු ක්‍රියාපටිපාටි සරල කිරීම, පරිපාලනය නවීකරණය හා මෙම කලාප ආසන්නයේම ඇති ප්‍රදේශ වල සමාජ ආර්ථික සුභ සාධනය වැනි ක්‍රියාවලීන්ගේ බලපෑම පිළිබඳ විශ්ලේෂණයකින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩු කිරීම සහ වෙළඳාම පහසුකිරීමේ පියවර කෙරේ අපනයන සැකසුම් කලාප වල කාර්යක්ෂමතාවයේ ඇගයීමක් කරයි. වඩාත් කාර්යක්ෂම ක්‍රියාපටිපාටි හරහා වඩාත් හොඳ පාලනයක් සැලසීමෙන් හා රේගුවට අදාල ක්‍රියාපටිපාටි වලට නිලධාරි තන්ත්‍රයේ මැදිහත්වීම අවම කිරීමෙන් අපනයන සැකසුම් කලාප වෙළඳාම පහසුකරන්නේ කෙසේද යන්න පිළිබඳ විශ්ලේෂණ සීමිතය. වැඩි දුරටත්, දරිද්‍රතාවය අඩු කිරීම පිළිබඳව අපනයන සැකසුම් කලාප වල බලපෑම ශ්‍රී ලංකාවේ ප්‍රමාණවත්ව ගවේෂණය කර නැත. එමනිසා මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ඉහත සඳහන් ගැටලු විමසා බැලීමයි. දරිද්‍රතාවය අඩු කිරීම සම්බන්ධයෙන් අපනයන සැකසුම් කලාප වලින් පැහැදිලි ආර්ථික ප්‍රතිලාභ ලැබෙන නමුත් මෙම කලාප වල සමහර අහිතකර බලපෑම් ද පවතින බව මෙම අධ්‍යයනයෙන් හෙළිවේ. අපනයන සැකසුම් කලාප සේවා නියුක්තිය සම්බන්ධයෙන් වැදගත් වන අතර එම කලාප ආසන්නයෙන් මෙන්ම වඩාත් ඈත ග්‍රාමීය ප්‍රදේශ වලින් ද සේවකයන් ආකර්ෂණය කරයි. වැඩි දුරටත් මෙම කලාප බොහොමයක සේවයේ යෙදෙන බහුතරයක් ස්ත්‍රීන් වන නිසා ඒවා ස්ත්‍රීන් සඳහා රැකියා අවස්ථා ලබා දීමේ දී ඉතා වැදගත්ය. අපනයන කලාප, වෙළඳාම පහසුකරණය සම්බන්ධයෙන් ද වැදගත් වාසි සලසයි. රේගු ක්‍රියා පටිපාටි සරල කිරීම, ආනයන හා අපනයන සැකසීම සඳහා අවශ්‍ය කරන පියවර සහ ලේඛන සංඛ්‍යාව අඩු කිරීමෙන් හා එමගින් භාණ්ඩ සැකසීම සඳහා ගත වන කාල ප්‍රමාණය අඩු කිරීමෙන් අපනයන සැකසුම් කලාප වෙළඳාම පහසුකරණයට කැපී පෙනෙන බලපෑමක් සිදු කර ඇත. මෙය විශේෂයෙන්ම මුහුදු මාර්ගයෙන් භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් පැහැදිලිය.*

**"Strengthening the Textile and Clothing Industry in Sri Lanka,"** funded by the Asian Development Bank.

(කණ්ඩායම: චන්දන කරුණාරත්න සහ අශානි අබයසේකර)

*මෙම අධ්‍යයනයෙන් 2005 දී බහු - කෙඳි වැඩ පිළිවෙළ (Multi-Fibre Arrangement) යටතේ තිබූ කෝටා ප්‍රමාණය ඉවත් කිරීමෙන් පසු ශ්‍රී ලංකාව ගෝලීය සහ කලාපීය රෙදි සහ ඇඟළුම් වෙළඳ පොළ තරගකාරිත්වය වැඩි දියුණු කර ගෙන ඇත්ද යන්න තක්සේරු කරයි. මෙම අධ්‍යයනය දකුණු ආසියාවේ රටවල් හතරක කරන ලද එවැනි අධ්‍යයන වල පිළිඹිබුවකි. අප ආයතනයෙන් කරන ලද අධ්‍යයනයෙන් කර්මාන්තයේ සමාගම් ගෝලීය වටිනාකම් පුරුක් වල ඉහළට යෑමට ගොඩ නගා ගත් උපාය මාර්ග ඇගයීම හා ඒවාට කලාපය තුළ සැපයුම් සම්බන්ධතා ගොඩ නගා ගැනීමට අවස්ථා පවතින්නේ ද යන්න පරික්ෂා කරයි. කෙසේ වුවත් බටහිර වෙළඳ පොළට පිවිසීමේ සාර්ථකත්වයට වෙනස්ව දකුණු ආසියානු කලාපය තුළ පෙර සම්බන්ධතා සංවර්ධනය කර ගැනීම අවම තත්වයක පවතී. ශ්‍රී ලංකාවේ පසුපස සම්බන්ධතා වල පවතින දුර්වල ස්වභාවය නිසා මෑත වසර වල කලාපය තුළ විශේෂයෙන් ඉන්දියාව සහ පාකිස්ථානය සමග යෙදවුම් ලබා ගැනීම වැඩිවීමේ ප්‍රවනතාවයක් පවතින නමුත් අපනයන වෙනත් තැන් කෙරේ යොමුවීම එසේම පවතී. ශ්‍රී ලංකාවේ ඇඟළුම් අපනයන වලට කලාපීය ඇඟළුම් වෙළඳ පොළට ඇතුලුවීමේ හැකියාව සීමිතය. ඊට සමාන පරිමාණයන්*

*කලාපය තුළ අපනයනය කිරීමේ අවස්ථාවල සීමිත බව, බදු නොවන බාධක, ශ්‍රී ලංකාවේ වටිනාකම් එකතු කළ ඇඟළුම් සඳහා දකුණු ආසියාවේ ඇති ඉල්ලුමේ සීමිත බව මෙන්ම දකුණු ආසියානු ආනයනකරුවන් සමග හොඳින් තහවුරු වූ සම්බන්ධතා නොමැතිවීම ඇතුලු හේතු ගණනාවක් පවතී.*

**"Trade Opportunities in Sri Lanka for Indian Businesses,"** funded by the Government of India.
(කණ්ඩායම: අශානි අබයසේකර)

*විශේෂයෙන්ම 2000 දී දෙරට අතර ඇති කර ගත් නිදහස් වෙළඳ ගිවිසුම (FTA) නිසා ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර වෙළඳම වර්ධනය වුවත් වෙළඳාම වැඩි දුරටත් වර්ධනය කිරීමට හා විවිධාංගකරණයට ඇති විභවයන් සම්පූර්ණ කර නැත. යුද්ධය අවසන්වීම හා ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර යළි නැගී සිටීම නිසා ඉදිරි වසර කීපය තුළ පරිභෝජනයේ ඉහළ යෑමක් හා රජය විදේශීය ආයෝජකයන්ට මෙරට ආයෝජනය කිරීම දිරි ගැන්වීම නිසා ආර්ථිකයේ පිබිදීමක් සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එමනිසා මෙය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සම්බන්ධවීමට ඉන්දියානු ව්‍යාපාරික ප්‍රජාවට පෙර නොවූ විරූ අවස්ථාවකි. මෙවැනි පසුබිමක් තුළ ඉන්දියානු වෙළඳුන් සඳහා ශ්‍රී ලංකාවේ ඇති වෙළඳ අවස්ථා ගැනත් ඉන්දියානු ව්‍යාපාරිකයන්ට ශ්‍රී ලංකාවේ ඇති වෙළඳ අවස්ථා පිළිබඳ අදාල තොරතුරු ලබා දීම ගැනත් මෙම අධ්‍යයනය යොමු වේ.*

*පැට්‍රෝලියම් නිෂ්පාදන, මොටර් කාර් සහ මෝටර් සයිකල්, ඖෂධ හා සිමෙන්ති වැනි ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට කෙරෙන සම්ප්‍රදායික අපනයනයන්ට අමතරව ඉන්දියානු ව්‍යාපාරිකයන් සඳහා අපනයන විභවයක් ඇති කැපී පෙනෙන අවස්ථා අවස්ථා ගණනාවක් හඳුනා ගෙන ඇත. විද්‍යුත් යන්ත්‍ර, අධි තාක්ෂණික කෘෂිකර්මාන්තය, ආහාර සැකසීම, බලශක්ති, සැපයුම් සංවිධාන සහ තොරතුරු තාක්ෂණය (IT) ඊට ඇතුළත් ය.*

**"Strategic Partnership for Policy Development and Action to Foster Regional Cooperation in South Asia,"** funded by the Research and Information System for Developing Countries (RIS).
(කණ්ඩායම: පරාක්‍රම සමරතුංග, අනුෂ්ක විජේසිංහ, සහ ඩිලානි හිරිමුතුගොඩගේ)

*මෙම අධ්‍යයනයේ අවධානය යොමු වන්නේ දකුණු ආසියානු කලාපයට විශේෂ අවධාරණයක් යොමු කරමින් ශ්‍රී ලංකාවේ තේ අංශයේ වටිනාකම් දාමය විශ්ලේෂණය කිරීමය. වඩාත් වැදගත්ව නිෂ්පාදන කාර්යක්ෂමතාවය වැඩි දියුණ කිරීම, නව තාක්ෂණය ලබා ගැනීම හා අවසාන වශයෙන් සිරස් හා තිරස් අන්තර්ග්‍රහණය තුළින් වටිනාකම් එකතු කිරීමේ ක්‍රියාකාරකම් වලදී ඉහළට යෑම අතින් දේශීය සමාගම් වලට කලාපීය වටිනාකම් දාමයේ ඇති බලපෑම් කෙරේ යොමු වේ. වැඩි දුරටත් එය දකුණු ආසියානු රටවලට තේ අපනයනය ප්‍රවර්ධනය කෙරෙන හා ඊට බාධා කෙරෙන දනට පවතින ප්‍රතිපත්ති සහ නියාමන හඳුනා ගැනීමට උත්සාහයක් දරයි.*

**"Promoting Participatory Approaches for Removing Regional Trade Barriers in South Asia (COENCOSA Phase II),"** funded by Consumer Unity and Trust Society (CUTS).
(කණ්ඩායම: අශානි අබයසේකර සහ රවින් ඒකනායක)

*තීරු බදු හැර වෙනත් බාධක රාශියක් පැවතිම නිසා තීරු බදු අඩු කිරීමෙන් අන්තර්කලාපීය වෙළඳම නගා සිටුවීමට දකුණු ආසියානු රටවල් ගන්නා උත්සාහය NTB මගින් යටපත් කිරීමේ තර්ජනයකට මුහුණ දී සිටී. විධිමත් නෛතික හා ආයතනික පද්ධතියක් හරහා වෙළඳාම ලිහිල් කිරීමේ ප්‍රතිපත්තියක් උනන්දුවෙන් අනුගමනය කළ ද පසුගිය දශක දෙකක කාලයක තිස්සේ කලාපීය වෙළඳාම අපේක්ෂිත මට්ටමට ඉහළ නොනැගීම හා එහි සැබෑ විභවයට වඩා බෙහෙවින් පහත් ස්ථානයක පැවතීමෙන් NTB සමග කටයුතු කිරීමේ දී පද්ධතියේ සමහර අඩුපාඩු පැවතීමට දර්ශකයකි. හඹර් ව්‍යාප්තිය හා ප්‍රමාණය හා දකුණු ආසියාවේ NTB ප්‍රතිශෝධන අවශ්‍යතාවය අවබෝධ කර ගැනීමට . Promoting Participatory Approaches for Removing Regional Trade Barriers in South Asia නම් පර්යේෂණ අධ්‍යයනයක් අසියා පදනමේ සහාය ඇතිව ඝඹශී විසින් ආරම්භ කරන ලදී. එම ව්‍යාපෘතියේ ශ්‍රී ලංකාවේ හවුල්කරු වූයේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයයි. අප ආයතනය ශී ලංකාවේ ආනයන කරුවන්ට හා අපනයන කරුවන්ට NTB බලපාන ආකාරය ගැන සිද්ධි අධ්‍යයන මෙන්ම රජයේ නිලධාරීන්, සිවිල් සමාජ නියෝජිතයන් හා කාර්මික මණ්ඩල සමග අදාල පාර්ශ්ව උපදේශන ගණනාවක් පවත්වන ලදී.*

**"Tax Policy and Enterprise Development in South Asia,"** funded by Governance Institutes Network International (GINI).
(කණ්ඩායම: අනුෂ්ක විජේසිංහ සහ රවින් ඒකනායක)

*සියල්ලන් ඇතුළත් කර ගන්නා වර්ධනය දකුණු ආසියානු ආර්ථික වලට අභියෝගයක්ව පවතී. වර්ධනය හා ඇතුළත්වීම අතර නැතිව ගිය පුරුක වන්නේ හොඳින් ගෙවන හා ඵලදායි රැකියා ජනනය කරන ශ්‍රම වෙළඳ පොළ බව විශේෂඥයෝ දන් පිළිගනිති. දකුණු ආසියාවේ කෘෂිකාර්මික නොවන සේවා නියුක්තිය වැඩි වශයෙන්ම ඒක රාශිවී ඇත්තේ අඩු ඵලදාවක් හා අඩු වැටුප් ඇති කුඩා ව්‍යවසායකත්ව තුළය. කුඩා ව්‍යවසාය සංවර්ධනය හා සේවා නියුක්ති ජනනය බදු ප්‍රතිපත්තිය සමග දැඩිව බැඳී ඇති බව පර්යේෂණ ගණනාවකින්ම පෙන්වා දී ඇත. පළමුව බදු නිදහස් හා සහන වැඩි වශයෙන්ම විශාල ව්‍යවසායන්ට හිතකරව පවතී. දෙවැනිව කුඩා ව්‍යවසාය සංවර්ධනයට වටිනාකම් එකතු කිරීමේ බද්ද (VAT) වැනි බදු වලින් පීඩාවට පත් වේ. තුන් වැනිව ප්‍රදේශීය දේපොළ බදු පැනවීමෙන් ද කුඩා ව්‍යවසාය සංවර්ධනයට බල පායි. දකුණු ආසියාවේ කුඩා ව්‍යවසාය සංවර්ධන ප්‍රතිපත්ති සහ පර්යේෂණ වලදී ස්ත්‍රී පුරුෂ සමාජ භාවය අමතක කර දමා ඇත. මෙම ප්‍රශ්න ජාතික හා ජාත්‍යන්තර පර්යාවලෝකයකින් සංයුක්ත ආකෘති රාමුවක් තුළින් පර්යේෂණය කළ යුතුය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ කලාපීය මට්ටමේ පර්යේෂණ හිඩැස් පියවීම, ප්‍රතිපත්ති දැනුවත් කිරීම සහ පොදු ඉගෙනීමේ නිමැවුම් සඳහා අවස්ථා සැලසීමය. මෙම අධ්‍යයනයට ආසියානු රටවල් පහක් එනම් ශ්‍රී ලංකාව, පාකිස්ථානය, ඉන්දියාව, බංග්ලාදේශය සහ නේපාලය ඇතුළත් වේ.*

**"Feasibility of Launching a Tea Hub in Sri Lanka,"** funded by the Tea Exporters Association in Sri Lanka.
(කණ්ඩායම: පරාක්‍රම සමරතුංග සහ ඩිලානි හිරිමුතුගොඩගේ)

*මෙම අධ්‍යයනයෙන් ප්‍රයත්න දරනුයේ ශ්‍රී ලංකාවේ තේ මධ්‍යස්ථානයක් (Hub) පිහිටුවීමේ සාද්‍යතාවය විශ්ලේෂණය කිරීමය. එහිදී ශ්‍රී ලංකාවේ තේ විවෘතකරණය, තේ වලට වටිනාකම් එකතු කිරීම, තේ අපනයන කරුවන්ට දැනට ඇති අභියෝග සාකච්ඡාවට ලක් වේ. එය ශ්‍රී ලංකාවේ තේ මධ්‍යස්ථානයක් පිහිටුවීමට ඇති සාධනීය හා නිෂේධාත්මක ලක්ෂණ ඇගයීමට ලක් කරයි. වැඩි දුරටත් එය ලොව පුරා ඇති අනෙකුත් තේ අපනයන සකස් කිරීමේ කලාප වල ඇති වාසි සහ අවාසි ද සාකච්ඡා කරයි.*

## ප්‍රකාශන:


Abayasekara, A. ( 2012), Book Review on "Potential Supply Chains in the Textiles and Clothing Sector in South Asia: An Exploratory Study," in *South Asia Economic Journal*, 13(2).

Kelegama, S. and Abayasekara, A. (2012), *Regional Economic Cooperation and Connectivity in South and South-West Asia: Potential and Challenges.* South and South-West Asia Development Papers 1205. UNESCAP: South and South-West Asia Office.

Kelegama, S. (2012) "Coping with Recession and Transformation of the Japanese Economy" in H.D. Karunaratne (ed.), *A Journey in Harmony: Sixty Years of Japan - Sri Lanka Relations*, Faculty of Management and Finances, University of Colombo and JAGAAS publication.

Kelegama, S. (2012) "SAARC's Encounter with Poverty Alteration: Looking Back to Look Beyond" in D. Bhattacharya and M. Rahman (eds.), *Global Recovery, New Risks and Sustainable Growth: Repositioning South Asia*, CPD, Publication, Bangladesh.

Kelegama, S. (2012), *Foreign Aid in South Asia: Emerging Scenario*, (Editor), Sage Publications, Delhi, India.

Kelegama, S. et al. (ed.) (2012), "Regional Economic Integration: Challenges for South Asia during Turbulent Times", SAWTEE, Nepal.

Kelegama, S. (2012), "Asian Financial Integration: Generating Sustainability within the Region" in Association of Professional Bankers of Sri Lanka (Edition), *Sustainability in Volatility: The Bankers' Challenge*, Colombo.

Kelegama, S. (2012), "Impact of Trade Imbalances: Contemporary Trade Policies and Agreements" in A.D.V.de S. Indraratne and S. Vidanagama (eds.), *Achieving Economic Goals in the Midst of Global Challenges*, Sri Lanka Economic Association, Colombo.

Weerakoon, D. (2012), "Towards a Cooperative Framework for South Asia: Economic Development and Regional Integration," in Nayak, N. (ed.), *Cooperative Security Framework for South Asia*, Pentagon Press, New Delhi.

Wijesinha, A. (2012), ·"Air Services Liberalization in South Asia" in "Regional Integration and Economic Development in South Asia", ADB, Manila, also in *South Asia Economic Summit (SAES) Journal*, Volume 5, Islamabad.

# දරිද්‍රතාවය සහ අවදානම් සහගත භාවය

දරිද්‍රතාවය අඩු කිරීමේ සහ සහශ්‍රක සංවර්ධන ඉලක්ක (MDG) සාක්ෂාත් කර ගැනීමේ කැපී පෙනෙන ප්‍රගතියක් අත් කර ගත් නමුත් රටේ පවුල් වල අවදානම් සහගතභාවය විසඳීම අභියෝගයක්ව පවතී. බොහෝ පවුල් ආර්ථික කම්පන, කාලගුණික වෙනස්වීම් සහ දුප්පත් නොවන අය දුප්පත් බවටත්, දුප්පතුන් වඩාත් අසරණ තත්වයටත් පත් කෙරෙන ජීවන චක්‍රයේ සිදුවීම් වල අවදානමට මුහුණ දී සිටිති. වැඩි දුරටත් සාපේක්ෂ වශයෙන් අඩු සමාජ රක්ෂණයක් සහිත නොවිධිමත් අංශයේ විශාල ශ්‍රම හමුදාවක් සිටීම, තරුණයන් හා උගත්, විශේෂයෙන්ම ස්ත්‍රීන් අතර ඉහළ විරැකියා මට්ටමක් පැවතීම කනස්සල්ලට හේතු වන ප්‍රධාන කරුණුය. වයස්ගත ජන සංඛ්‍යාවේ ශීඝ්‍ර වැඩිවීමත් පවතින සමාජ රක්ෂණ පද්ධතියට අභියෝග ගණනාවක් මතු කරයි.

ඉහත සඳහන් අභියෝග විසඳීමේ දී දුප්පතුන්, වයස්ගත වූවන්, ආබාධිතයන්, ස්ත්‍රීන් හා ළමයින් ඇතුළත් අවදානම සහගත පුද්ගලයන් හා පුළුල් පරාසයක අනතුරු ආවරණය කෙරෙන ප්‍රතිපත්ති සහ වැඩ සටහන් අවශ්‍යය. ඊට මුදල් හා භාණ්ඩ ලබා දීම වැනි සමාජ සහනාධාර ලබා දීමෙන් ඔබ්බට ගොස් සමාජ රක්ෂණය හා නිපුනතා සහ ජීවන මාර්ග සංවර්ධනය දක්වා යන සවිස්තරාත්මක පිවිසුමක් අවශ්‍යය. මෙවන් සන්දර්භයක දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ශ්‍රී ලංකාවේ පවතින යාන්ත්‍රණ තක්සේරු කිරීමට හා ශක්තිමත් කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීමට ආරක්ෂණ ජාල, සමාජ ආරක්ෂාව සහ ජීවන මාර්ග සංවර්ධනය පිළිබඳ අධ්‍යයන ගණනාවක් සිදු කර ඇත.

## පර්යේෂණ අධ්‍යයනයන්:

"Review of Safety Nets in Sri Lanka," funded by the World Bank.
(කණ්ඩායම: ගංගා තිලකරත්න, අයෝධ්‍යා ගලප්පත්තිගේ සහ රොෂිනි ජයවීර)

*මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ ආරක්ෂණ වැඩ සටහන් ගැන සවිස්තරාත්මක විශ්ලේෂණයක් කිරීමය. එය ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වන සමෘද්ධි වැඩ සටහන, වයස් ගත වූවන්, ආබාධිත පුද්ගලයන්, අභ්‍යන්තරව අවතැන් වූවන් සහ පවුල් හා ළමයින් නැවත පදිංචි කිරීම වැනි වැඩ සටහන් මෙන්ම පළාත් සභා මගින් සිදු කෙරෙන නොයෙකුත් ආරක්ෂණ වැඩ සටහන් විමර්ශනයට භාජනය කෙරේ. එය රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාත්මක කරන ආරක්ෂණ වැඩ සටහන්ද කෙටියෙන් විමර්ශනය කරයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආරක්ෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා අරමුදල් ගලා ඒමේ ව්‍යුහය පරීක්ෂාවට ලක් කෙරෙන අතර ආරක්ෂණ වැඩ සටහන් වල මූලික සීමාවන් ඉස්මතු කර දක්වයි.*

"Effects of Global Financial Crisis on the Poor," funded by the United Nations Children's Fund (UNICEF).
(කණ්ඩායම: විමල් නානායක්කාර, රොෂිනි ජයවීර සහ අයෝධ්‍යා ගලප්පත්තිගේ)

*මෙම අධ්‍යයනයෙන් ළමයින් හා ස්ත්‍රීන් සඳහා වූ සමාජ ආරක්ෂණය හා දුප්පතුන් කෙරේ ගෝලීය ආර්ථික අර්බුදයේ බලපෑම විශ්ලේෂණය කෙරේ. මෙම අධ්‍යයනය මඩකලපුව, මොනරාගල, නුවර එළියේ වතු අංශයේ සහ වතු අංශය නොවන හා කොළඹ නාගරික ප්‍රදේශවල දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ඇතුළත් ප්‍රදේශ හතරක සිදු කරන ලදී.*

Private Investment and Disaster risk Reduction in the Asia Pacific Region", funded by the UNISDR.
(කණ්ඩායම: කාංචනා වික්‍රමසිංහ, නෙත්මිණි පෙරේරා සහ චන්ද්‍රන කරුණාරත්න)

*මෙම අධ්‍යයනයෙන් විශ්ලේෂණය කරනුයේ ස්වභාවික ආපදාවන්ගේ සාර්ව ආර්ථික බලපෑම් හා විදේශ සෘජු ආයෝජන ( FDI ) ගලා ඒම ඇතුළත් පෞද්ගලික ආයෝජන කෙරේ එහි බලපෑමය. මෙම අධ්‍යයනයෙන් සෘජු විදේශ ආයෝජන ඇතුළත් පුද්ගලික ආයෝජන හා ස්වභාවික ආපදා අනතුරු අතර සම්බන්ධතාවය ආසියා පැසිෆික් කලාපයට අදාල සාර්ව මට්ටමේ දත්ත යොදා ගනිමින් පැහැදිලි කිරීමට අරමුණු කරයි. කලාපීය, උප කලාපීය හා රටවල් අනුව ද්වීතීය මට්ටමේ දත්ත, ඒවා ලබා ගැනීමට ඇති හැකියාව අනුව මෙම අධ්‍යයනයට පදනම්ව ඇත. රටවල් මට්ටමේ තක්සේරු සෘජු විදේශ ආයෝජන ගලා ඒම සහ ස්වභාවික ආපදා දත්ත 1990 සිට 2010 දක්වා කාලය තුළ රැස්කර ගත් දත්ත මත පදනම් වේ.*

**"Updating and Improving the Social Protection Index for Sri Lanka,"** funded by the Asian Development Bank (ADB), Manila.

(කණ්ඩායම: අයෝධ්‍යා ගලප්පත්තිගේ, නෙත්මිණි පෙරේරා සහ රොෂිනි ජයවීර)

*ආසියානු සංවර්ධන බැංකුව, සමාජ ආරක්ෂණ වැඩ සටහන් මැනීමට හා අධීක්ෂණය කිරීමට සංවර්ධනය වන සාමාජික රටවල ( DMC ) හැකියාවන් වැඩි දියුණු කිරීමට ඉවහල්වනු සඳහා ' සමාජ ආරක්ෂණ දර්ශකය ඉහළ දැමීමට සහ වැඩි දියුණු කිරීමට' ( SPI ) පියවර ගනී. අප ආයතනය ශ්‍රී ලංකාව සඳහා එම දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට හා වාර්තාව සකස් කිරීමට සම්බන්ධවී ඇත. සංශෝධනය කරන ලද සමාජ ආරක්ෂණ දර්ශකය ආසියා සහ පැසිපික් කලාපයේ රටවල් සාපේක්ෂකව තරා ( Ranking ) ගත කිරීමට වඩා රටවල් මට්ටමෙන් සමාජ ආරක්ෂණ වැඩ සටහන් වඩාත් ප්‍රයෝජනවත් විශ්ලේෂණ හා තක්සේරු කිරීමේ උපකරණයක් ලෙස සැලකේ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය රජයේ ආයතන/ කාර්යාල වලින් අදාල සමාජ ආරක්ෂණ තොරතුරු හා දත්ත රැස් කිරීමට සම්බන්ධ විය. වියදම් සහ ප්‍රතිලාභීන් පිළිබඳ සමාජ ආරක්ෂණ දත්ත ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ දර්ශකය සකස් කිරීමට විශ්ලේෂණය කෙරිණ.*

**"Employment, Empowerment and Living Standards"**,with the German Institute of Global and Area Studies (GIGA), Hamburg, Germany.

(කණ්ඩායම: මාලති නයිට්, අයෝධ්‍යා ගලප්පත්තිගේ සහ රොෂිනි ජයවීර)

*ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ජර්මන් ගෝලීය හා ප්‍රාදේශීය අධ්‍යයන ආයතනය (GIGA ) සමග එක්ව ශ්‍රී ලංකාවේ 'සේවා නියුක්තිය, බලගැන්වීම හා ජීවන මට්ටම' පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ සේවා නියුක්තිය, බලගැන්වීම හා ජීවන මට්ටම අතර සම්බන්ධතා ගවේෂණය කිරීමය. ශ්‍රී ලංකා අධ්‍යයනය බර්කිනා ෆැසෝ සහ උගණ්ඩාව ඇතුළත් සංවර්ධනය වන රටවල් අතර පැවැත්වෙන ගෝලීය අධ්‍යයනයක කොටසකි. මෙම අධ්‍යයනයෙන් ගවේෂණය කළ මූලික ක්ෂේත්‍ර වන්නේ සේවා නියුක්තිය හා ජීවන මාර්ග පිළිබඳ යහතාවය අතර ඇති සම්බන්ධය, ක්ෂුද්‍ර ව්‍යවසාය මත ඇති සමාජයීය බැඳීම් වල බලපෑම්, නොවිධිමත් සේවා නියුක්ති සන්දර්භයේ දී යහතාවය හා හොඳ වැඩ ගැන ඇති අපේක්ෂා සහ පර්යාවලෝකනය, සුළුතර ව්‍යවසායකයන්ගේ ක්‍රියාකාරිත්වයෙන් ඉගෙන ගත හැකි පාඩම් සහ ස්ත්‍රීන්ගේ තෝරා ගැනීම් සහ නොවිධිමත් සේවා නියුක්ති සන්දර්භයේ ඇති සීමාවන්ය.*

*මෙම අධ්‍යයනයේ අවධානය යොමු වූයේ කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයන් කෙරේය. ශ්‍රී ලංකා අධ්‍යයනයට නිෂ්පාදන එකතුන් ගණනාවක ව්‍යවසාය ඇතුළත් කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යවසාය 500 කට අධික නියැදියක් යොදා ගන්නා ලදී. සවිස්තරාත්මක සමීක්ෂණයට අමතරව ගැඹුරු සම්බන්ධතා හෙළි කර ගැනීමට තෝරා ගත් කණ්ඩායම් සාකච්ඡා සහ ජීවන ඉතිහාසය ගැන සම්මුඛ සාකච්ඡා ද පවත්වන ලදී.*

## ප්‍රකාශන:


Arunatilake, N, (2012), "Precarious Work in Sri Lanka" in *American Behavioral Scientist*, published online before print, November 30, doi: 10.1177/0002764212466246.

Galappattige, A., Jayaweera, R., and Tilakaratna, G. (2012),. *Microinsurance in Sri Lanka: Combating Multiple and Overlapping Vulnerabilities*, Poverty and Social Welfare Series, IPS, Colombo.

Jayawardena, Priyanka (2012), "Socio-Economic Determinants and Inequalities in Childhood Malnutrition in Sri Lanka", *Well-Being and Social Policy Journal*, Vol. 8 Number 1, pp. 1-22.

Samaratunga, P. (2012), "Achieving Economic Efficiency & Equitable Distribution of Land use Through Reforms and/or Market Discipline", in Kelegama, S. & Gunawardena, D. (eds.), *Economic & Social Development Under a Market Economy Regime in Sri Lanka*, Vijitha Yapa Publications, Colombo.

Samaratunga, P. (2012), *Agricultural Pricing and Procurement Policy in South Asia*, Policy Paper, Global Development Network, www.agripolicyoutreach.org.

# නව්‍යකරණ සහ බාහිර වර්ධන ධාවකයන්

අද ගෝලීය සන්දර්භයේ දි වර්ධනය ඉදිරියට යන්නේ නව්‍යකරණයෙන් හා වේගවත් තාක්ෂණ ප්‍රගමනයෙනි. ශ්‍රී ලංකාවට ඉහළ තැනත් අත් කර ගැනීමට නම් යටිතල පහසුකම්, කෘෂිකර්මාන්තය හා සන්නිවේදනය වැනි නොයෙකුත් අංශ වල විවිධාකාර නව්‍යකරණයන් හඳුන්වා දිය යුතුය. මෙම ප්‍රයත්නයන් සාර්ථක වීමට නම් අවශ්‍ය කරන නියාමන රාමු සහ පර්යේෂණ හා සංවර්ධන වශයෙන් රාජ්‍ය සහාය ලැබිය යුතුය. එමෙන්ම විස්තීර්ණ පුහුණු ලබා ගත හැකිව තිබිය යුතු අතර ඒවාට පිවිසීම ද තහවුරු කළ යුතුය.

## පර්යේෂණ අධ්‍යයනයන්:

**"A Study of Supply and Price Behaviour Relating to Selected Crops and Livestock,"** funded by the National Science Foundation (NSF).
(කණ්ඩායම: පරාක්‍රම සමරතුංග, ඩිලානි හිරිමුතුගොඩගේ , විමල් නානායක්කාර සහ චන්දන කරුණාරත්න)

*මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ තෝරා ගත් වගාවන් හා සත්ව නිෂ්පාදන වල ක්‍රමානුකූල සැපයුම් ප්‍රතිචාර සහ මිල සකස්වීමේ සම්බන්ධතාවය තේරුම් ගැනීමේ ප්‍රයත්නයකි. ඊට අමතරව මෙම අධ්‍යයනය තෝරා ගත් වගාවන් සහ සත්ව නිෂ්පාදන කාර්යක්ෂමව සැපයීමට හා මිල ප්‍රේෂණයට ඇති ආයතනික හා තාක්ෂණ සීමාවන් හඳුනා ගනු ඇත. වැඩි දුරටත් හඳුනාගත් බාධක ජය ගැනීම සඳහා සාධ්‍ය ප්‍රතිපත්ති මැදිහත්වීම් නිර්දේශ කරයි.*

**"Intellectual Property Rights in Protecting Plant Varieties and Farmers' Traditional Knowledge in Sri Lanka,"** funded by the National Science Foundation (NSF).
(කණ්ඩායම: පරාක්‍රම සමරතුංග සහ ඩිලානි හිරිමුතුගොඩගේ)

*මෙම අධ්‍යයනයේ ප්‍රමුඛතම පරමාර්ථය වන්නේ පැලෑටි වර්ග වලට සහ ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුමට සාධ්‍ය වූ ආරක්ෂණ ක්‍රම සහ තාක්ෂණ ක්‍රම යෝජනා කිරීමය. වැඩි දුරටත් පැලෑටි ආරක්ෂාව, විශේෂයෙන් වී වර්ග ආරක්ෂාව ගැන ගැටලු, පවතින ප්‍රතිපත්ති හා ප්‍රතිපත්ති හිඩැස් හඳුනා ගැනීමට ප්‍රයත්න දරයි. ඊට අමතරව එය පැලෑටි වර්ග සහ ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුමට අදාලව දැනට පවතින ප්‍රතිපත්ති රාමු සහ පවතින නෛතික හා ආයතනික පද්ධති වල කාර්යක්ෂමතාවය ඇගයීමට ලක් කෙරේ.*

**"An Emerging "Process Innovation" in Agri-Food Industry in Sri Lanka and its Impact on Employment and Income Distribution,"** funded by IPS core research funding.
(කණ්ඩායම: පරාක්‍රම සමරතුංග සහ ඩිලානි හිරිමුතුගොඩගේ)

*මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ කුළුබඩු අංශයේ කුඩා හෝ මධ්‍යම ප්‍රමාණයේ සැකසීමේ සහ අලෙවි කිරීමේ ව්‍යවසායන්ට (ක්‍රියාවලී හෝ ව්‍යාපාර) නව්‍යතා හඳුන්වා දීමේ දී සම්ප්‍රදායික සැපයුම් දාමය හා සැසඳීමේ දී සේවා නියුක්තියට හා ආදායමට ( සාධක හා පුද්ගල යන දෙකම) වන බලපෑම් ඇගයීමයි.*

**"Institutional Mechanisms for Promoting Intra-regional Investments and Trade in the IOR-ARC Region in the Strategic Sectors"** funded by the Indian Ocean Rim Academic Group.
(කණ්ඩායම: අශානි අබයසේකර සහ රවින් ඒකනායක)

*මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ඉන්දියන් සාගර කලාපයේ ආර්ථික 19 ක එකතුවක් වූ ඉන්දියානු සාගර වළල්ලේ කලාපීය සහයෝගිතාවය සඳහා වූ සංගමයේ ( IOR- RAC ) දැනුම පදනම් කර්මාන්තය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආර්ථික සහයෝගිතා විභවයන් ගවේෂණය කිරීමට හා මෙම විභවයන් භාවිතයට ගැනීම පහසු කරවීමට ආයතනික යාන්ත්‍රණයන් හඳුනා ගැනීමයි මෙම උපාය මාර්ගික අංශ වල වෙළඳ හා ආයෝජන සහයෝගිතා අවස්ථා හඳුනා ගැනීමට විශේෂ අවධානයක් යොමු කරනු ඇති මෙම අධ්‍යයනය IOR- ARC සාමාජික රටවල වෙළඳ හා ආයෝජන තොරතුරු වල ජාතික හා ජාත්‍යන්තර මූලාශ්‍ර මත බෙහෙවින් පදනම් වන අතර දැනුම් ආර්ථිකය හා යටිතල පහසුකම් සංවර්ධනය අතින් විවිධ කාර්ය සාධන මට්ටම් වල සිටින තෝරා ගත් සාමාජික ආර්ථික පදනම්ව ගැඹුරු සිද්ධි අධ්‍යයනයන් ද සිදු කෙරෙනු ඇති*

**"Socio Economic Impacts of Nano Technology Applications in Sri Lanka,"** funded by the National Science Foundation.
(කණ්ඩායම: අනුෂ්ක විජේසිංහ)

*මෙම ව්‍යාපෘතිය විශේෂයෙන්ම කර්මාන්තයේ දෘෂ්ඨී කෝණයෙන් වඩාත් විශාල ලෙස වටිනාකම් එකතු කිරීමට හා චිරස්ථායී සංවර්ධනයට ශ්‍රී ලංකාවේ නැනෝ තාක්ෂණය භාවිතා කිරීමට ඇති විභවයන් සොයා බලයි. එහි මූලිකත්වය ගන්නේ ජාතික විද්‍යා පදනමයි. අරමුදල් ලබා දුන්නේ IDRC මගිනි. අප ආයතනය මෙම කලාපීය අධ්‍යයනයේ ශ්‍රී ලංකා සහ දකුණු ආසියානු තාක්ෂණ හවුල්කරුවන්ගේ කණ්ඩායමක කොටසකි.*

## ප්‍රකාශන:

Wijesinha, A. and Perera, N. (2012), "Fostering Innovation to Fast-forward Growth in Sri Lanka", IPS Working Paper, Series No.16, IPS, Colombo.



# බුද්ධි සංචිත ක්‍රියාකාරකම්

## බුද්ධි සංචිත මුලපිරුම් කලාපීය රැස්වීම - මාර්තු 4- 6 ඉන්දියාවේ මයිසෝර් හි දී.

බුද්ධි සංචිත මුලපිරුමේ කලාපීය රැස්වීම මාර්තු 4 සිට 6 දක්වා බැංගලෝර් හි මයිසෝර් නගරයේ දී පැවැත්විණ. මෙම රැස්වීම සංවිධානය කෙළේ විද්‍යාව, තාක්ෂණය සහ ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වූ කේන්ද්‍රය (CSTEP) විසිනි. මෙම රැස්වීමේ පරමාර්ථය වූයේ ප්‍රදානකයන් විසින් හඳුනා ගත් ඉහළ ප්‍රමුඛතා ගැටලු ගැන සමානයන් අතර ව්‍යුහාත්මක ඉගෙනීම හා ආයතනික මට්ටමේ මෙන්ම ප්‍රදානකයන් අතර ව්‍යාපෘති මට්ටමේත් සාමූහික ප්‍රයත්න ප්‍රවර්ධනය කිරීමය. විධායක අධ්‍යක්ෂක ආචාර්ය සමන් කැලේගම, නියෝජ්‍ය අධ්‍යක්ෂිකා දුෂ්ණි වීරකෝන් සහ පර්යේෂණ සාමාජිකා මාලති නයිට් කලාපීය රැස්වීමේ දී ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නියෝජනය කළහ. විධායක අධ්‍යක්ෂක වරයා ' පශ්චාත් ගැටුම් රාජ්‍යයන්හි බුද්ධි සංචිත සඳහා මානව සම්පත්' යනුවෙන් ඉදිරිපත් කිරීමක් කෙළේය.





## TTI හුවමාරු 2012 '' සාර්ථකත්වය ලබනු හැකිවීම 2012

TTI ආයතනය එහි සියලුම ප්‍රදානලාභීන්, ප්‍රදානකයන් හා උපදේශකයන්ගේ රැස්වීමක් ජුනි 18 - 20 දින වල දකුණු අප්‍රිකාවේ කේප් ටවුන් හි පැවැත් වූයේය. මෙම සාකච්ඡා මණ්ඩපයේ පරමාර්ථය වූයේ සාර්ථක ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනයක් වන්නේ කෙසේද යන්න ගැන දැනුම හා අදහස් ජනනය කිරීම, යහ භාවිතා ඵලදායි ලෙස ඉදිරිපත් කිරීම, ඉගෙනීම සහ ආවර්ජනය දිරිමත් කිරීම සහ වැඩ සටහන් සඳහාත් ප්‍රදානලාභීන් සඳහාත් අනාගත දිශානතීන් හැඩ ගසා ගැනීමට ඉවහල් වීමය. පළමු TTI සාකච්ඡා මණ්ඩපයට විධායක අධ්‍යක්ෂක ආචාර්ය සමන් කැලේගම සහ නියෝජ්‍ය අධ්‍යක්ෂිකා ආචාර්ය දුෂ්ණි වීරකෝන් අප ආයතනය වෙනුවෙන් සහභාගි වූහ. නියෝජ්‍ය අධ්‍යක්ෂිකාව ' බුද්ධි සංචිත අධීක්ෂණයට ඉගෙන ගැනීම: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අත්දැකීම්' යනුවෙන් ඉදිරිපත් කිරීමක් කළාය. වැඩ සටහනේ අවසන් දිනයේ දී ප්‍රදානකයන්ගෙන් අරමුදල් ලබා ගැනීමට හැකියාවක් ඇති ගෝලීය ආර්ථික ගැටලු පිළිබඳව බුද්ධි සංචිත කණ්ඩායමේ යෝජනා සැකසීමේ සැසියක් පැවැත්විණ. වඩාත් ආකර්ෂණීය ව්‍යාපෘති සඳහා TTI ආයතනයෙන් සෘජුව අරමුදල් ලබා ගැනීමේ හැකියාවක් තිබිණ. විධායක අධ්‍යක්ෂක වරයා දකුණේ හඬ වෙනුවෙන් පශ්චාත් සහශ්‍රක සංවර්ධන ඉලක්ක සංවර්ධන න්‍යාය පත්‍රය සඳහා වූ යෝජනාවක් පිළිබඳ වටමේස සාකච්ඡාවට සහභාගි වූයේය. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය මෙම යෝජනාව සකස් කිරීමට සහ අරමුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට බංග්ලාදේශ් CPD සහ දකුණේ බුද්ධි සංචිත ගණනාවක් සමග හවුල් වූයේය.





## 'බුද්ධි සංචිත ප්‍රාදේශීය විසඳුම් ප්‍රවර්ධනය කරයි, ගෝලීය චින්තනයට බලපායි.' 2012 ඔක්තෝබර් 13 ජපානයේ ටෝකියෝ හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල - ලෝක බැංකු වාර්ෂික රැස්වීම

විධායක අධ්‍යක්ෂක වරයා IDRC අනුග්‍රහය යටතේ 'බුද්ධි සංචිත ප්‍රාදේශීය විසඳුම් ප්‍රවර්ධනය කරයි, ගෝලීය චින්තනයට බලපායි' යනුවෙන් පැවති TTI සාකච්ඡාවට සහභාගි වූයේය. එහි මුලසුන ගත්තේ TTI-IDRC හි ආචාර්ය පීටර් ටේලර් ය.



## බුද්ධි සංචිත බලපෑම අධීක්ෂණය කිරීමට ඉගෙන ගැනීම, ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අත්දැකීම්

අප ආයතනය සංවර්ධනය වන රටවල් සන්දර්භයේ දී බුද්ධි සංචිත වල ප්‍රතිපත්ති බලපෑම අධීක්ෂණය සහ මැනීමේ විශ්ලේෂණාත්මක රාමුවක් ගොඩ නැගීම සඳහා පර්යේෂණ අධ්‍යයනයක් නිම කර ඇත. මෙම අධ්‍යයනයෙන් බලපෑම මැනීමේ තම ප්‍රයත්නයේ දී බුද්ධි සංචිත වලට ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කරන විවිධ දර්ශක, විචලනයන්, සන්දර්භ හා පිවිසුම් විශ්ලේෂණාත්මක රාමුවක් තුළ සංයුක්ත කිරීමට උත්සාහ කරයි.

විෂය පිළිබඳව පවතින ලිපි ලේඛන පදනම් කර ගත් මෙම රාමුව සිද්ධි අධ්‍යයනයන් තුනක් සඳහා (ලතින් ඇමරිකාව, අප්‍රිකාව හා දකුණු ආසියාවෙන් එකක් බැගින්) යොදා ගැනීමෙන් බුද්ධි සංචිත සඳහා පාඩම් හඳුනා ගනී.

# 2012 වසරේ දී TTI අරමුදල් ලබා දුන් ක්‍රියාකාරකම්/වැඩ සටහන්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නිරන්තරයෙන්ම විවිධ හවුල්කරුවන් සොයා යෑමට හා සමාජ ආර්ථික ගැටලු ගැන තම ඥානය පුළුල් පිරිසක් අතරට ගෙන යෑමට උත්සුක වේ. මෙම ප්‍රයත්නයේ කොටසක් වශයෙන් අප ආයතනය හා ප්‍රතිපත්ති සහ ශාස්ත්‍රීය පර්යේෂණ අතර සහයෝගී සම්බන්ධතාවයන් ගොඩ නගා ගැනීමට 2012 මාර්තු මස 21 සිට 23 දක්වා රටපුරා ඇති විශ්ව විද්‍යාල වල උපාධි අපේක්ෂකයන් හා කතිකාචාර්ය වරුන් ගේ වැඩ මුළුවක් හා අදහස් හුවමාරු කර ගැනීමේ සංවාදයක් ''IPS විශ්ව විද්‍යාල සංසදය'' නමින් පැවැත් වූයේය.

මෙය සහභාගි වූවන්ට ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සමග හා සමාජ ආර්ථික සංවර්ධන ක්ෂේත්‍රයේ විශේෂඥයන් සමග අදහස් හුවමාරු කර ගැනීමට, ඉගෙන ගැනීමට, සහයෝගය ගොඩ නගා ගැනීමට හා ජාල ගතවීමට අවස්ථාවක් විය. මෙම සාකච්ඡා මණ්ඩපය විශේෂයෙන්ම අප ආයතනයේ ආර්ථික විද්‍යාඥයන් හා ප්‍රධාන සංවර්ධන විශේෂඥයන් සමග සම්බන්ධතා ඇති කර ගැනීමට මෙන්ම පර්යේෂණ සහයෝගිතාවය, ඉදිරි ව්‍යාපෘති/ නිබන්ධන පිළිබඳව අප ආයතනයේ පර්යේෂකයන්ගේ මග පෙන්වීම් ලබා ගැනීමට හා පර්යේෂණ සඳහා ඇති නව මාධ්‍ය උපකරණ හා සීමාවාසික පුහුණු සඳහා අවස්ථා ගැන ඉගෙන ගැනීමට අවස්ථාවක් ද විය.





## දෙවන ජාතික වාර්ෂික සමුළුව.



ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය නොවැම්බර් 7 වැනි දා එහි ශ්‍රවනාගාරයේ දී ''ශ්‍රී ලංකාවට වර්ධනයේ අධිවේගී මාර්ගයේ රැඳී සිටිය හැක්කේ කෙසේද?'' යන තේමාව ඔස්සේ දෙවන වාර්ෂික ජාතික සමුළුව පැවැත්වීය. එහි දී සාකච්ඡාවට ලක් වූ තීරණාත්මක තේමා දෙක වූයේ ''අංශ, කලාප හා ජන කණ්ඩායම් අතර අසමානතාවය අවසන් කරන්නේ කෙසේද?'' යන්න හා ''පෞද්ගලික ව්‍යවසාය, වර්ධනය, විදේශීය සෘජු ආයෝජන, නව්‍යකරණය හා තරගකාරිත්වය''යි. මෙම සමුළුවට රාජ්‍ය, පෞද්ගලික අංශය, ශාස්ත්‍රඥයන් සහ ප්‍රදානක ආයතන විශාල සංඛ්‍යාවක් සහභාගි වූහ. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වැදගත්ම වාර්තාව වූ ''ශ්‍රී ලංකාව: 2012 ආර්ථිකයේ තත්වය'' එළි දැක්වීම ද සමුළුව ආරම්භයේ දී සිදු විය.

## සියලු ප්‍රතිපත්ති තුළ සෞඛ්‍යය

සෞඛ්‍ය ආර්ථික ප්‍රතිපත්ති ඒකකය අප ආයතනයේ ප්‍රධාන සමුළු ශාලාවේ දී 2012 පෙබරවාරි 21 වැනි දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ තෝරා ගත් අමාත්‍යාංශ වල වගකිව යුතු නිලධාරීන් සමග " ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් සෞඛ්‍යයේ සමාජ නිර්ණායක විසඳීමේ දී සෞඛ්‍යය සඳහා අන්තර් අංශීය පියවර - සියලු ප්‍රතිපත්ති තුළ සෞඛ්‍යය" යනුවෙන් වට මේස සාකච්ඡාවක් පැවැත් වීය. මෙම වට මේස සාකච්ඡාව පැවැත් වූයේ "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ප්‍රතිපත්ති තුළින් සෞඛ්‍යයේ සමාජ නිර්ණායක විසඳීමේ දී සෞඛ්‍යය සඳහා අන්තර් අංශීය පියවර - සියලු ප්‍රතිපත්ති තුළ සෞඛ්‍යය" යන පර්යේෂණ ව්‍යාපෘතියේ කොටසක් ලෙසිනි.



## ඉදිරිපත් කිරීමේ නිපුණතා පුහුණුව

ඉදිරිපත් කිරීමේ සහ සන්නිවේදන නිපුණතා පිළිබඳ පුහුණු වැඩ සටහනක් අප ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා බාහිර මානව සම්පත් සංවර්ධන විශේෂඥයෙකුගේ සහාය ඇතිව සති 15 ක් තිස්සේ පවත්වන ලදී.



## සංඛ්‍යාන පුහුණුව

SPSS දත්ත සැකසීම හා විශ්ලේෂණය පිළිබඳ පුහුණු වැඩ සටහනක් ජ්‍යෙෂ්ඨ බාහිර අධි සාමාජික විමල් නානායක්කාර මහතා විසින් අප පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා සති 10 කට අධික කාලයක් තිස්සේ පැවැත් වූයේය. මෙම පුහුණු වැඩ සටහන සැලසුම් කරන ලද්දේ තමන්ගේම පර්යේෂණ වලින් ලබා ගත් ක්ෂුද්‍ර දත්ත හා විශ්වාස කටයුතු වෙනත් මූලාශ්‍ර වලින් ලබා ගත් ක්ෂුද්‍ර දත්ත සැකසීමට හා විශ්ලේෂණය කිරීමට උනන්දු වන සහභාගි වන්නන් සඳහාය.

## ආර්ථිකය ගැන කතා කරන ඩයිජස්ට් සඟරාව Talking Economics Digest

ආර්ථිකය ගැන කතා කරන ඩයිජස්ට් සඟරාව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අර්ධ වාර්ෂික ප්‍රකාශනයකි. එහි සංග්‍රහ කරන්නේ සෑම හය මසකටම වරක් නිකුත් වන කතා කරන ආර්ථික බ්ලොග් පිටුවේ පළ වන ලිපි සහ විශේෂාංගයි. මෙම ඩයිජස්ට් වර්ගයේ සඟරාවේ කලාප දෙකක් TTI ප්‍රධාන ආධාර ඇතිව පළ විය.

## ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ පුස්තකාලයේ සම්පූර්ණ පෙළ දත්ත ගබඩාවට පිවිසීම

අප ආයතනයේ පුස්තකාලයට 2013 දක්වා මාර්ග ගතව ( Online ) එහි සම්පූර්ණ පෙළ දත්ත පදනමට පිවිසිය හැකිය. ඊට සහාය ලැබුණේ TTI ප්‍රදානයකිනි.

# සහායක සේවාවන්

## මූල්‍ය සහ පරිපාලන

මූල්‍ය සහ පරිපාලන දෙපාර්තමේන්තුවේ ඒකක පහකි. මූල්‍ය මෙහෙයුම්, පරිපාලනය, මානව සම්පත්, ක්‍රියාත්මක මෙහෙයුම් හා ප්‍රසම්පාදන සේවා යනුවෙනි. මෙම ඒකක අප ආයතනයේ පර්යේෂණ ඒකක වලට අභ්‍යන්තර සහාය සේවාවන් සපයයි.

මෙම වසර ඇරඹුණේ වඩාත් වැඩි මූල්‍ය ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමේ සහ ක්‍රියාවලීන්ගේ සහ පද්ධතීන් ගේ වඩාත් වැඩි කාර්යක්ෂමතාවයක අපේක්ෂා සමගය. කලින් වසරේ වාර්තා වූ රු. 344,742 ක අතිරික්තය හා සසඳන විට මෙම වසරේ රු. 916,970 ක අතිරික්තයක් අත් කර ගැනීමෙන් මෙම අපේක්ෂාව සාර්ථක කර ගත්තේය. ව්‍යාපෘති ආදායම් සියයට 9 කින් පහත වැටුණ ද සම්මන්ත්‍රණ සහ වැඩමුළු ආදායම් සහ පොලී ආදායම් සැලකිය යුතු ලෙස වැඩි විය. එහි අනුපාතය පිළිවෙළින් සියයට 91 සහ 40 වශයෙකි. ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ලැබුණු දායකත්වය කලින් වසර හා සසඳන විට සියයට 8 කින් ඉහළ ගියේ මූලික වශයෙන් රජයේ පාර්ශ්වයෙන් අයවැය සීමාවන් නොවූ නිසාය. IDRC බුද්ධි සංචිත මුලපිරුමෙන් ලැබුණු ප්‍රදානය කලින් වසරේ මෙන් සමස්ත ආදායම වැඩි කිරීමට හේතු වූ අතර එය සමස්ත ආදායමෙන් සියයට 16 කි. සැලසුම් කළ ආකාරයට ආදායම් ඉපයීමේ මාර්ගයක් ලෙස ශ්‍රවනාගාරය කුලියට දුන් නමුත් ඉන් ලැබුණේ සුළු ආදායම් ප්‍රමාණයකි. එන්ඩෝව්මන්ට් අරමුදලෙන් ලැබුණු දායකත්වය ආයතනයේ සමස්ත ආදායම් තත්වය ශක්තිමත් කිරීමට හේතු විය. ආයතනයට නඩත්තු සහ ගමන් වියදම් පිරිවැය පාලනය කිරීමට හැකි වුවද ක්ෂයවීම්, කල් බදු, පර්යේෂණ, සම්මන්ත්‍රණ හා වැඩ මුළු වියදම් පෙර වසර හා සසඳන විට සියයට 20 කින් ඉහළ ගියේය. මූල්‍ය සහ පරිපාලන ඒකකය සාර්ථකව ගිණුම් හා මානව සම්පත් පද්ධතියට සංක්‍රමණය විය. මෙම පද්ධති යොදා ගැනීමෙන් මෙම ඒකකයට ගනුදෙනු පහසුවෙන් හා කාර්යක්ෂමව වාර්තා කිරීමට හා ක්‍රියාත්මක කිරීමට හැකි වූ අතර කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ වේලාව හොඳින් අධීක්ෂණය කිරීමට හැකි විය. වසර තුළ තොග සමීක්ෂණයක් පවත්වන ලදී. මූල්‍ය වාර්තා වල ක්‍රියාවලීන් සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා මාස තුනකට වරක් අභ්‍යන්තර විගණනයක් සිදු කෙරිණ. මෙම ඒකකය විගණන කොමිටිය සමග සමීපයෙන් වැඩ කිරීමෙන් වසර තුළ දී අගනා යෝජනා ලබා ගත්තේය.

දිගු කලක් අප ආයතනයේ සේවයේ යෙදී සිටි සේවකයන් කීප දෙනෙක් ඉල්ලා අස්වීමෙන් අභියෝගයකට මුහුණ දීමට සිදු විය. මෙම ආයතනයට වසර දහයක් මූල්‍ය සහ පරිපාලන අධ්‍යක්ෂිකාව වශයෙන් සේවය කළ ඉලෝකා වික්‍රමසිංහ මිය පවුල් කටයුතු නිසා ඉල්ලා අස් වූ අතර එම තනතුරට ජයනි ලද්දුවහෙට්ටි මිය පත් වූවාය. විධායක අධ්‍යක්ෂක වරයාගේ ලේකම් ලෙස වසර දහයක් සේවය කළ නිර්මලා මීගම මිය විදෙස්ගත වීමෙන් ඇති වූ පුරප්පාඩුවට නිලන්ති අලහකෝන් මෙනෙවිය පත් වූවාය. විධායක අධ්‍යක්ෂක වරයාගේ සම්බන්ධීකරණ ලේකම් ශාමිනි ද සිල්වා මෙනෙවිය ආයතනයට වසර නමයක් සේවය කොට පවුලේ වැඩ කටයුතු නිසා ඉල්ලා අස් වූවාය. ඉල්ලා අස් වූ ලේකම් වෙරොනිකා ජාකොබ් මෙනෙවිය හා සහකාර ගණකාධිකාරී අයන්ත පරණවිතාන වෙනුවට පිළිවෙළින් නයෝමි ජයකොඩි මෙනෙවිය සහ ජීවනී හේරත් මෙනෙවිය පත් කරනු ලැබිණ.

## ප්‍රකාශන හා සන්නිවේදන ඒකකය

ආයතනයේ ප්‍රකාශන හා සන්නිවේදන ඒකකය තොරතුරු බෙදා හැරීමේ කේන්ද්‍රය යි. මෙම ඒකකයේ වගකීම වන්නේ ජාත්‍යන්තර හා ජාතික සමුළු, වැඩමුළු සහ සම්මන්ත්‍රණ ඇතුළත් ප්‍රකාශන මුද්‍රිත, වෙබ් සහ වෙනත් මාධ්‍යයන් හරහා බෙදා හැරීමයි. ප්‍රකාශන හා සන්නිවේදන ඒකකය පර්යේෂණ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ හැකියාවන් සහ විද්‍යුත් හා මුද්‍රණ මාධ්‍යයේ තම පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීමට සහාය වේ. මෙම ඒකකයේ මූලික කටයුතු මෙසේය:

- ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රකාශන සැකසීම සහ බෙදා හැරීම
- දේශීය හා ජාත්‍යන්තර සමුළු, සම්මන්ත්‍රණ හා වැඩමුළු සංවිධානය කිරීම
- සමායතන සන්නිවේදනය ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවර්ධන කටයුතු
- ආයතනයේ මහජන වෙබ් පිටුවේ අන්තර්ගතය සැලසුම් කිරීම හා සංවර්ධනය.

ගුණාත්මක භාවය ඒකකයේ ප්‍රමුඛතාවය වුවද ආයතනයේ පර්යේෂණ ප්‍රකාශන ඵලදායී ලෙස ප්‍රවර්ධනය කෙරේ ද අවධානය යොමු කරයි. අලෙවි කටයුතු මූලික වශයෙන් ආයතනයේ දීර්ඝ දිවයින පුරා ඇති තෝරා ගත් අලෙවි ජාලයන් හරහාත් සිදු කෙරේ. ප්‍රකාශන පිළිබඳ සමස්ත අධීක්ෂණය මෙම ඒකකයේ කාර්ය මණ්ඩලය විසින් සිදු කරන අතර එහි කාර්ය මණ්ඩලයෙන් අවශ්‍ය පසුවිපරම් කටයුතු ද සිදු කෙරේ.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රකාශන පුළුල් වශයෙන් ලබා ගැනීම සහ පිළිගැනීම තහවුරු කිරීමේ සේවාවන් වැඩි දියුණු කිරීමට ද ප්‍රමුඛතාවයක් ලබා දේ. දේශීය ප්‍රකාශන වෙළඳ පොළ වඩාත් තරගකාරී වෙත්ම ආයතනයේ ප්‍රකාශන හා අලෙවි කිරීමේ උපාය මාර්ග නිරන්තරයෙන්ම වැඩි දියුණු කළ යුතුය. මෙම අංශය 2012 වසර පුරාම ඔන්ලයින් සහ මුද්‍රණ මාධ්‍ය හරහා නව සන්නිවේදන උපකරණ භාවිතාවට යොදා ගත්තේය.

IPS බ්ලොග් පිටුව - 'Taking Economics කියවන සහ ඒ ගැන අදහස් සටහන් කරන සංඛ්‍යාවේ වැඩි වීමක් දිගටම දක්නට ලැබිණ. Talking Economics Digest අර්ධ වාර්ෂික ප්‍රකාශනයේ කලාප දෙකක් නිකුත් වූ අතර ඊට සියලු බ්ලොග් ලිපි සහ වෙනත් විශේෂාංග ඇතුළත් විය. මෙම ප්‍රකාශනයේ පිටපත් පෞද්ගලික අංශයේ ප්‍රධාන පුද්ගලයන්ට, රජයේ නිලධාරීන්ට, මෙරට ඇති බහුපාර්ශ්වීය ආයතන හා ශාස්ත්‍රඥයන් ඇතුළු සියලු අදාල පාර්ශ්වයන්ට ලබා දෙන ලදී. එමෙන්ම එම පිටපත් මෙම ආයතනයේ ක්‍රියාකාරකම් වලදී තිළිණ වශයෙන් ද බෙදා හැරිණ. මෙම ඒකකය ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රසිද්ධ වෙබ් අඩවිය වන www.ips.lk iy ips.lk/ climatenet. iy climatenet Blog සඳහා අන්තර්ගත කළමනාකරණ සේවා සපයයි.

## ප්‍රකාශන අලෙවිය

පවතින ආර්ථික තත්වයන් යටතේ වුවද මෙම වසරේ අලෙවි ආදායම රු 908,887 ක් වියි කැපී පෙනෙන අලෙවි ආදායම් ලබා දුන් වඩාත් කාර්යක්ෂම අලෙවි ස්ථාන හඳුනා ගන්නා ලදී.

## අනාගතය සඳහා

ප්‍රකාශන හා සන්නිවේද ඒකකයේ මූලික මධ්‍ය කාලීන ඉලක්කය වන්නේ වඩාත් පුළුල් පාඨක පිරිසක් අතරට ආයතනයේ ප්‍රකාශ ලැබීමට සැලසීමය. ඒ සඳහා යොදා ගන්නේ, ශාස්ත්‍රීය පර්යේෂණ වඩාත් පහසු ආකාරයෙන් ලබා ගැනීම සඳහා ප්‍රතිපත්ති කෙටි සටහන් හා ඒ බුලටින් මාර්ගයෙන් ලබා දීම.

ආයතනයේ බ්ලොග් පිටුව Talking Economics සහ cilmatenet Blog වැනි විකල්ප මාධ්‍ය ආකාරයන් යොදා ගැනීම

මෙම පියවර වල අරමුණ වන්නේ ආයතනයේ ප්‍රසිද්ධ ප්‍රතිරූපය වඩාත් පුළුල් කිරීම හා සමකාලීන ආර්ථික ගැටලු ගැන මහජන සංවාදයට ඵලදායි ලෙස දායකවීමය.

දැනට අප ආයතනයේ පර්යේෂණ කටයුතු වල මූලික සන්නිවේදන මාර්ග වන්නේ නිතිපතා සිදු කෙරෙන ප්‍රකාශන, සම්මන්ත්‍රණ, වෙබ් අඩවි, පුවත් පත් වාර්තා සහ රූපවාහිනී සම්මුඛ සාකච්ඡා පැවැත්වීමය. ඊට අමතරව අපි ශාස්ත්‍රීය පර්යේෂණ කියවීමට වඩාත් පහසු ආකාරයෙන් සකස් කරමු. ඒ තුළින් අපි සාමාන්‍ය ජනතාව, ශිෂ්‍යයන්, අන්තර්ජාතික ජාලයන් සහ ඩයස්පෝරාව වඩාත් ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීමට උත්සාහ කරමු. අප ආයතනය සන්නිවේදනය සඳහා අන්තර් ජාල පහසුකම් භාවිතා කරන්නේ සාමාන්‍ය වෙබ් අඩවියක් පවත්වා ගැනීම වැනි සීමිත ආකාරයටය. කෙසේ වුවත් අපි බ්ලොග් හා මයික්‍රොබ්ලොග් වැනි නව මාර්ගගත සමාජ මාධ්‍යය යොදා ගනිමින් සිටින අතර අන්තර් ජාලය හරහා ලබා ගත හැකි නවීන සන්නිවේදන උපකරණ ද යොදා ගනිමු.

# තොරතුරු පද්ධති ඒකකය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ තොරතුරු පද්ධති ඒකකය පහත සඳහන් කේන්ද්‍රීය ක්ෂේත්‍ර කෙරේ යොමු වේ. අ) මෘදුකාංග, දෘඩාංග, ජාල ගොඩනැගීම සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය. ආ) වෙබ් පිටු සැකසීම, නඩත්තුව සහ තොරතුරු පතුරුවා හැරීම. ඇ) දත්ත බැංකු ගොඩ නැගීම, නඩත්තුව සහ කළමනාකරණය. ඒ තුළින් මෙම අංශය ආයතනයට කලාපයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් ලෙස තරගකාරීවීමට සහාය වේ.

## තත් ප්‍රදේශ ජාලය (LAN)

ඉදිරි වසර 5 ක කාලයක් සඳහා ආයතනයේ තොරතුරු සන්නිවේදන (ICT) අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයට සම්පූර්ණයෙන්ම අලුත් තත් ප්‍රදේශ ජාලයක් (LAN) සංකල්පගත කොට ක්‍රියාත්මක කර ඇත.

## ඒකාබද්ධ වූ සන්නිවේදනඃ

සන්නිවේදනය, සමුළු පැවැත්වීම සහ සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා IP දුරකතන සහිත සංයුක්ත ඒකාබද්ධ සන්නිවේදන ජාලයක් ස්ථාපනය කර ඇත. ඉන් වෙනත් දුරකතන ජාලයක් ක්‍රියාත්මක කිරීමේ වැය ද අඩු කෙරිණ.

## අතත්‍යරූපි පුද්ගලික ජාලයන් ගොඩ නැගීම (Virtual Private Networking )

පර්යේෂකයන් ආයතනයේ පරිශ්‍රයෙන් බැහැරව විවිධ ස්ථාන වල සිට ( විදේශ සම්මන්ත්‍රණයක සිටින විට, ක්ෂේත්‍රයේ සිටින විට හෝ ගෙදර සිට හෝ වෙනත් පිටස්තර තැනක සිට වැඩ කිරීමේ දී IPS ජාලයට සුරක්ෂිතව පිවිසීමට සහ අවශ්‍ය සම්පත් වලට පිවිසීමට, මෘදු දුර කතන (Soft Phones) හරහා

දුරස්ථව සන්නිවේදනය කිරීමට හා එමගින් පර්යේෂකයන්ට අතත්‍ය කණ්ඩායම් වැඩ වලට සම්බන්ධවීමට හා සහයෝගය ලබා දීමට හැකි කරවන පහසුකම් හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතිය IPS කණ්ඩායම තුළ මෙන්ම ආයතනයේ පර්යේෂකයන් සමග සහයෝගයෙන් වැඩ කරන අනෙකුත් සංවිධාන වලට ද ලබා දී ඇත.

### ඕඩියෝ/වීඩියෝ සමුළු පැවැත්වීම

කාර්ය මණ්ඩල සමුළු ශාලාව සහ විධායක අධ්‍යක්ෂක වරයා ජාල ගත කිරීමට ඕඩියෝ සමුළු පහසුකම් අනුබද්ධ කර ඇත. සැලසුම් කළ ආකාරයට අනුබද්ධ කළ වීඩියෝ සමුළු උපකරණ හා වෙබ් ජාලයට ඇතුළත් කිරීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් පවතී.

### දත්ත කේන්ද්‍රය

තොරතුරු තාක්ෂණ මෙවලම් සහ දත්ත හා තොරතුරු පතුරුවා හැරීමේ සේවා කාර්යක්ෂමව ලබා දීමේ මධ්‍යස්ථානයක් ස්ථාපනය කර ඇත. බල ශක්ති සැපයුමේ බිඳ වැටීම් සඳහා විසඳුමක් වශයෙන් විදුලිය ජනක යන්ත්‍ර ස්ථාපනය කරන තෙක් යොදා ගත් UPS දැන් අනවශ්‍යය.

### සර්වර්ස් (SERVERS)

දැනට අතථ්‍යකරණය වූ විසඳුම් (Virtulization solutions) සහිත නව සර්වර් පද්ධතියක් ස්ථාපනය කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මධ්‍යගත වූ ප්‍රධාන පද්ධතියක් ක්‍රියාත්මක වේ. (එනම් භාවිතා කරන්නන්ට ලොව කොතැනක හෝ සිට අදාල විද්‍යුත් ලිපි ලබා ගත හැකිය.) උපස්ථන (Backup) පද්ධති/ ආපදා අවස්ථාවල දී දත්ත රැක ගැනීම සඳහා පද්ධති ක්‍රියාත්මක වේ.

### වයි ෆයි (Wi-Fi)

අප කාර්ය මණ්ඩලයට සහ පැමිණෙන අමුත්තන්ට අන්තර් ජාල පහසුකම් සඳහා ආයතනයේ ගොඩනැගිලි තුළ ආරක්ෂිත වයි - ෆයි කලාපයක් ක්‍රියාත්මක වේ.

### වෙබ්

පවතින වෙබ් අඩවිය නඩත්තු කිරීමෙන් සහ ෂජී බ්ලොග් ව්‍යාප්තිය පුළුල් කිරීමෙන් ආයතනයේ වෙබ් මෙහෙයුම් දිගටම පවත්වා ගනී. අප ආයතනයේ වෙබ් ව්‍යාප්තිය වැඩි දියුණු කිරීම සඳහා ට්විටර්, ෆේස් බුක්, යූ ටියුබ් සහ ෆ්ලිකර් හරහා පියවර ගනිමින් සිටී.

### පරිගණක (PC)

කාර්ය මණ්ඩල සාමාජිකයන්ට මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් 7 හා මයික්‍රොසොෆ්ට් ඔෆිස් 2010 මෙහෙයුම් පද්ධති සමග නව පරිගණක ලබා දෙන ලදී.

### සැලසුම්

දැනට මෙම ඒකකය වෙබ් අඩවියේ පෙනුම නවීකරණය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. එය 2013 අගෝස්තු මාසය වන විට අවසන් වනු ඇත.

## පුස්තකාලය

පුස්තකාලය ප්‍රතිචාරාත්මක දැනුම් සේවා ලබා දීමෙන් හා කාර්ය මණ්ඩලයට ගුණාත්මක තොරතුරු මූලාශ්‍ර සම්බන්ධකර දීමෙන් පර්යේෂණ වලට සහාය වේ.

### දැක්ම

පුස්තකාලය ශ්‍රී ලාංකීය සමාජ - ආර්ථික ප්‍රතිපත්ති පර්යේෂකයන්ට අත්‍යවශ්‍ය වූ දැනුම් සේවා සඳහා වටිනා කේන්ද්‍රයක් වීම.

### සමස්ත දැක්ම

පුස්තකාලය පර්යේෂකයන්ට සුවිශේෂ වූ පර්යේෂණ සහාය ලබා දීමෙන් ආයතනයේ පර්යේෂණ ක්‍රියාවලියේ සංයුක්ත කොටසක් වේ. එය ආයතනයේ පර්යේෂණයන් හි ප්‍රගමණය සඳහා කාලීන තොරතුරු සොයා ගැනීම හා පතුරුවා හැරීම පහසුකරවීමට සියලු ප්‍රයත්න දරයි. පුස්තකාලය සම්පත් හා සේවාවන් සංවර්ධනය කිරීමෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගත් නමුත් නිසි කලට තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නොලැබීමෙන් 2011 වාර්ෂික වාර්තාවේ සඳහන් ඉලක්ක සපුරා ගත නොහැකි විය.

### රැස් කිරීම වර්ධනය කිරීම

ආයතනයේ වර්ධනය වන පර්යේෂණ අවශ්‍යතාවයන්ට සරිලන ආකාරයට පොත් පත් රැස් කිරීම හැම විටම පුස්තකාලයේ ප්‍රමුඛතාවයක් විය. නොකඩවා තොරතුරු වර්ධනය වීමත් ආර්ථික පසුබෑමත් මෙය පුස්තකාල වලට එන්න එන්නම අභියෝගයක් විය. එසේ වුවත් 2012 වසරේ දී පුස්තකාලයට මුද්‍රිත හා ඉලෙක්ට්‍රානික ආකෘති වලින් නව මූලාශ්‍ර විශාල සංඛ්‍යාවක් එකතු කර ගැනීමට හැකි විය. සැලකිය යුතු පොත් පත් සංඛ්‍යාවක් මිලදී ගැනීම් වලට අමතරව මනාව සකස් වූ හුවමාරු වැඩ සටහන් යටතේ පොත් හා පත්‍රිකා විශාල සංඛ්‍යාවක් පුස්තකාලය සතු විය. මීට අමතරව පුස්තකාලයේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා අංශීය ප්‍රතිපත්ති ගැන මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍යයෙන් ඇති එකතුන් ද වඩාත් පුළුල් විය. එමෙන්ම පුස්තකාලය දේශීය හා විදේශීය වාරික ප්‍රකාශන ගණනාවක් සඳහා දායක මුදල් ගෙවා ලබා ගනී. දැනට ඇති එකතුව පොත් වෙළුම් 11,264 කින් හා පත්‍රිකා 5,740 කින් සමන්විත වේ.

### මාර්ගගත සම්පූර්ණ පෙළ සහිත දත්ත බැංකු වලට පිවිසීම.

සම්පූර්ණ පෙළ සහිත මාර්ගගත දත්ත බැංකු වලට නොකඩවා පිවිසීමේ පහසුකම් ලබා දීම ලොව පුරා ඇති පුස්තකාල හැම එකක්ම පාහේ මුහුණ දෙන අභියෝගයක් වන්නේ ගෙවිය යුතු දායක මුදල් ඉතා ඉහළ නිසාය. පුස්තකාලය තාවකාලික වශයෙන් මෙම ගැටලුව ජය ගෙන 2013 වසර තෙක් පූර්ණ පෙළ සහිත මාර්ගගත දත්ත බැංකු වලට පිවිසීමේ පහසුකම ලබා ගත්තේ IDRC / බුද්ධි සංචිත මුල පිරුමේ කාරුණික සහාය තුළිනි. ඊට අමතරව අප පුස්තකාලය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පුස්තකාලයට පිවිසීමේ පහසුකම ද ලබා ගෙන ඇත.

## Collection Development 1992-2012




මාර්ගගත දත්ත බැංකු වලට පිවිසීමේ අධික දායක ගාස්තු ජය ගැනීමේ හොඳම මාර්ගය වන්නේ පුස්තකාල එකතුවක් (**Consortium**) තුළිනි. එමනිසා පුස්තකාලාධිපතිනිය සමාන සංවිධාන සමග කුඩා පරිමාණයේ එකතුවක් ගොඩ නගා ගැනීමේ ඉඩකඩ විමසා බැලුවාය. සංවර්ධනය වන හා සංක්‍රාමික රටවල් 60 කට අධික සංඛ්‍යාවක පුස්තකාල සමග අධ්‍යාපනය, ඉගෙනීම හා පර්යේෂණ සඳහා දැනුම ලබා ගැනීමට පහසුකම් සපයන ලාභය සඳහා නොවන අන්තර්ජාතික ආයතනයක් වන පුස්තකාල සඳහා විද්‍යුත් තොරතුරු ( EIFL ) ආයතනය සමග සාකච්ඡා අරඹන ලදී. එම ආයතනය සිය සාමාජිකයන්ට එකතුන් ආරම්භ කිරීමට හා පවත්වා ගැනීමට සහාය වේ. පුස්තකාලයාධිපතිනිය ශ්‍රී ලංකාව සඳහා අඩු කරන ලද වාර්ෂික සාමාජික ගාස්තුවක් ලබා ගැනීම සඳහා EIFL ආයතනය සමග සාකච්ඡා කළාය. දැනට එහි කොන්දේසි සහ විස්තර ගැනත් එවැනි එකතුවකට සහභාගි වන පුස්තකාල සමගත් EIFL සමග සාකච්ඡා වෙමින් පවතී.

### සේවා වැඩි දියුණු කිරීම

පුස්තකාලයේ එහි මූලික අරමුණ වන පුස්තකාල සම්පත් හා සේවාවන් භාවිතා කරන්නන්ගේ අත්දැකීම් වැඩි දියුණු කිරීම සඳහා නිරන්තරයෙන්ම ප්‍රයත්න ගනී. නව සංයුක්ත පුස්තකාල කළමනාකරණ සේවා සහ EconSpace හි අත්හදා බැලීමේ පිටපත ඉතා හොඳින් ක්‍රියාත්මක වුවද අපේක්ෂා කළ ආකාරයට 2012 වසරේ දී පුස්තකාලයට ඒවා සම්පූර්ණයෙන්ම යොදා ගැනීමට නොහැකි විය. මීට ප්‍රධාන හේතුව වන්නේ ඉහතින් සඳහන් කළ ආකාරයට පුස්තකාලයේ පාලනයෙන් තොර කාරණයක් වූ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නොලැබීමය.

පර්යේෂකයන් පුස්තකාලයේ සම්පත් හා සේවා සමග තව දුරටත් සම්බන්ධ කිරීමේ අදහසින් ඔවුන් පුස්තකාලයෙන් සපයන සේවා යොදා ගන්නේ ද, එසේ නොකරන්නේ නම් ඒ ඇයි යන්න ගැන අභ්‍යන්තර කාර්ය මණ්ඩලය අතර සමීක්ෂණයක් ද පවත්වන ලදී. එම සමීක්ෂණයට ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබුණ අතර සේවා පුළුල් කිරීම සඳහා සහ පුස්තකාල අන්තර් ජාලය ගැන වැදගත් යෝජනා ද ඉදිරිපත් විය. සමීක්ෂණය අවසන් වූ වහාම පුස්තකාලයේ පවතින තොරතු-රු සන්නිවේදන තාක්ෂණ සීමාවන් තුළ ක්‍රියාත්මක කළ හැකි යෝජනා සියල්ල ක්‍රියාවට නැගිණ. තොරතුරු තාක්ෂණ පද්ධතිය නිම වූ වහාම ඉතිරි යෝජනා ද ක්‍රියාවට නැගීමට හැකි වනු ඇත.

පුස්තකාලය 2012 දී පිවිසීම, බෙදා හැරීම සහ බාහිරව භාවිතා කිරීමේ ප්‍රතිපත්ති සංශෝධනය කෙළේය. පිවිසීම හා බෙදා හැරීම සංශෝධනය කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ ආයතනයේ ප්‍රගමනය සඳහා ගුණාත්මක තොරතුරු මූලාශ්‍ර සහ සේවාවන් ලබා දීම සහ අභ්‍යන්තරව භාවිතා කරන්නන් සියලු දෙනාට නිවැරදි හා වගවීමෙන් යුත් සේවයක් ලබා දීම සහ සාධාරණ සහ යුක්ති සහගත පිවිසීමක් සහතික කිරීමය. බාහිරව භාවිතා කිරීමේ ප්‍රතිපත්තිය සංශෝධනය කෙළේ බාහිර පුද්ගලයන්ගෙන් පුස්තකාලය භාවිතා කිරීම සඳහා වැඩිව ඇති ඉල්ලුම නිසා සහ පුස්තකාලය ආයතනයට ආදායම් ඉපිදවීමේ මාර්ගයක් බවට පත් කිරීමටය.

2012 වසරේ දී ඊ මේල් සහ දුරකතන වලින් තොරතුරු ලබා ගැනීමට අමතරව ජාතික හා අන්තර්ජාතික වෘත්තීය වේදීන් සහ ශිෂ්‍යයින් සැලකිය යුතු සංඛ්‍යාවක් පුස්තකාලයට පැමිණ එහි සේවා ලබා ගත්හ.

### පුස්තකාල ජාල ගතකිරීම සහ සහයෝගිතාවය

ශ්‍රී ලංකාවේ ආර්ථික සහ බැංකු ජාලය (eBankaNet) ශ්‍රී ලංකා විද්‍යා සහ තාක්ෂණ තොරතුරු ජාලය (SLSTINET) සහ පර්යේෂණ තොරතුරු වැඩි දියුණු කිරීම සඳහා වූ වැඩ

සටහන (PERI) වැනි ජාතික සහ ජත්‍යන්තර ජාලයන් හි උනන්දුවෙන් සහභාගිවන අතර පුස්තකාලය සෞඛ්‍ය ලේඛන පුස්තකාල සහ තොරතුරු සේවාවන් (HELLIS) සහ කෘෂිකාර්මික තොරතුරු ජාලය සමග සම්පත් හුවමාරු කර ගැනීම වැඩි දියුණු කිරීම සඳහා සාමාජිකත්වය ලබා ගැනීමේ හැකියාව ගැන විමර්ශනය කරමින් සිටී. මේ අවස්ථාවේ සාමාජිකත්වය සඳහා අයැදුම් පත්‍රය සකසමින් සිටී.

පුස්තකාලය 2012 වසරේ දී ක්‍රියාකාරකම් දෙකක් සංවිධානය කෙළේය. ජුලි මස 12 වැනි දින '' පුස්තකාල පර්යේෂණ පැවැතිවීම'' පිළිබඳ වැඩ මුළුවක් විධායක විවේකාගාරයේ දී පැවැත් වූ අතර සම්පත් දායිකාව වූයේ එක්සත් ජනපදයේ ලීඩ්ස් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය ස්ටෙලා වොල්ෂ් ය. විවිධ ආයතන වල පුස්තකාලයාධිපතීන් 25 දෙනෙකු වැඩ මුළුවට සහභාගි වූහ. පුස්තකාලයේ ජාල ගතකිරීම හා සහයෝගිතා ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීමේ අරමුණෙන් සංවිධානය කළ බාහිර දේශන වලට සහභාගි වූ පුස්තකාලයාධිපතීන්ගෙන් මෙවැනි ක්‍රියාකාරකම් නිතිපතා පැවැත්වීමට ඉල්ලීම් ලැබිණ.

පුස්තකාලයෙන් මාලේ විශ්ව විද්‍යාලයේ පුස්තකාලය සහ තොරතුරු (LIS ) අංශයේ සංචාරක ශිෂ්‍යයන් සඳහා ඉදිරිපත් කිරීමක් සංවිධානය කෙරිණ. ශිෂ්‍යයන් 10 දෙනකු, කතිකාචාර්ය වරයෙකු, විශ්ව විද්‍යාලයේ පුස්තකාලායාධිපති සහ මාලේ පුස්තකාල සංගම් මණ්ඩලයේ සාමාජිකයන් කීප දෙනෙකු අයත් වූ කණ්ඩායම 2012 ජුනි 12 දින අප ආයතනයට පැමිණියහ. ඔවුන්ට පුස්තකාලයේ වැඩ කටයුතු හඳුන්වාදීමට අමතරව පුස්තකාලයාධිපතිනිය පුස්තකාල සංගම් අන්තර්ජාතික ෆෙඩරේෂණයේ (IFLA) ක්‍රියාකාරකම් සහ එහි ප්‍රබල පුස්තකාල සංගම් හා ආයතන ගොඩ නැගීම (BSLA) පිළිබඳව ඉදිරිපත් කිරීමක් කළාය. ඔවුහු පැමිණීමෙන් පසු එවැනි ඉදිරිපත් කිරීමකට ඇයට ආරාධනය කළහ. මෙම ක්‍රියාකාරකමට අනුග්‍රහය දැක් වූයේ පුස්කතාල සංගම් අන්තර්ජාතික ෆෙඩරේෂණයේ BSLA වැඩ සටහන යටතේය.

## පුස්තකාල කොමිටිය

පුස්තකාල කොමිටිය සමස්ත පුස්තකාල ප්‍රතිපත්තිය සකස් කිරීමේ දී සහ ආයතනයේ පුස්තකාලය වැඩි දුරටත් සංවර්ධනය කිරීමේ දී පුළුල් මගපෙන්වීම් නිර්ණය කිරීමේ දී උපදේශක භූමිකාවක් ඉටු කරයි. මෙම කොමිටිය අලුත් පොත් පත් ලබා ගැනීමට ඇති ඉල්ලීම් යොමු කළ යුතු කාර්යක්ෂම මාර්ග පෙන්වා දෙන අතර පර්යේෂකයන්ගේ මූලික අවශ්‍යතා ගැන පුස්තකාලයාධිපතිනිය දැනුවත් කොට ආයතනයේ සමස්ත ඉලක්ක සන්දර්භය තුළ ආයතනයේ පුස්තකාලයේ දිශානතිය පෙන්නුම් කරයි.





## මානව සම්පත්

ශීඝ්‍රයෙන් වෙනස් වන සන්නිවේදන හා තාක්ෂණ වාතාවරණයක සේවාවන් සහ ක්‍රියාකාරකම් පවත්වා ගැනීමට දැනුවත්, ඉතා උසස් නිපුනත්වයකින් යුත්, පුහුණු සහ කැපවීමෙන් යුත් ප්‍රමාණවත් සංඛ්‍යාවකින් යුත් කාර්ය මණ්ඩලයක් අත්‍යාවශ්‍යය. සහකාර පුස්තකාලයාධිපතිනිය ලෙස වසර 8 ක සේවා කාලයකින් පසුව චාමරි යාපා මෙනෙවිය 2012 දී ආයතනයෙන් ඉවත් වූවාය. ප්‍රතිපත්ති අධ්‍යයන අයතනයේ පුස්තකාලය සහ තොරතුරු සේවාවන් සංවර්ධනය කිරීමේ දී යාපාගේ දායකත්වය අප ආයතනය ඉතා ඉහළින් අගය කරයි.

ගයානි බෙන්තොටගේ මෙනෙවිය 2012 ජුනි මාසයේ සිට සහකාර පුස්තකාලයාධිපති තනතුරට උසස් කරනු ලැබුවාය.

සේවාවන් කෙරේ නැඹුරු වූ ප්‍රධාන වෙනස්වීම් ගණනාවක් සිදු වෙමින් පැවතිය ද පුස්තකාලය දැනට ක්‍රියාත්මක වන්නේ පුස්තකාලයාධිපතිනිය සහ සහකාර පුස්තකාලයාධිපතීන් දෙදෙනෙකු යටතේය.

ගයානි බෙන්තොටගේ මෙනෙවිය 2012

පෙබරවාරියේ සිට ජුලි දක්වා ආයතනයේ පර්යේෂණ සහ සහාය කාර්ය මණ්ඩලය සඳහා පැවති '' ඉදිරිපත් කිරීමේ කුසලතා පුහුණු වැඩ සටහන'' ට සහභාගි වූවාය.

**ඉදිරි වසර සඳහා ප්‍රමුඛතා**

ඉහතින් සඳහන් කරන ලද හේතු නිසා 2011 වසරේ වාර්ෂික වාර්තාවෙන් පුස්තකාලයට නියම කර ගත් ඉලක්ක එම වසර තුළ සපුරා ගැනීමට නොහැකි වූ නිසා ඉදිරි වසරේ 2013 ඉලක්ක වන්නේ ද ඒවාමය.

## ඉලක්ක

1. පිවිසීම: ආකෘති හා ස්ථානය නොසලකා තොරතුරු මූලාශ්‍ර ලබා ගැනීම හා ඒවාට පිවිසීම පහසු කිරීමෙන් ආයතනයේ පර්යේෂණ ප්‍රගමනයට.

ක්‍රියාකාරකම: ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මුල් පිටුවේ (Home Page) පුස්තකාල අන්තර් ජාල පහසුකම් ලබා දීම. (එමගින් අප කාර්ය මණ්ඩලයට ලෝකයේ කොතැනක සිට හෝ අපගේ පුස්තකාලයට පිවිසීම හා එහි විශේෂඥ සේවා ලබා ගැනීමට හැකිවීම,) තොරතුරු සාක්ෂරතා වැඩ සටහනක් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

2. සම්පත්: ආයතනයේ කාර්ය මණ්ඩලයට සහ රටේ අනෙකුත් පර්යේෂණ සංවිධාන වලට අනුබද්ධ වූ පර්යේෂණ ප්‍රජාවට සහාය වන ගුණාත්මක තොරතුරු මූලාශ්‍ර ලබා දීම, පවත්වා ගැනීම සහ නිෂ්පාදනය කිරීම.

ක්‍රියාකාරකම: ඕපන් සෝර්ස් මෘදුකාංග යොදා ගනිමින් ශ්‍රී ලංකා ආර්ථික සාහිත්‍යය පිළිබඳ කවුළුවක් (Portal) ගොඩ නැගීම.

3. මානව සම්පත්: පුස්තකාල සේවාවන් සහ එහි ක්‍රියාකාරකම් සඳහා උසස් නිපුනතාවයකින් යුත්, පුහුණු සහ කැපවීමෙන් යුත් ප්‍රමාණවක් සංඛ්‍යාවකින් යුත් කාර්ය මණ්ඩලයක් නිර්මාණය කිරීම.

ක්‍රියාකාරකම: නායකත්වය සහ සන්නිවේද නිපුනතා වැඩි දියුණු කිරීමට පුහුණු අවශ්‍යතා තක්සේරු කිරීම හා පුහුණු අවස්ථා සොයා ගැනීම.

4. සහයෝගිතාවය: සේවාවන් සහ සම්පත් බෙදා හදා ගැනීම වැඩි කරන අනෙකුත් පුස්තකාල සහ සංවිධාන සමග සහයෝගිතාවය ගොඩ නගා ගැනිම හා හවුල් කරුවන් හඳුනා ගැනීම.

ක්‍රියාකාරකම: Library 2.0 සහ සංඛ්‍යාක පුස්තකාලය ගැන සමාන සංවිධාන වල පුස්තකාලයාධිපතීන් සඳහා පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීම.

5. නව්‍යකරණය සහ ඇගයීම: භාවිතා කරන්නන්ට සහ කාර්ය මණ්ඩලයට නව හෝ වැඩි දියුණු කළ සේවාවන් සැපයීම සඳහා උචිත ඇගයීමේ තාක්ෂණ, සංවිධාන ව්‍යුහයන් සහ තොරතුරු පැවරීමේ තාක්ෂණ යෙදීම සහ ගොඩ නගා ගැනීම,

ක්‍රියාකාරකම: Library Internet සහ වෙබ් OPAC යොදා ගැනීමට ඇති හැකියාව අධීක්ෂණය සහ අධ්‍යයනයට පද්ධතියක් (වෙබ් විශ්ලේෂණයක්) ක්‍රියාත්මක කිරීම.

## ජයග්‍රහණ

ප්‍රෙමිලා ගමගේ: එක්සත් ජනපදයේ ලීඩ්ස් විශ්ව විද්‍යාලයෙන් පුස්තකාලයාධිපතිනියට ඇගේ නිබන්ධනය සඳහා තොරතුරු කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධියක් පිරි නමන ලදී. එම නිබන්ධනය වූයේ Utilization of Tele-service in Sri Lanka' A grounded Theory Analysis දා 1000 Telecentre Programme යනුවෙනි.

ඇය පුස්තකාල සංගම් හා ආයතන වල අන්තර්ජාතික ෆෙඩරේෂණයේ (IFLA) ආසියා සහ ඕෂනියා අංශයේ කලාපීය ස්ථාවර කොමිටියේ (RSCAO) තොරතුරු සම්බන්ධීකාරක සහ වෙබ් කර්තෘ වශයෙන් සිටී. ඇය IFLA සහ බිල් සහ මෙලින්ඩා පදනමේ ප්‍රබල පුස්තකාල ගොඩ නැගීමේ සංගමයේ (BSLA) පුහුණුකරුවෙකු වශයෙන් ද දිගටම සේවය කරයි.

2012 වසරේ දී ඇය ජාත්‍යන්තර කණ්ඩායම් සහ රැස්වීම් ගණනාවකට සහභාගි වූවාය.

තොරතුරු සහ පුස්තකාල සංගම් වල අනාගතය ගැන පැවති සමුළුව. The Hague, Netherlands, 2012 අගෝස්තු 8 - 9

ලෝක පුස්තකාල සහ තොරතුරු සමුළුව සහ 78 වැනි IFL මහා සමුළුව සහ මණ්ඩලය, හෙල්සින්කි ෆින්ලන්තය 2012 අගෝස්තු 11 සිට 17 දක්වා.

CIRN 2012 ප්‍රජා තොරතුරු විද්‍යා සමුළුව, මොනෑෂ් මධ්‍යස්ථානය, ප්‍රැටො ඉතාලිය ඔක්තෝබර් 7, 8 දින වල.

සහකාර පුස්තකාලයාධිපතිනි ගයානි බෙන්තොටගේ සහ දිල්රුක්ෂි ආරියරත්න 2012 නොවැම්බර් 22 සිට 23 දක්වා ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පැවති පුස්තකාල සහ තොරතුරු විද්‍ය පිළිබඳ ජාතික ආයතනයේ ( NILIS ) සමුළුවට සහභාගි වූහ.




*Dr. Premila Gamage, IPS Librarian, at the IFLA World Library Information Congress 2012, Helsinki, Finland, 11- 17th August 2012.*



*Dr. Premila Gamage, IPS Librarian, at the CIRN 2012 Community Informatics Conference, Monash Centre, Prato, Italy, 7- 9th October 2012.*

# RESEARCH STAFF



**Dushni Weerakoon**, *BSc (QUB), MA, PhD (Manchester)*
Deputy Director and
Fellow/Head,
Macroeconomic Policy Unit



**Nisha Arunatilake**, BSc (Univ. of South USA), MA, PhD (Duke)
Research Fellow/Head,
Labour, Employment and Human Resources Development Unit



**Malathy Knight**, BA (Swarthmore), MA (Colombo), PhD (Manchester)
Research Fellow/Head,
Industry and Enterprise Development Policy Unit



**Parakrama Samaratunga**, BSc (Peradeniya),
MSc (Univ. of Philippines), PhD (La Trobe)
Research Fellow/Head, Agricultural Economic Policy Unit



**Athula Senaratne**, BSc, MPhil (Peradeniya),
PhD (Deakin)
Research Fellow/ Head, Environmental Economic Policy Unit



**Janaka Wijayasiri**, BA (Sussex), MA (The Hague), PhD Candidate (Monash)
Research Economist/Head,
International Economics Policy Unit



**Ganga Tilakaratna**, BA (Manchester), MPhil (Cantab), PhD (Manchester)
Research Economist/Head, Poverty and Social Welfare Unit



**G.D. Dayaratne**, BA (Peradeniya)
Manager, Health Policy Programme



**Anushka Wijesinha**, BSc (University College London), MA (Leeds)
Research Economist



**Priyanka Jayawardena**, BSc (Colombo),
MA (Colombo)
Research Officer



**Ayodya Galappattige**, BSc (Peradeniya),
Msc (Peradeniya)
Research Officer



**Kanchana Wickramasinghe**, BSc (Peradeniya), MEcon (Colombo)
Research Officer



**Roshini Jayaweera**, BA (Peradeniya), MSc (NUS)
Research Officer



**Sunimalee Madurawela**, BA (Colombo),
MEcon (Colombo)
Research Officer



**Dilani Hirimuthugodage**, BA (Colombo),
MEcon (Colombo)
Research Officer



**Samanthi Bandara**, BA (Colombo),
MSc (Chulalongkorn)
Research Officer



**Ashani Abayasekara**, BA (Peradeniya)
Research Assistant



**Chandana Karunaratne**, BA (Virginia),
MA (Sydney), MA (Western Sydney)
Research Assistant



**Buddhika Brahmanage**, BA (Peradeniya)
Research Assistant

## Senior Visiting Fellows



**Wimal Hettiaratchchi**, BA (Ceylon), DPhil (Oxon)
Senior Visiting Fellow



**S. A. Karunaratne**, BA (Ceylon), MA (Warwick), MA (Boston)
Senior Visiting Fellow



**Wimal Nanayakkara**, BSc (Peradeniya)
Senior Visiting Fellow

## PROJECT INTERNS

**Kaushlya Attygalle** (*University of Colombo*)

**Nipuni Perera** (*University of Colombo*)

**Chamila Paranaliyanage** (*Monash University, Australia*)

**Hiruni Alwishewa** (*Macquarie University, Australia*)

**Harshanee Jayasekera** (*University of Colombo*)

**Suseth S. Weerasoriya** (*University of Manitoba, Canada*)

**W.V.K.T. Kawshalya** (University of Peradeniya)

## Finance and Administration



**Jayani Ladduwahetty**
Director Finance & Administration



**G.L.B. Pooliyadda**
Administrative Officer



**K.A.R.T. Wijekoon**
Maintenance Officer



**Ranushi Jayatilaka**
Accountant



**Deepika Nawavickrama**
Administrative Assistant



**Jeevani Herath**
Accounts Trainee



**Nirmala Meegama**
Secretary



**Sharmini De Silva**
Secretary



**Nilanthi Alahakoon**
Secretary



**Anjalee Komangoda**
Receptionist

## Publications and Communications Unit



**Charmaine Wijesinghe**
Head of Publications and Communications



**Amesh Thennakoon**
Publication Officer



**D.D.M. Waidyasekera**
Editor



**Appekka Fernando**
Editor



**Asuntha Paul**
Secretary



**Nayomi Jayakody**
Secretary

## Library



**Premila Gamage**, BA (*Peradeniya*), MLS (*Colombo*), Dip. Lib. & Doc. Sci. (*Kelaniya*), Dip. Writership and Comm. (*Sri J'pura*), PhD (*Leeds Metropolitan*)
Librarian



**Dilrukshi Ariyaratne**, BA (*Kelaniya*)
Assistant Librarian



**Chamari Yapa**, BA (*Kelaniya*)
Library Assistant



**Gayani Bentotage**
Library Assistant

## Information Systems Unit



**Nandaka Pothuwewa**
Head of Information Systems



**Mohammed Mufaris**
Data Base Manager



**Nalaka Liyanapathirana**
Web Manager



**Roshan Kaluarachchi**
Web Developer cum Network Assistant

## Other Support Staff



**A. G. Amarasena**
Office Aide



**G. Dharmasiri**
Driver



**P. U. K. Rajasiri**
Driver/ Office Aide



**G.R. Wickremasena**
Driver/Office Aide



**H. S. Udayakantha**
Driver/Office Aide

# ආයතනයේ පැවති සම්මන්ත්‍රණ

| Topic | Speaker | Date |
| --- | --- | --- |
| සංවර්ධනයේ ආර්ථිකය | එච් ඇන් තේනුවර සහාය මහාචාර්ය, අයෝවා විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ හිටපු සහකාර අධිපති | 3 January |
| ආතතික සිදුවීම් සහ පිළිකා ඇතිවීම: චීන සංස්කෘතික විප්ලවයේ සාක්ෂි | තිලක් අබේසිංහ, සිංගප්පූරුවේ ජාතික විශ්ව විද්‍යාලයේ ආර්ථික දෙපාර්තමේන්තුව සහ ජී සෞඛ්‍ය එකතුව. ( ඉලිනොා විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවේ ආචාර්ය ජියින්ග් ශු සමග ලියන ලද පත්‍රිකාවක් පදනම්ව. | 24 January |
| මවු රටේ ආදායමට දායක වන්නේ උසස් නිපුනතා ඇති සංක්‍රමණිකයන් පමණ ද? දකුණු ආසියාවේ සාක්ෂි | ඔස්ට්‍රේලියාවේ වොලොන්ගොන්ග් විශ්ව විද්‍යාලයේ ආර්ථික පාසලේ ජ්‍යෂ්ඨ කතිකාචාර්ය අරුෂා කුරේ | 27 January |
| කොරියාවේ සංවර්ධන ආකෘතිය සහ ශ්‍රී ලංකාවට එහි අදාලත්වය | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස් ගාමිණී විජේසිංහ | 16 February |
| දකුණු ආසියාවේ යුක්තිය හා මානව සංවර්ධනය | ලෝක බැංකුවේ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ ජොන් නිව්මන් සහ ලෝක බැංකුවේ දකුණු ආසියා කලාපයේ ප්‍රධාන ආර්ථික විද්‍යාඥ කල්පනා කොචාර් මෙනෙවිය. ආයතනයේ සම්මන්ත්‍රණ ශාලවේ දී | 01 March |
| ශ්‍රී ලංකාව සාම ලාභාංශ වල සිට චිරස්ථායී වර්ධනය වේගවත්වීම | ලෝක බැංකුවේ දකුණු ආසියානු කලාපයේ ශ්‍රී ලංකා සහ මාලදිවයින නේවාසික ප්‍රධාන ආර්ථික විද්‍යාඥ ෆ්‍රැන්සිස් රෝව්. ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී | 12 March |
| වෙළඳ ප්‍රතිශෝධන කර්මාන්ත, වැටුප් ව්‍යුහය සහ විචල්‍යතාවය කෙරේ ඇති බලපෑම: ශ්‍රී ලංකාවේ ආදර්ශය. | කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා කතිකාචර්ය ප්‍රියන්ග දුණුසිංහ. | 23 April |
| පාලනය කළ සංක්‍රමණය: නැවත ඇතුළත් කර ගැනීමේ ගිවිසුම්: ශ්‍රී ලංකා සිද්ධි අධ්‍යයනයක් | ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සහකාර පර්යේෂක චන්දන කරුණාරත්න සහ අශාණි අබේසේකර | 29 June |
| ඉදිරිපත් කිරීමේ නිපුණතා අවසන් සැසිය: IPS කාර්ය මණ්ඩලය | වෘත්තීය පුහුණුකරු දනන්ජය හෙට්ටිආරච්චි | 24 July |
| ගෝලීය නිෂ්පාදන බෙදා හදා ගැනීම සමග වර්ධනය: මැලේසියාවේ පීනැංග් අපනයන කේන්ද්‍රයේ කතාව | ඔස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ක්‍රොෆෝඩ් පාසලේ ආර්ථික දෙපාර්තමේන්තුවේ අර්න්ඩ්ට් කෝර්ඩන් ආර්ථික විද්‍යා මහාචාර්ය ප්‍රේමචන්ද්‍ර අතුකෝරළ | 7 August |
| මතුවෙමින් පවතින ආර්ථික අභියෝග පිළිබඳ ගෝලීය දැක්මක් | ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී සී IMF ආයතනයේ අධ්‍යක්ෂිකා ෂාර්මිනි කුරේ. | 17 August |
| ශ්‍රී ලංකාවේ හෝටල් අංශයේ පාරිසරික කළමනාකරණ භාවිතාවන් | IPS පර්යේෂණ නිලධාරිනි කාංචනා වික්‍රමසිංහ | 26 September |
| ශ්‍රී ලංකාවේ කෘෂිකර්මයේ සහ ආහාර සුරක්ෂිත භාවය කෙරේ සංක්‍රමණයේ සහ ප්‍රේෂණ බලපෑම | IPS පර්යේෂණ නිලධාරිනි රොෂිනි ජයවීර | 18 October |
| ආර්ථික වර්ධනයට බැඳී ඇති සීමා: කුඩා දිවයින් රාජ්‍යයන් ගැන විශේෂයෙන් | ලෝක බැංකුවේ හිටපු ආර්ථික විද්‍යාඥ හිලේරියන් කොඩිප්පිලි | 20 November |
| දකුණ දකුණ වෙළඳාම: ප්‍රවනතාෟ රටා සහ ප්‍රතිපත්ති සම්බන්ධතා | ඔස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා මහාචාර්ය | 17 December |

# IPS ප්‍රකාශන

## January

### Microinsurance in Sri Lanka: Combating Multiple and Overlapping Vulnerabilities

Ayodya Galappattige, Roshini Jayaweera and Ganga Tilakaratna



දුප්පතුන්ට ක්ෂුද්‍ර මූල්‍ය හරහා මූල්‍ය සේවාවන් ( ණය සහ ඉතිරුම් ) ලබා දීම ස්ථාපිත සංකල්පයක් වුවද ක්ෂුද්‍ර රක්ෂණය මගින් රක්ෂණය ලබා දීම සාපේක්ෂ වශයෙන් අලුත් ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ක්ෂුද්‍ර රක්ෂණය ලබා දෙන්නන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වලට ඒකාබද්ධවී සිටින අතර විශේෂිත වූ සේවා සපයන්නන් ගේ සංඛ්‍යාත්මකව කුඩාය. මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර රක්ෂණ වෙළඳ පොළේ මෙම කොටසේ අවශ්‍යතා හා හැසිරීම් පරික්ෂා කොට විවේචනාත්මක දැක්මක් ලබා දීමෙන් ක්ෂුද්‍ර රක්ෂණය ගැන දැනට පවතින සාහිත්‍යයේ හිඩැස පුරවාලයි. මෙය ඉල්ලුම අනුව මෙහෙයවන, අනතුරු කළමනාකරණය කෙරෙන මූල්‍ය සේවා සැලසුම් කිරීමට හා සංවර්ධනයට පදනමක් සකස් කරයි.

මෙම අධ්‍යයනය සේවාවල වෙනස්කම්, ලබා දෙන ක්‍රම හා දුප්පත් පවුල් වල අවශ්‍යතා සහ රුචි අරුචිකම් පිළිබිඹු වන ප්‍රමාණය ගැන ද විමසා බලයි. එය කාර්යාලීය පුනරීක්ෂණ, මූලික තොරතුරු ලබා දෙන්නන් සමග සම්මුඛ සාකච්ඡා හා 2008 දී පවුල් 330 ක සමීක්ෂණ හරහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේද දෙකම යොදා ගනී.

## February

### Impact of Migration and Remittances on Investment in Agriculture and Food Security in Sri Lanka

Parakrama A. Samaratunga, Roshini Jayaweera and Nethmini Perera



කුඩා ගොවීන් හෝ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් පිට රට වලට සංක්‍රමණය වීමෙන් ග්‍රාමීය කෘෂිකාර්මික නිෂ්පාදනයට මෙන්ම පරිභෝජනයට සාධනීය මෙන්ම නිෂේධනීය ආකාරයට බලපෑ හැකිය. මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මාන්ත අංශයේ සාමාජිකයන් පිට රට වලට සංක්‍රමණය වීමෙන් ගොවි පවුල් වල ආහාර සුරක්ෂිත භාවයට හා ග්‍රාමීය කෘෂිකර්මික නිෂ්පාදනයට ඇති වන බලපෑම පරික්ෂාවට ලක් කෙරේ.

පවතින ලිපි ලේඛන සමීක්ෂණයෙන් රැස්කර ගත් දත්ත විශ්ලේෂණයෙන්, මූලික තොරතුරු ලබා දෙන ප්‍රධාන අය සමග සම්මුඛ සාකච්ඡාවෙන්, වානිජ කෘෂිකර්මාන්තය, අර්ධ යැපුම් කෘෂිකර්මාන්තය හා ධීවර අංශය නියෝජනය කරන අවධානය යොමු වූ කණ්ඩායම් සාකච්ඡා මෙන්ම 2006/07 නිවාස ආදායම් හා වියදම් සමීක්ෂණයෙන් ලබා ගත් ද්විතීය දත්ත විශ්ලේෂණයෙන් සමාජයේ දුප්පත් කොටස් වල ආදායමෙන් විශාල ප්‍රමාණයක් ප්‍රේෂණ බව දක්වයි. ජන සංඛ්‍යාවේ දුප්පත්ම 10% මෙම ආදායම් ප්‍රමාණය සියයට 81 තරම් ඉහළ මට්ටමක පවතී. ඉන් පසුව මෙම අධ්‍යයනයෙන් අදාල සමාජයන්හි ආහාර සුරක්ෂිත භාවයේ සහ ගුණාත්මක භාවයේ වෙනස්වීම් අනුපාතය ගවේෂණය කරයි.

## March

### Economic and Social Development under a Market Economy Regime in Sri Lanka, Buddhadasa Hewavitharana Felicitation - Volume 2

Edited by Saman Kelegama and Dileni Gunewardena




මහාචාර්ය බුද්ධදාස හේවාපතිරණ උපහාර ප්‍රකාශනයේ දෙවන වෙළුම ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන සංවර්ධන ක්‍රියාවලියේ වර්තමාන සන්ධිස්ථානයේ පවතින වැදගත් ප්‍රතිපත්ති ගැටලු ඉදිරිපත් කරයි. දෙවන වෙළුමේ පරිච්ඡේද 24 - 40 දක්වා ඇතුළත් වන අතර ආහාර සුරක්ෂිත භාවය, සමාජ සංවර්ධනය, සෞඛ්‍ය රැකවරණය හා අධ්‍යාපනය ගවේෂණය කරයි.

දෙවන වෙළුමේ පරිච්ඡෙද වලින් මෑත දශක වල ශ්‍රී ලංකාව මුහුණ දුන් මූලික ආර්ථික හා සමාජ ප්‍රශ්න විසරණාත්මක විශ්ලේෂණයක් සමග ශ්‍රී ලංකාවේ පවතින වෙළඳ පොළ ආර්ථිකය ගැන සවිස්තරාත්මක විග්‍රහයක් ඉදිරිපත් කරයි.

### South Asia Economic Journal (Vol.13, No. 1, March 2012)




## April

### Talking Economics Digest (July – December 2011)




ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අර්ධ වාර්ෂික ප්‍රකාශනයක් වන මෙහි බ්ලොග් පිටුවේ පළ කෙරෙන ලිපි වල හා 'විශේෂාංග' ඇතුළත් වන මාස හයක එකතුවකි.

## MAY

### Managed Migration: Review of Readmission Agreements and a Case Study of Sri Lanka

Chandana Karunaratne and Ashani Abayasekara

*යුරෝපීය සංගමයේ අරමුදලින් සංක්‍රමණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය ( IOM ) සමග කළ ඒකාබද්ධ ප්‍රකාශනයකි.*




ඔස්ට්‍රේලියාව, කැනඩාව සහ එක්සත් ජනපදය ශ්‍රී ලංකික සංක්‍රමණිකයන්ගේ ජනප්‍රිය ගමනාන්තයක් වන අතර යුරෝපීය සංගමය, රුකියා අවස්ථා සොයා යන ශ්‍රී ලාංකිකයන්ගේ වැදගත් ස්ථානයක් බවට පත්වෙමින් ඇත. කෙසේ වුවත් ලේඛන ගත නොවී යුරෝපා සංගමයට පිවිසෙන ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ ඉහළ යෑමක් පවතින බවට සාක්ෂි දැකිය හැකිය. නැවත ඇතුළත් කිරීමේ ගිවිසුම් ( Readmission Agreements ) මතු වන්නේ මෙම ගැටලුව විසඳීම සඳහාය.

ආපසු ඇතුළත් කිරීමේ ගිවිසුම් වලින් පුද්ගලයන් රටවල් දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර ආපසු පැමිණීම සහ නැවත ඇතුළත් කර ගැනීම නියාමනය කරයි. මේවා වඩාත් වැඩි වශයෙන් යොදා ගන්නේ යුරෝපා සංගමයෙනි. නීති විරෝධී සංක්‍රමණිකයන් ආපසු ඔවුන්ගේ මව රටට එවීම ලොව පුරා රටවල භාවිතා කෙරෙන පුද්ගලයන් ආපසු යැවීමේ සාමාන්‍ය කරුණක් වුවද '' නැවත ඇතුළත් කර ගැනීමේ ගිවිසුම්'' යුරෝපා සංගමයට සුවිශේෂී යෙදුමකි. ආපසු ඇතුළත් කිරීමේ ගිවිසුමකින් රාජ්‍යයක් ( ඉල්ලීම කරන රාජ්‍යය) තුළ සිටින නීති විරෝධී සංක්‍රමණිකයන් ඔවුන්ගේ මවු රටට හෝ ඔවුන් දැනට සිටින රටට ( ඉල්ලීම යොමු වන රාජ්‍යය) පැමිණි රටට ආපසු යැවීමේ ක්‍රියා පටිපාටි ගැන පිළිබඳ වූ ගිවිසුමකි. මෙම ගිවිසුම් වල මූලික කාර්ය වන්නේ රාජ්‍යයක් තුළ ජීවත් වීමට අවසරයක් නැති පුරවැසියන් නොවන පුද්ගලයන් ඔවුන්ගේ උපන් රටට ආපසු යැවීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමකි.

## JUNE

### Sri Lanka National Health Accounts 2005 – 2009




මෙම ප්‍රකාශන මාලාවේ සිව් වැන්න වූ මෙම වාර්තාව 2005 - 2009 කාල පරිච්ඡේදයේ ජාතික සෞඛ්‍ය ගිණුම් පිළිබඳව ගණනය කරයි.

ජාතික සෞඛ්‍ය ගිණුම් වලින් ජාතික සෞඛ්‍ය පද්ධතියට අරමුදල් ගලා යන ආකාරයත් වියදම් දිශානතීන් හා කැමන කටයුතු සඳහා ද යන්නත් විස්තර කරයි. සෞඛ්‍ය ගිණුම් රාමුවේ සීමාවන් ගැබ්ව ඇත්තේ සෞඛ්‍ය පද්ධති සංකල්පය තුළය. සෞඛ්‍ය නිමැවුම් හා සේවාවන් ජන සංඛ්‍යාවේ සෞඛ්‍ය ප්‍රතිඵල හා සෞඛ්‍ය තත්වයට බලපෑමක් කරන ලක්ෂණ වලට සාපේක්ෂකව සලකා බලයි. හරය වශයෙන් සෞඛ්‍ය ගිණුම් රාමුවක් යනු තීරණාත්මක භූමිකාවක් වන සෞඛ්‍යයේ නිර්ණායක වන පුළුල් ආකෘතියක කොටසකි.

## JULY

### Foreign Aid in South Asia – The Emerging Scenario

Edited by: Saman Kelegama




මෙම කෘතියෙන් විදේශීය ආධාර සම්බන්ධයෙන් එක් එක් දකුණු ආසියානු රටවල අත්දැකීම් පිළිබඳව අධ්‍යයනය කරයි. පසුගිය දශකයන් තුළ සංවර්ධන උපකරණයක් ලෙස විදේශීය ආධාර වල සාර්ථකත්වය මිශ්‍රිත බව මෙන්ම ආධාරවල හිමිකාරිත්වය, සුසංගතවීම, භාවිතා කිරීම ප්‍රධාන ප්‍රවාහයට එකතු කර ගැනීම ඇති වූයේ 2005 පැරිස් ප්‍රකාශයෙන් බව මෙම කෘතියේ පරිච්ඡේද වලින් දක්වයි. මෙම කෘතියෙන් ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න, පශ්චාත් ගැටුම් සමයේ පුනරුත්ථාපනය/යළි ඉදිකිරීම යනාදී සන්දර්භයක් තුළ මෙම වර්ධනයන්, මතු වෙමින් පවතින මෙන්ම අඩුවෙන් සංවර්ධිත දකුණු ආසියානු ආර්ථිකයන් යොදා ගන්නා ආකාරය පරීක්ෂා කරයි.

මෙම කෘතිය නිශ්චිත රටක අනාගත ප්‍රතිපත්ති ප්‍රමුඛතා ඉස්මතු කෙරෙන සිද්ධි අධ්‍යයනයන් ගෙන් ආධාර හෝ අන්තර්ජාතික ආධාර නිර්මිතියේ රාමුවක සැලසුම් කිරීමේ පාඩම් ගණනාවක් ඉදිරිපත් කරයි. ඉන්දියාව, පාකිස්ථානය, බංග්ලාදේශය, ශ්‍රී ලංකාව හා නේපාලය ගැන සාකච්ඡා කිරීමට අමතරව මෙම කලාපයේ අඩුවෙන්ම ලේඛන ගතව ඇති රටවල් තුනක් වන භූතානය, මාලදිවයින හා ඇප්ගනිස්ථානය ගැන ද ප්‍රථම වරට අවධානය යොමු කරයි.

## AUGUST

### Talking Economics Digest (January – June 2012)




ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අර්ධ වාර්ෂික ප්‍රකාශනයක් වන මෙම ප්‍රකාශනය Talking Economics බ්ලොග් පිටුවේ සෑම මාස හයකම ඇතුළත් වන ලිපි හා 'විශේෂාංග' ලිපි ඇතුළත් වේ.

## SEPTEMBER

### Sri Lanka: State of the Economy 2012 Report

Theme: Keeping Sri Lanka on the Growth Expressway




ආර්ථික වර්ධනය රාජ්‍යයන්ගේ සුජාත භාවය ලබා ගැනීමේ එකම මිනුම් දණ්ඩ විය නොහැකිය. කෙසේ වුවත් වර්ධනය වැදගත්ය. ශ්‍රී ලංකාව වැනි රටවලට වසර කීපයක් තිස්සේ වේගවත් ආර්ථික වර්ධනයක් පවත්වා ගැනීමට හැකි වීමෙන් පහළ ආදායම් ලබන තත්වයේ සිට මධ්‍යම ආදායම් ලබන තත්වයට පත්වීමට හැකි විය. පසුගිය වසර වල වේගවත් සංවර්ධනයට පදනම් වූ යටිතල පහසුකම් සංවර්ධනයේ කැපී පෙනෙන වර්ධනයක් අත් කර ගැනීමට හැකි විය. කෙසේ වුවත් මෙම ප්‍රවේගය දීර්ඝ කාලීනව පවත්වා ගැනීමට නම් ශ්‍රී ලංකවේ සමස්ත සාධක ඵලදායිතාවයේ එනම් ශ්‍රමය හා ප්‍රාග්ධනය යොදා ගැනීමේ කාර්යක්ෂමතාවය ඉහළ දැමීම අවශ්‍යය. වැඩ කරන වයසේ ජන සංඛ්‍යවේ පහත වැටීමත් සමග දීර්ඝ කාලීන ඉහළ වර්ධනය තීරණාත්මක ලෙස රඳා පවත්නේ වෙනත් සාධක අතර තාක්ෂණ නව්‍යතාවය සහ නිපුණ, ඵලදායී සහ නම්‍යශීලී ශ්‍රම හමුදාවක් පැවතීම මතය.

ශ්‍රී ලංකාව පශ්චාත් ගැටුම් සමයකට පරිවර්තනය වීමේ දී ආර්ථික, දේශපාලන සහ සමාජ අපේක්ෂාවන් ස්ථිරසාර හා දේශපාලනමය වශයෙන් සුසංයෝගී වර්ධන ක්‍රියාවලියක් ඉල්ලා සිටී. ප්‍රතිපත්ති, රාජ්‍යයේ භූමිකාව, වෙළඳ පොළ තත්වය සහ නියාමන ආයතන රටේ දීර්ඝ කාලීන වර්ධන ගතිකත්වය තීරණය කරනු ඇත. මෙවැනි සන්දර්භයක දී ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ තත්වය 2012 වාර්තාවෙන් ඉදිරි වසර වල ශ්‍රී ලංකාවට චිරස්ථායී, යුක්ති සහගත වර්ධනයක් සඳහා වූ මාවතේ ඉඩ ප්‍රස්ථා රාශියත් සහ අභියෝගත් පරික්ෂා කරයි.

### South Asia Economic Journal (Vol.13, No. 2, September 2012)




## DECEMBER

### Fostering Innovation to Fast-forward Growth in Sri Lanka

Anushka Wijesinha and Nethmini Perera




තාක්ෂණ නව්‍යකරණය වේගයෙන් සිදු වේ. ගෝලීයකරණය වූ වෙළඳ පොළක් මතුවීමත් සමග සියලුම රටවල් වඩාත් නව්‍යකරණයවීමේ පීඩණයට මුහුණ දී සිටී. ශ්‍රී ලංකාව ද මෙම පශ්චාත් යුද සමයේ නව්‍යකරණය වීම කෙරේ දැඩි අවධානය යොමු කළ යුතුය. එවැනි සන්දර්භයක දී ශ්‍රී ලංකාවේ වර්ධනය හා තරගකාරිත්වයේ නව්‍යකරණය සඳහා වූ බලපෑම් කෙරේ මෙම ප්‍රකාශනයෙන් අවධානය යොමු කරයි. එය ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන ආයෝජන තත්වය, නිපුණ කුසලතා පිරි ශ්‍රම සංචිතයක් පැවතීම, කර්මාන්ත - පර්යේෂණ සහයෝගිතාවයේ අවශ්‍යතාවය, වානිජකරණයේ සහ නව්‍ය මූල්‍යකරණයේ අවශ්‍යතාවය සහ විදෙස්ගතව සිටින විද්‍යඥයන් ගෙන්වා ගැනීම වැනි කරුණු ගැන සාකච්ඡා කරයි. මෙම පත්‍රිකාව නව්‍යකරණ ප්‍රතිපත්තිය සමස්ත වූ ආකාරයෙන් සැලකිල්ලට ගත යුතු බව පෙන්වා දෙන අතර ජාතික උපාය මාර්ගික තලයේ න්‍යාය පත්‍රයක් සඳහා බලපෑම් කිරීමට ප්‍රබල ජාතික නව්‍යකරණ මණ්ඩලයක අවශ්‍යතාවය පෙන්වා දේ.

# ප්‍රතිපත්ති සංවාදයක් පෝෂණය කිරීම

## ආචාර්ය සමන් කැලේගම, විධායක අධ්‍යක්ෂක

CUTS හා SAWTEE ආසියා පදනම හා පොදුරාජ්‍ය මණ්ඩලයේ මහලේකම් කාර්යාලය විසින් සංවිධානය කොට නේපාලයේ කාත්මණ්ඩු හි පෙබරවාරි 3 -4 දින වල ''දකුණු ආසියාවේ පාරිභෝගිකයන්ට සහයෝගිතාවයක් නොමැතිවීමේ පිරිවැය'' පිළිබඳව පැවති සම්මන්ත්‍රණයේ දී '' දකුණු ආසියාවේ වෙළඳාම ලිහිල්කරණය හා පාරිභෝගික සුභ සාධනය'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

UN - ESCAP, ආසියානු සංවර්ධන බැංකුව සහ UNDP '' ආසියා - පැසිපික් සහශ්‍රක සංවර්ධන වාර්තාව 2011 - 2012: සෞඛ්‍ය හා පෝෂණ හිඩැස පියවීම'' එළිදැක්වීමේ දී ඉන්දියාවේ නව දිල්ලි නගරයේ පෙබරවාරි 17 - 18 '' දකුණු ආසියාවේ සහශ්‍රක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම වේගවත් කිරීම'' යටතේ පැවති ඉහළ මට්ටමේ කලාපීය මට්ටමේ සම්මන්ත්‍රණයේ දී '' සහශ්‍රක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සහ අවස්ථා'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

විද්‍යාව, තාක්ෂණය හා ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වූ කේන්ද්‍රය (CSTEP) විසින් දකුණු ආසියාවේ ප්‍රදාන ලබන්නන් සඳහා ඉන්දියවේ මයිසෝර් හි මාර්තු 4 - 6 දින වල සංවිධානය කළ IDRC TTI 16 වැනි කලාපීය රැස්වීමේ දී '' මානව සම්පත් සීමාවන් සහ බුද්ධි සංචිත සඳහා ඉදිරි මාර්ගය'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුවට කොළඹ SLFEB ශ්‍රවනාගාරයේ දී මාර්තු 15 දින ''නව වෙළඳ පොළ සඳහා සමීක්ෂණය කිරීම සහ නව වෙළඳ පොළට ඇතුළුවීම'' පිළිබඳව ඉදිරිපත් කිරීමක්.

වානිජ කටයුතු පිළිබඳ දෙපාර්තමෙන්තුව සහ එ. රා. පොදුරාජ්‍ය මණ්ඩල මහ ලේකම් කාර්යාලය සංවිධානය කළ මාර්තු 26 EDB ශ්‍රවනාගාරයේ පැවති 'යුරෝපා සංගම් වෙළඳ ප්‍රතිපත්තිය හා ශ්‍රී ලංකාවේ ඉදිරි මග' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී ''ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම, අභියෝග සහ අවස්ථා'' මැයෙන් ඉදිරිපත් කිරීමක්.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ UNIC ඒකාබද්ධව සංවිධානය කළ ආසියා පැසිපික් කලාපයේ 2012 ආර්ථික හා සමාජ සමීක්ෂණය මැයි මස 10 වැනි දින ෂෆී ශ්‍රවනාගාරයේ දී එළිදැක්වීමේ දී 'ශ්‍රී ලංකාවේ චිරස්ථායී වර්ධනය සඳහා ඇති අභියෝග '' මැයෙන් ඉදිරිපත් කිරීමක්.

විදේශ සේවා නියුක්ති සහ සුභ සාධන අමාත්‍යාංශය සහ අන්තර්ජාතික කම්කරු සංවිධානය '' ශ්‍රී ලංකාවේ සංක්‍රමණික කම්කරුවන්ට වඩාත් හොඳින් සැලකීම'' පිළිබඳව ජෝර්දානයේ අම්මාන් හි ලේ මැරිඩියන් හෝටලයේ පැවති සංක්‍රමණික කම්කරුවන්ගේ සුභ සාධනය සහ ආරක්ෂාව පිළිබඳ කලාපීය උපදේශනයේ දී '' ශ්‍රී ලංකාවේ ආර්ථික අපේක්ෂා සහ විදේශ සේවා නියුක්තියේ වැදගත්කම'' මැයෙන් ඉදිරිපත් කිරීමක්.

බංග්ලාදේශයේ ඩැකා නගරයේ මැයි 28 දින '' දකුණු ආසියාවේ කෘෂිකාර්මික වෙළඳමේ කලාපීය විභවයන්'' පිළිබඳව ආසියානු බැංකුව, පොදුරාජ්‍ය මණ්ඩල මහ ලේකම් කාර්යාලය, UNDP සහ SANEM, ඊශාන කේන්ද්‍රය සංවිධානය කළ කලාපීය උපදේශනයේ දී ''දකුණු ආසියානු කලාපීය අනුකලනය. ඉදිරිමග'' හා '' දකුණු ආසියානු කලාපයේ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම්. අන්ද්කිම් හුවමාරු කර ගැනීම'' යන ඉදිරිපත් කිරීම් සහ කලාපීය සහයෝගිතා විභවයන් පිළිබඳ කර්මාන්තයේ ප්‍රතිපෝෂණය'' සැසියේ මුලසුන.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ( SLECIC ) විසින් ජුලි 21 හබරණ සිනමන් ලොජ් හි සංවිධානය කළ බර්න් සංගමයේ ප්‍රධාන විධායකයන්ගේ 5 වැනි කලාපීය කණ්ඩායමේ රැස්වීමේ දී '' මැද පෙරදිග අර්බුදය සහ එහි ගෝලීය බලපෑම'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

UNESCAP දකුණු සහ නිරිත දිග ආසියානු කාර්යාලය විසින් ඉන්දියාවේ දිල්ලි හි සංවිධානය කළ දකුණු සහ නිරිත දිග ආසියාවේ '' ඇතුළත් කර ගත් සංවර්ධනය හා කලාපීය සහයෝගිතාවය පිළිබඳ විශේෂඥ කණ්ඩායම් රැස්වීමේ'' දී ''කලාපීය ආර්ථික අනුකලනය සහ සම්බන්ධීතාවය' යනුවෙන් ඉදිරිපත් කිරීමක් සහ ආහාර සුරක්ෂිත භාවය සහ කෘෂිකර්මාන්තය සැසියේ මුලසුන.

ඉන්දියානු කර්මාන්ත සම්මේලනය සහ ලංකා වානිජ මණ්ඩලය අගොස්තු 3 බණ්ඩාරනායක ජාත්‍යන්තර සමුළු ශාලාවේ සංවිධානය කළ '' ඉන්දු ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආයෝජන වසර පහක් ඇතුළත දෙගුණ කිරීම'' පිළිබඳ සමුළුවේ දී '' ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර වෙළඳාම සහ ආයෝජනය'' ගැන ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 3 - 4 ඉන්දියාවේ චෙන්නායි හි ලේ මැරිඩියන් හෝටලයේ පැවති දකුණු ආසියාවේ සම් සහ සම් භාණ්ඩ පිළිබඳ තරගකාරිත්වය ශක්තිමත් කිරීමේ උපදේශනයේ දී '' දකුණු ආසියානු කලාපීය අනුකලනය, බලපෑම සහ ප්‍රතිපත්ති සීමාවන්' යනුවෙන් ඉදිරිපත් කිරීමක් සහ '' කලාපීය සංගමයක භූමිකාව'' සැසියේ මුලසුන දැරීම.

පාකිස්ථානයේ ඉස්ලාමාබාද් හි මැරියට් හෝටලයේ දී සැප්තැම්බර් 11 - 13 දක්වා '' දකුණු ආසියාවේ වර්ධනය ඇතුළත් කර ගැනීම සහ චිරස්ථායී කිරීම'' තේමාව යටතේ පැවති 5 වැනි ආර්ථික නායක හමුවේ දී '' දකුණු ආසියාවේ විදේශ ආධාරඃ මතුවෙමින් පවතින දර්ශනය'' පොත එළිදැක්වීම සහ ''නව දකුණු ආසියාවක් සඳහා න්‍යාය පත්‍රයක්'' පිළිබඳ පූර්ණ සැසිය හා ''දකුණු ආසියාවේ කලාපීය වෙළඳ ගිවිසුම්ඃ වර්තමාන තත්වය සහ ඉදිරි මග' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 24 සහ FICCI ඉන්දියාවේ දිල්ලි හි ක්ලැරිජස් හෝටලයේ දකුණු ආසියානු වෙළඳ පොළ ආර්ථික අභියෝග'' පිළිබඳව සංවිධානය කළ සම්මන්ත්‍රණයේ දී ''ශ්‍රී ලංකාවේ වෙළඳ පොළ ආර්ථික අභියෝග'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

ඔක්තෝබර් 15 වැනි දින DFCC අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ දී DFCC ප්‍රධාන විධායකයන් සඳහා '' 2013 ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ වර්ධන අපේක්ෂා'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 18 සහ 19 ඉන්දියාවේ ලේ මැරිඩියන් හෝටලයේ දී UNESCAP- SSWA උප කලාපීය කාර්යාලය සංවිධානය කළ දකුණු සහ නිරිත දිග ආසියාවේ කලාපීය සහයෝගිතාවය සහ ඇතුළත් කර ගන්නා සංවර්ධනය පිළිබඳ ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සංවාදයේ දී ''උප කලාපයේ සම්බන්ධීතාවය සඳහා කලාපීය සහයෝගිතාවය'' සහ ''ඇතුළත් කර ගන්නා සහ චිරස්ථායී සංවර්ධනය සඳහා කලාපීය සහයෝගිතාවය'' පිළිබඳ ඉදිරිපත් කිරීම.

ඔක්තෝබර් 27 වැනි දා කොළඹ ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා වූ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ දී අන්තර් මහාද්විපික පාර්ශ්වයේ තරුණ සභාපති සංගමයේ (YPO) දී ''ශ්‍රී ලංකා ආර්ථිකයඃ ගෝලීය කැළඹීම් තත්වයක දී ඉහළ වර්ධනයක් පවත්වා ගැනීමේ අභියෝග'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

ඔක්තෝබර් 29 ඉන්දියාවේ දිල්ලි හි ගුර්ගුවොන් ඔබරොයි හෝටලයේ පැවති ඉන්දියානු සාගර වළල්ලේ කලාපීය සහයෝගිතාව සංගමයේ 12 වැනි අමාත්‍ය සමුළුවේ දී සහ ඉන්දියන් සාගර වළල්ලේ ශාස්ත්‍රඥ සමුළුවේ දී ශ්‍රී ලංකාව නියෝජනය සහ ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 12 වැනි දින පේරාදෙණිය විශ්ව විද්‍යාල ආදි ශිෂ්‍යයන්ගේ සංගමය කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ ශ්‍රවනාගාරයේ දී සංවිධානය කළ ''2013 අයවැය'' පිළිබඳව ''2013 අයවැය විශ්ලේෂණයක්'' ඉදිරිපත් කිරීම.

# ප්‍රතිපත්ති සංවාදයක් පෝෂණය කිරීම

නොවැම්බර් 29 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවනාගාරයේ දී විශ්ව විද්‍යාල ආර්ථික විද්‍යඥයන්ගේ ශ්‍රී ලංකා මණ්ඩපයේ පළමු අන්තර්ජාතික ආර්ථික පර්යේෂණ සමුළුවේ දී ''යටිතල පහසුකම් වල රාජ්‍ය ආයෝජනයෙන් ආර්ථික සංවර්ධනය උත්තේජනය කිරීම: විෂය පථය සහ ගැටලු '' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

දෙසැම්බර් 6 වැනි දින ඊඑෂකා හි ව්‍යාපාර සහයෝගිතා කමිටුවේ 17 වැනි ඒකාබද්ධ කමිටු රැස්වීමේ දී ''ජපානය සහ ශ්‍රී ලංකාව අතර තානාපති සබඳතා 60 වැනි වසර '' වෙනුවෙන් සංවිධානය කළ ''ජපාන ශ්‍රී ලංකා ආර්ථික සබඳතා, ප්‍රවනතා සහ අවස්ථා'' යන මැයෙන් ඉදිරිපත් කිරීමක්.

CUTS හා SAWTEE ආසියා පදනම හා පොදුරාජ්‍ය මණ්ඩලයේ මහලේකම් කාර්යාලය විසින් සංවිධානය කොට නේපාලයේ කාත්මණ්ඩු හි පෙබරවාරි 3 -4 දින වල ''දකුණු ආසියාවේ පාරිභෝගිකයන්ට සහයෝගිතාවයක් නොමැතිවීමේ පිරිවැය'' පිළිබඳව පැවති සම්මන්ත්‍රණයේ දී '' දකුණු ආසියාවේ වෙළඳාම ලිහිල්කරණය හා පාරිභෝගික සුභ සාධනය'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

UN - ESCAP, ආසියානු සංවර්ධන බැංකුව සහ ඔහෘජ '' ආසියා - පැසිපික් සහශ්‍රක සංවර්ධන වාර්තාව 2011 - 2012: සෞඛ්‍ය හා පෝෂණ හිඩැස පියවීම'' එළිදැක්වීමේ දී ඉන්දියාවේ නව දිල්ලි නගරයේ පෙබරවාරි 17 - 18 '' දකුණු ආසියාවේ සහශ්‍රක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම වේගවත් කිරීම'' යටතේ පැවති ඉහළ මට්ටමේ කලාපීය මට්ටමේ සම්මන්ත්‍රණයේ දී '' සහශ්‍රක සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සහ අවස්ථා'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

විද්‍යාව, තාක්ෂණය හා ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වූ කේන්ද්‍රය (CSTEP) විසින් දකුණු ආසියාවේ ප්‍රදාන ලබන්නන් සඳහා ඉන්දියවේ මයිසෝර් හි මාර්තු 4 - 6 දින වල සංවිධානය කළ IDRC TTI 16 වැනි කලාපීය රැස්වීමේ දී '' මානව සම්පත් සීමාවන් සහ බුද්ධි සංචිත සඳහා ඉදිරි මාර්ගය'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුවට කොළඹ SLFEB ශ්‍රවනාගාරයේ දී මාර්තු 15 දින '' නව වෙළඳ පොළ සඳහා සමීක්ෂණය කිරීම සහ නව වෙළඳ පොළට ඇතුළුවීම ''පිළිබඳව ඉදිරිපත් කිරීමක්.

වානිජ කටයුතු පිළිබඳ දෙපාර්තමෙන්තුව සහ එ. රා. පොදුරාජ්‍ය මණ්ඩල මහ ලේකම් කාර්යාලය සංවිධානය කළ මාර්තු 26 ඈර් ශ්‍රවනාගාරයේ පැවති 'යුරෝපා සංගම් වෙළඳ ප්‍රතිපත්තිය හා ශ්‍රී ලංකාවේ ඉදිරි මඟ' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී '' ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම, අභියෝග සහ අවස්ථා'' මැයෙන් ඉදිරිපත් කිරීමක්.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය සහ UNIC ඒකාබද්ධව සංවිධානය කළ ආසියා පැසිපික් කලාපයේ 2012 ආර්ථික හා සමාජ සමීක්ෂණය මැයි මස 10 වැනි දින IPS ශ්‍රවනාගාරයේ දී එළිදැක්වීමේ දී 'ශ්‍රී ලංකාවේ චිරස්ථායී වර්ධනය සඳහා ඇති අභියෝග'' මැයෙන් ඉදිරිපත් කිරීමක්.

විදේශ සේවා නියුක්ති සහ සුභ සාධන අමාත්‍යාංශය සහ අන්තර්ජාතික කම්කරු සංවිධානය '' ශ්‍රී ලංකාවේ සංක්‍රමණික කම්කරුවන්ට වඩාත් හොඳින් සැලකීම'' පිළිබඳව ජෝර්දානයේ අම්මාන් හි ලේ මැරිඩියන් හෝටලයේ පැවති සංක්‍රමණික කම්කරුවන්ගේ සුභ සාධනය සහ ආරක්ෂාව පිළිබඳ කලාපීය උපදේශනයේ දී '' ශ්‍රී ලංකාවේ ආර්ථික අපේක්ෂා සහ විදේශ සේවා නියුක්තියේ වැදගත්කම'' මැයෙන් ඉදිරිපත් කිරීමක්.

බංග්ලාදේශයේ ඩැකා නගරයේ මැයි 28 දින '' දකුණු ආසියාවේ කෘෂිකාර්මික වෙළඳමේ කලාපීය විභවයන්'' පිළිබඳව ආසියානු බැංකුව, පොදුරාජ්‍ය මණ්ඩල මහ ලේකම් කාර්යාලය, ඔහෘජ සහ ''හැළුල ඊසෂ්ක කේන්ද්‍රය සංවිධානය කළ කලාපීය උපදේශනයේ දී ''දකුණු ආසියානු කලාපීය අනුකලනය. ඉදිරිමග'' හා '' දකුණු ආසියානු කලාපයේ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම්. අත්දැකීම් හුවමාරු කර ගැනීම'' යන ඉදිරිපත් කිරීම් සහ කලාපීය සහයෝගිතා විභවයන් පිළිබඳ කර්මාන්තයේ ප්‍රතිපෝෂණය'' සැසියේ මුලසුන.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව ( SLECIC ) විසින් ජුලි 21 හබරණ සිනමන් ලොජ් හි සංවිධානය කළ බර්න් සංගමයේ ප්‍රධාන විධායකයන්ගේ 5 වැනි කලාපීය කණ්ඩායමේ රැස්වීමේ දී ''මැද පෙරදිග අර්බුදය සහ එහි ගෝලීය බලපෑම'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

UNESCAP දකුණු සහ නිරිත දිග ආසියානු කාර්යාලය විසින් ඉන්දියාවේ දිල්ලි හි සංවිධානය කළ දකුණු සහ නිරිත දිග ආසියාවේ '' ඇතුළත් කර ගත් සංවර්ධනය හා කලාපීය සහයෝගිතාවය පිළිබඳ විශේෂඥ කණ්ඩායම් රැස්වීමේ'' දී ''කලාපීය ආර්ථික අනුකලනය සහ සම්බන්ධිතාවය' යනුවෙන් ඉදිරිපත් කිරීමක් සහ ආහාර සුරක්ෂිත භාවය සහ කෘෂිකර්මාන්තය සැසියේ මුලසුන.

ඉන්දියානු කර්මාන්ත සම්මේලනය සහ ලංකා වානිජ මණ්ඩලය අගොස්තු 3 බණ්ඩාරනායක ජාත්‍යන්තර සමුළු ශාලාවේ සංවිධානය කළ '' ඉන්දු ශ්‍රී ලංකා ද්විපාර්ශ්වික වෙළඳාම සහ ආයෝජන වසර පහක් ඇතුළත දෙගුණ කිරීම'' පිළිබඳ සමුළුවේ දී '' ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර වෙළඳාම සහ ආයෝජනය'' ගැන ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 3 - 4 ඉන්දියාවේ චෙන්නායි හි ලේ මැරිඩියන් හෝටලයේ පැවති දකුණු ආසියාවේ සම් සහ සම් භාණ්ඩ පිළිබඳ තරගකාරිත්වය ශක්තිමත් කිරීමේ උපදේශනයේ දී '' දකුණු ආසියානු කලාපීය අනුකලනය, බලපෑම සහ ප්‍රතිපත්ති සීමාවන්' යනුවෙන් ඉදිරිපත් කිරීමක් සහ '' කලාපීය සංගමයක භූමිකාව'' සැසියේ මුලසුන දැරීම.

පාකිස්ථානයේ ඉස්ලාමාබාද් හි මැරියට් හෝටලයේ දී සැප්තැම්බර් 11 - 13 දක්වා ''දකුණු ආසියාවේ වර්ධනය ඇතුළත් කර ගැනීම සහ චිරස්ථායී කිරීම'' තේමාව යටතේ පැවති 5 වැනි ආර්ථික නායක හමුවේ දී ''දකුණු ආසියාවේ විදේශ ආධාර: මතුවෙමින් පවතින දර්ශනය'' පොත එළිදැක්වීම සහ ''නව දකුණු ආසියාවක් සඳහා න්‍යාය පත්‍රයක්'' පිළිබඳ පූර්ණ සැසිය හා ''දකුණු ආසියාවේ කලාපීය වෙළඳ ගිවිසුම්: වර්තමාන තත්වය සහ ඉදිරි මඟ' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 24 ණී සහ ෂකකෂ ඉන්දියාවේ දිල්ලි හි ක්ලැරිජස් හෝටලයේ දකුණු ආසියානු වෙළඳ පොළ ආර්ථික අභියෝග'' පිළිබඳව සංවිධානය කළ සම්මන්ත්‍රණයේ දී ''ශ්‍රී ලංකාවේ වෙළඳ පොළ ආර්ථික අභියෝග'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

ඔක්තෝබර් 15 වැනි දින ඈඝඝ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ දී DFCC ප්‍රධාන විධායකයන් සඳහා'' 2013 ශ්‍රී ලංකාවේ ආර්ථිකය සහ වර්ධන අපේක්ෂා'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 18 සහ 19 ඉන්දියාවේ ලේ මැරිඩියන් හෝටලයේ දී UNESCAP- SSWA උප කලාපීය කාර්යාලය සංවිධානය කළ දකුණු සහ නිරිත දිග ආසියාවේ කලාපීය සහයෝගිතාවය සහ ඇතුළත් කර ගන්නා සංවර්ධනය පිළිබඳ ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සංවාදයේ දී ''උප කලාපයේ සම්බන්ධිතාවය සඳහා කලාපීය සහයෝගිතාවය'' සහ ''ඇතුළත් කර ගන්නා සහ චිරස්ථායී සංවර්ධනය සඳහා කලාපීය සහයෝගිතාවය'' පිළිබඳ ඉදිරිපත් කිරීම්.

ඔක්තෝබර් 27 වැනි දා කොළඹ ජාත්‍යන්තර සම්බන්ධතා සඳහා වූ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ දී අන්තර් මහාද්වීපික පාර්ශ්වයේ තරුණ සභාපති සංගමයේ ( YPO ) දී ''ශ්‍රී ලංකා ආර්ථිකය: ගෝලීය කැළඹීම් තත්වයක දී ඉහළ වර්ධනයක් පවත්වා ගැනීමේ අභියෝග'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

ඔක්තෝබර් 29 ඉන්දියාවේ දිල්ලි හි ගුර්ගුවොන් ඔබරොයි හෝටලයේ පැවති ඉන්දියානු සාගර වළල්ලේ කලාපීය සහයෝගිතාව සංගමයේ 12 වැනි අමාත්‍ය සමුළුවේ දී සහ ඉන්දියන් සාගර වළල්ලේ ශාස්ත්‍රඥ සමුළුවේ දී ශ්‍රී ලංකාව නියෝජනය සහ ඉදිරිපත් කිරීමක්.

# ප්‍රතිපත්ති සංවාදයක් පෝෂණය කිරීම

නොවැම්බර් 12 වැනි දින පේරාදෙණිය විශ්ව විද්‍යාල ආදී ශිෂ්‍යයන්ගේ සංගමය කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ ශ්‍රවනාගාරයේ දී සංවිධානය කළ ''2013 අයවැය'' පිළිබඳව ''2013 අයවැය විශ්ලේෂණයක්'' ඉදිරිපත් කිරීම.

නොවැම්බර් 29 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතන ශ්‍රවනාගාරයේ දී විශ්ව විද්‍යාල ආර්ථික විද්‍යඥයන්ගේ ශ්‍රී ලංකා මණ්ඩපයේ පළමු අන්තර්ජාතික ආර්ථික පර්යේෂණ සමුළුවේ දී ''යටිතල පහසුකම් වල රාජ්‍ය ආයෝජනයෙන් ආර්ථික සංවර්ධනය උත්තේජනය කිරීම: විෂය පථය සහ ගැටලු'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

දෙසැම්බර් 6 වැනි දින ඊඑෂක්‍ය හි ව්‍යාපාර සහයෝගිතා කමිටුවේ 17 වැනි ඒකාබද්ධ කමිටු රැස්වීමේ දී ''ජපානය සහ ශ්‍රී ලංකාව අතර තානාපති සබඳතා 60 වැනි වසර ''වෙනුවෙන් සංවිධානය කළ ''ජපාන ශ්‍රී ලංකා ආර්ථික සබඳතා, ප්‍රවනතා සහ අවස්ථා'' යන මැයෙන් ඉදිරිපත් කිරීමක්.

## ආචාර්ය දුෂ්නි වීරකෝන් නියෝජ්‍ය අධ්‍යක්ෂිකා

අප්‍රේල් 18 - 20 නේපාලයේ කාත්මණ්ඩු හි දී ඉස්තාබුල් වැඩ සටහන පියවර ක්‍රියාත්මක කිරීමේ කොටසක් වශයෙන් ඌණ සංවර්ධිත රටවල (LDC ) සහශ්‍රක සංවර්ධන සපුරා ගැනීම සඳහා වූ උපදේශන පුහුණු වැඩ මුළුවේ දී '' ශ්‍රී ලංකාව සහ සහශ්‍රක සංවර්ධන ඉලක්කඃ කලින්ම අත්කර ගත් අයගේ අත්දැකීම්'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

ජුනි 18 - 20 දකුණු අප්‍රිකාවේ කේප් ටවුන් හි '' බුද්ධි සංචිත විනිමය'' හි දී '' බුද්ධි සංචිත අධීක්ෂණයට ඉගෙන ගැනීමඃ ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අත්දැකීම්'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 11 - 13 පාකිස්ථානයේ ඉස්ලාමාබාද් නගරයේ චිරස්ථායී ප්‍රතිපත්ති සංවර්ධන ආයතනය (SDPI) සංවිධානය කළ ''දකුණු ආසියාව ඇතුළත් කර ගන්නා සහ චිරස්ථායී වර්ධනයක් ඇති කිරීම '' මැයෙන් වූ පස් වැනි දකුණු ආසියානු ආර්ථික නායක හමුවේ දී '' ''දකුණු ආසියාවේ සංක්‍රමණයඃ මතු වෙමින් පවතින ප්‍රවනතා සහ අවස්ථා'' පිළිබඳ විශේෂ අදහස් දැක්වීමක්.

සැප්තැම්බර් 20 වැනි දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ බ්ලූම්බර්ග් සංවිධානය කළ ''2012 ශ්‍රී ලංකා ආර්ථික මණ්ඩපය'' හි සංවාද මණ්ඩල සාමාජිකා.

නොවැම්බර් 19 වැනි දින ‍යහර් ටවර්ස් හි දී හැටන් නැෂනල් බැංකු සමායතන/ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහා ''ශ්‍රී ලංකාවේ වර්ධනය සහ සාර්ව ආර්ථික ස්ථායිතාවය සඳහා ඇති ඉඩ ප්‍රස්ථා'' මැයෙන් ඉදිරිපත් කිරීමක්

## ආචාර්ය නිෂා අරුණතිලක අධි සාමාජික

ජනවාරි 16 කොළඹ UNDP සංවිධානය කළ ''ජාතික මානව සංවර්ධන වාර්තාව - අදාල පාර්ශ්වයන්ගේ උපදේශනය'' හි දී කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කිරීම

මාර්තු 24 - 30 එ. ජ. චැපල් හිල් විශ්ව විද්‍යාලය සංවිධානය කළ ''ආසියාවේ අවදානම් සහිත වැඩ '' පිළිබඳ වැඩ මුළුවේ දී ''ශ්‍රී ලංකාවේ අවදානම් සහිත වැඩ '' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

මැයි 22 දින අන්තර්ජාතික සම්බන්ධතා අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගමාර් ආයතනය සහ කොළඹ උපාය මාර්ගික අධ්‍යයන ආයතනය '' ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මැනීම'' පිළිබඳව පැවති විවෘත සාකච්ඡා මණ්ඩපයේ දී ''දරිද්‍රතාවයේ බහුපැතිමාන මිනුම් යෙදීම'' පිළිබඳව අදහස් දැක්වීම.

ජුලි 12 වැනි දා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී ලංකා වානිජ මණ්ඩලයේ 2012 ශ්‍රී ලංකාවේ ආර්ථික නායක හමුවේ දී '' ගෝලීය වෙළඳ පොළ තරගකාරී වීමට නිපුණතා සහ ඵලදායකත්වය පිළිබඳව ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 7 වැනි දා පැවති ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වාර්ෂික ජාතික සමුළුවේ දී '' ශ්‍රී ලංකාව වර්ධන අධිවේගී මාර්ගයේ රැඳී සිටින්නේ කෙසේද? අංශ, කලාප සහ ජන කණ්ඩායම් අතර පවතින අසමානතා පියවීම.'' සැසියේ සාකච්ඡාව මෙහෙයවීම.

දෙසැම්බර් 17 ගලදාරි හෝටලයේ අන්තර්ජාතික කම්කරු සංවිධානය සංවිධාන කළ '' ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ස්ත්‍රී සහභාගිත්වය'' පිළිබඳ ILO වැඩ මුළුවේ සාකච්ඡාවේ දී අදහස් දැක්වීම.

නොවැම්බර් 1 වැනිදා සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පැවති ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා වූ ILO කාර්යාලය සංවිධානය කළ '' මූලික යහපත් රැකියා අභියෝග සහ ප්‍රතිපත්ති ක්ෂේත්‍ර'' පිළිබඳ '' ජාතික ත්‍රිපාර්ශ්වීය වැඩ මුළුව'' ට සහභාගිවීම.

නොවැම්බර් 18 වැනි දා වානිජ මණ්ඩලයේ කොමිටි කාමර බී හි පැවති මානව සම්පත් සහ අධ්‍යාපනය පිළිබඳ වානිජ මණ්ඩලයේ මෙහෙයුම් කමිටු රැස්වීමට සහභාගිවීම.

නොවැම්බර් 30 වැනි දා ''විශ්ව විද්‍යාල ආර්ථික විද්‍යඥයන්ගේ ශ්‍රී ලංකා මණ්ඩපයේ සාකච්ඡා සභාව මෙහෙයවීම.

ඔක්තෝබර් 5 වැනි දා IPS ශ්‍රවනාගාරයේ පැවති ඔභෘඡ සංවිධානය කළ ''ජාතික මානව සංවර්ධන වාර්තාව'' එළි දැක්වීමේ දී ඉන් හෙළි වූ තොරතුරු ගැන ඉදිරිපත් කිරීමක්.

## ආචාර්ය මාලතී නයිට් අධි සාමාජිකා

මාර්තු 15 IPS ශ්‍රවනාගාරයේ පැවති IPS හා FCCISL සංවිධානය කළ ''ජගත් පාරිභෝගික අයිතීන් දින මණ්ඩපයේ දී'' පාරිභෝගික ආරක්ෂාවේ පැතිමානයන්ඃ සංවර්ධනය වන රටක දැක්ම''පිළිබඳ ඉදිරිපත් කිරීමක්

මැයි 31 සිට ජුනි 1 දක්වා IPS ශ්‍රවනාගාරයේ පැවති ''වෙළඳාම දේශගුණ වෙනස්වීම සහ ආහාර සුරක්ෂිත භාවය''පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණයේ දී ''දකුණු ආසියාවේ ආහාර මිල උද්ධමනය පාලනය කිරීමේ මෙවලමක් ලෙස තරගකාරි ප්‍රත්පත්තිය'' පිළිබඳ 111 තාක්ෂණ සැසියේ දී සාකච්ඡාව මෙහෙයවීම/ නිම කිරීමේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම්

ඔක්තෝබර් 20 වැනි දා බංග්ලාදේශ් ඩකා හි දී රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය වඩාත් කාර්යක්ෂම කිරීමේ දී පාර්ලිමෙන්තු මංත්‍රීවරුන් සහ පෞද්ගලික අංශය අතර සහයෝගිතාවය ශක්තිමත් කිරීම'' පිළිබඳ කලාපීය සමුළුවේ දී තිරසාර සහ ඇතුළත් කර ගන්නා වර්ධනය අවස්ථා සහ අභියෝග සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය'' යනුවෙන් ප්‍රධාන ඉදිරිපත් කිරීම්

## ආචාර්ය ගංගා තිලකරත්න අධි සාමාජිකා

ඔක්තෝබර් 3 හා 4 දින වල නේපාලයේ කත්මණ්ඩු හි පැවති ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා වූ දකුණු ආසියානු කේන්ද්‍රය හා ෆෙඩරික් ඊබර්ට් ස්ටිෆ්ටුන්ග් (FES) සම සංවිධානයෙන් '' දකු-ණු ආසියාවේ සමාජ ආරක්ෂණය සියලු දෙනාට ලබා දීම'' පිළිබඳ කලාපීය සම්මන්ත්‍රණයේ දී '' සමාජ ආරක්ෂණය සියලු දෙනාට ලබා දීම'' පිළිබඳ ශ්‍රී ලංකාව සඳහා ජාතික පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම්

ඔක්තෝබර් 9ී 11 නේපාලයේ කත්මණ්ඩු හි පැවති එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) සහ ප්‍රතිපත්ති අධ්‍යයනය සඳහා දකුණු ආසියානු කේන්ද්‍රය සම සංවිධානය කළ ''දකුණු ආසියාවේ මානව සංවර්ධනය පිළිබඳ කලාපීය උපදේශනයේ'' දී 2015 පශ්චාත් සංවර්ධන න්‍යාය පත්‍රයක් නිර්වචනය කිරීම සහ ලබා දීම'' පිළිබඳ සැසියේ මෙහෙයුම් මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීම්

# ප්‍රතිපත්ති සංවාදයක් පෝෂණය කිරීම

දෙසැම්බර් 21 සහ 22 ඉන්දියාවේ වාරානසී හි දී UNESCAP දකුණු සහ නිරිත දිග ආසියා කලාපයේ අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO) සහ මානව සංවර්ධනය සඳහා වූ ආයතනය (HID) සංවිධානය කළ ශ්‍රම ආර්ථික විද්‍යා ඉන්දියානු සමාජයේ 54 වැනි කම්කරු සම්මේලනයේ දී '' ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා රැකියා නිර්මාණය: සියලු දෙනා ඇතුළත් කර ගන්නා වර්ධන න්‍යාය පත්‍රයක් සඳහා දෘෂ්ටි කෝණයක්'' පිළිබඳ ඉදිරිපත් කිරීමකි

## ආචාර්ය පරාක්‍රම සමරතුංග අධි සාමාජික

ඔක්තෝබර් 22 සහ 23 කොළඹ ගාලු මුවදොර හෝටලයේ පැවති GDN සහ IPS සංවිධානය කළ ගෝලීය සංවර්ධන ජාලය සම්මන්ත්‍රණයේ දී '' දකුණු ආසියාවේ කෘෂිකාර්මික මිල නියම කිරීම සහ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය'' පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම්

## අනුෂ්ක විජේසිංහ පර්යේෂණ ආර්ථික විද්‍යඥ

පෙබරවාරි 21 රාජගිරිය මහ බැංකුවේ දී '' සාර්ක් බදුකරණය'' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී '' ආයෝජන සඳහා බදු දිරිගැන්වීම්'' පිළිබඳ ඉදිරිපත් කිරීමකි

සැප්තැම්බර් 11- 13 පාකිස්ථානයේ ඉස්ලාමාබාද් හි පැවති පස්වැනි ආර්ථික නායක හමුවේ දී ඉදිරිපත් කිරීමකි

ඔක්තෝබර් 20 '' 2012 ගැහැණු දරුවාගේ අන්තර්ජාතික දිනය සැමරීමට පැවති PLAN අන්තර්ජාතික සම්මන්ත්‍රණයට සහභාගිවීම්

නොවැම්බර් 20 කොළඹ ගාලු මුවදොර හෝටලයේ පැවති 2012 ජාතික කළමනාකරණ සම්මන්ත්‍රණයේ දී '' වෙනස්වන කාලයේ දී නායකත්වය'' පිළිබඳ ඉදිරිපත් කිරීමකි

ඔක්තෝබර් 17 කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී මැලේසියානු කළමනාකාරිත්ව ආයතනය (MIM ) සහ සහතික ලත් වෘත්තීය කළමනාකරුවන්ගේ ආයතනය (CPM ) සංවිධානය කළ '' 2012 අන්තර්ජාතික කළමනාකරණ සමුළුවේ දී ආර්ථික විස්ථාපනය හා අලුත් රැකියා නිර්මාණය'' පිළිබඳ ඉදිරිපත් කිරීමකි

## රොෂිණි ජයවීර පර්යේෂණ නිලධාරි

ජුලි 12 සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශක කමිටුවේ දී ''සංක්‍රමණයේ පැතිකඩක්'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

අගෝස්තු 16 සංක්‍රමණය පිළිබඳ ජාතික උපදේශන කමිටුවේ දී '' නව වෙළඳ පොළ සඳහා පර්යේෂණය කිරීම සහ නව වෙළඳ පොළට පිවිසීම'' පිළිබඳ අවසාන සංකල්ප සටහන ඉදිරිපත් කිරීම.

නොවැම්බර් 7 IPS හි දී IPS ජාතික වාර්ෂික සමුළුවේ දී '' වර්ධනය සඳහා ග්‍රාමීය සේවා නියුක්තියට සංවර්ධනයේ බලපෑම වැඩි දියුණු කිරීම'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

## අයෝධ්‍යා ගලප්පත්තිගේ පර්යේෂණ නිලධාරී

ජනවාරි 16 කොළඹ දී UNDP සංවිධානය කළ ''ජාතික මානව සංවර්ධන වාර්තාව - ආදාල පාර්ශ්වයන්ගේ උපදේශනය.'' හි දී ''ආර්ථික හැකියාවන් හිඩැස පියවීම - සේවා නියුක්තිය හා ජීවන මාර්ග'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

ජුනි 27 - 29 මැනිලාවේ ADB මූලස්ථානයේ පැවති '' සමාජ ආරක්ෂණ දර්ශකය'' පිළිබඳ කලාපීය වැඩ මුළුවේදී '' සමාජ ආරක්ෂණය දේශීය වාර්තාව ශ්‍රී ලංකාව: දරිද්‍රතාවය සහ ස්ත්‍රීපුරුෂ භාවීය අනුපාත''පිළිබඳ ඉදිරිපත් කිරීමක්.




## ප්‍රියන්කා ජයවර්ධන පර්යේෂණ නිලධාරි

ජනවාරි 19 කොළඹ ඔහෘජ සංවිධානය කළ '' ජාතික මානව සංවර්ධන වාර්තාව - අදාල පාර්ශ්වයන්ගේ උපදේශනය'' හි දී අධ්‍යාපනයේ සමාජ හැකියාවන් හිඩැස පියවීම'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 3 - 6 මීගමුව පැරඩයිස් බීච් හෝටලයේ පැවති දක-ණු ආසියානු නායක හමුවේ දී '' ශ්‍රී ලංකාවේ නොවිධිමත් අංශයේ ශ්‍රමය'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 23 IPS සම්මන්ත්‍රණ ශාලවේ දී IPS සංවිධානය කළ බදුකරණ සම්බන්ධතාවයේ ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ මතුවෙමින් පවතින ගැටලු පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සංවාදයේ දී ''බදුකරණය සහ ව්‍යාප්ති විග්‍රහය. රාජ්‍ය සේවකයින්ගෙන් බදු අය කිරීමෙන් ප්‍රගමනයේ වැඩි දියුණුවක් වන්නේ ද?'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 29 හා 30 ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී (SLFI) පැවති 'ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ 2012 සමුළුවේ දී '' ශ්‍රී ලංකාවේ ආදායම් සහ සාධාරණත්වය මත 2012 බදු සංශෝධන ආදායම් බලපෑම' පිළිබඳ පත්‍රිකාව ඉදිරිපත් කිරීමක්.

ඔක්තෝබර් 15- 17 කොළඹ ඊළුෂකා හි දී මහජන සෞඛ්‍යය සඳහා ආසියා පැසිපික් ශාස්ත්‍රඥ එකතුව (APACPH) 2012 සංවිධානය කළ සමුළුවේ දී ''මන්දපෝෂණයේ පරම්පරානුගත චක්‍රය සහ දුප්පතුන් කෙරේ පැටවෙන අසමාන වූ බර'' පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

නොවැම්බර් 7 ෂපී පැවති ෂපී වාර්ෂික ජාතික සමුළුවේ දී ' රටේ වෙනස්වන අවශ්‍යතාවයන් සඳහා අධ්‍යාපනය' පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

දෙසැම්බර් 3 සහ 4 හොටේල් ගලදාරි හි පැවති ගෝලීය මහජන සෞඛ්‍යය ( GPH 2012) පිළිබඳ අන්තර්ජාතික සමුළුවේ දී ''ළමා මන්දපෝෂණය සහ දුප්පතුන් මත අසමාන බර පැටවීමේ සමාජ ආර්ථික නිර්ණයන්: ශ්‍රී ලංකාව '' පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

ඔක්තෝබර් 28 - 30 මැලේසියාවේ ක්වාලාලම්පූර් ග්‍රෑන්ඩ් මිලේනියම් හෝටලයේ හි පැවති ''සෞඛ්‍ය අසමානතා විසඳීමේ දී සමාජ ප්‍රජාතන්ත්‍ර ප්‍රතිශෝධන'' පිළිබඳ කලාපීය සමුළුවේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.



# ප්‍රතිපත්ති සංවාදයක් පෝෂණය කිරීම

## සුනිමලී මදුරාවල පර්යේෂණ නිලධාරී

නොවැම්බර් 7 IPS ජාතික වාර්ෂික සමුළුවේ දී ''ශ්‍රී ලංකාව වර්ධන අධිවේගී මාවතේ රැඳී සිටින්නේ කෙසේද? පෞද්ගලික ව්‍යවසාය වර්ධනය, විදේශීය සෘජු ආයෝජන, නව්‍යකරණය සහ තරගකාරිත්වය'' සැසියේ මුලසුන මෙහෙයවීම

නොවැම්බර් 7 IPS සංවිධානය කළ ෂෂී ජාතික වාර්ෂික සමුළුව 2012 හි දී '' තිරසාර සංවර්ධනය සඳහා මානව සම්පත් වර්ධනය'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 23 සහ 24 බංග්ලාදේශ් ඪකා හි නව දිල්ලියේ මානව සංවර්ධන ආයතනය, මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයේ Capturing the Gains Research Network , දකුණු සහ නිරිත දිග ආසියාවේ UN-ESCAP කාර්යාලය, නව දිල්ලිය, ඩියුක් විශ්ව විද්‍යාලයේ ගෝලීයකරණය, යහ පාලනය සහ තරගකාරිත්වය පිළිබඳ කේන්ද්‍රය, බංග්ලාදේශ් ප්‍රතිපත්ති සංවාදය සඳහා වූ කේන්ද්‍රය, බංග්ලාදේශ් කෙයාර් ඉන්ටර්නැෂනල් සංවිධානය කළ '' ඇතුළත් කර ගන්නා සංවර්ධනය සඳහා වටිනාකම් හර පද්ධතීන්'' පිළිබඳ සංවාදයේ දී ''වටිනාකම් හර පද්ධතීන් තුළ ස්ත්‍රීන්: ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයේ ස්ත්‍රී සහභාගිත්වය'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

## කාන්චනා වික්‍රමසිංහ පර්යේෂණ නිලධාරී

සැප්තැම්බර් 26 IPS සම්මන්ත්‍රණ ශාලාවේ දී '' හෝටල් අංශයේ පරිසර කළමනාකරණ භාවිතාවන්'' ගැන ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 27 කොළඹ රමදා හෝටලයේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය ( SLTDA ) සංවිධානය කළ '' සංචාරක කර්මාන්තය සහ තිරසාර බලශක්තිය'' සම්මන්ත්‍රණයේ දී '' හෝටල් අංශයේ බල ශක්ති කළමනාකරණය: සංකල්ප සහ ප්‍රවනතා'' ගැන ඉදිරිපත් කිරීමක්.

## දිලානි හිරිමුතුගොඩගේ පර්යේෂණ නිලධාරි

ජුනි 1 NSF ශ්‍රවනාගාරයේ දී ජාතික විද්‍යා පදනම ( NSF ) සංවිධානය කළ '' ආහාර සුරක්ෂිත භාවය ජාතික තේමාගත පර්යේෂණ වැඩ සටහන පිළිබඳ පළමු සැලසුම් වැඩ මුළුවේ දී '' ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිත භාවය ගැන කෘෂිකාර්මික වෙළඳ ද්‍රව්‍ය සඳහා විදේශීය සහ දේශීය වෙළඳ පොළ ප්‍රතිපත්ති මැදිහත්වීම් වල බලපෑම්'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 29 දින රුහුණු විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සංවිධානය කළ කෘෂිකර්මය හා පරිසරය පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ දී '' ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික දැනුම '' නව පැලෑටි වර්ග සහ ගොවීන් ආරක්ෂා කිරීමේ දී ඔසෘෂජ ගිවිසුම'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

දෙසැම්බර් 19 දින IPS සම්මන්ත්‍රණ ශාලාවේ දී තේ අපනයන සංගමයේ සාමාජිකයන් සමග '' ශ්‍රී ලංකාවේ තේ අපනයනය වැඩි කළ හැක්කේ කෙසේද?'' යන්න පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

මාර්තු 15 IPS ශ්‍රවනාගාරයේ දී IPS සහ FCCISI සංවිධානය කළ පාරිභෝගික අයිතීන් දින මණ්ඩපය ''දකුණු ආසියාවේ පාරිභෝගිකයන්ට ආර්ථික සහයෝගිතාවය නොමැතිවීමේ පිරිවැය'' ගැන ඉදිරිපත් කිරීමක්.

## අශාණි අභයසේකර පර්යේෂණ සහකාර



මාර්තු 30 දින නව දිල්ලියේ ICRIER සමුළු ශාලාවේ දී අන්තර්ජාතික ආර්ථික සම්බන්ධතා පිළිබඳ පර්යේෂණය සඳහා වූ ඉන්දියානු කවුන්සලය ( ICRIER ) සංවිධානය කළ සමුළුවේ දී '' ශ්‍රී ලංකාවේ රෙදිපිළි සහ ඇඟළුම් අංශය: සමස්ත දැක්මක්'' ඉදිරිපත් කිරීමක්.

අප්‍රේල් 6 - 7 නේපාලයේ කත්මණ්ඩු හි දී කොන්රාඩ් ඇඩිනෝර් පදනම (KAS) සමග සහයෝගයෙන් සාමය හා ගැටුම් අධ්‍යයන ආයතනය (IPCS) සංවිධානය කළ දකුණු ආසියාවේ සම්බන්ධතාවය පිළිබඳ සූදානම්වීමේ කලාපීය සමුළුවේ දී ''දකුණු ආසියාවේ ආර්ථික සම්බන්ධතාවය'' ගැන ඉදිරිපත් කිරීමක්.

මැයි 28 ඉන්දියාවේ නව දිල්ලියේ දී සංවර්ධනය වන රටවල් සඳහා වූ පර්යේෂණ සහ තොරතුරු පද්ධති (RIS) WTO අධ්‍යයනය සඳහා වූ කේන්ද්‍රය ( CWS ) විදේශීය වෙළඳාම සඳහා වූ ඉන්දියානු ආයතනය (IIFT) ඉන්දියානු වානිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය (FICCI ) සංවිධානය කළ දකුණු ආසියවේ වෙළඳම පහසුකරණය: අභියෝග සහ ඉදිරි මඟ' සමුළුවේ දී ''ශ්‍රී ලංකාවේ වෙළඳ ක්‍රියාවලීන් සහ ක්‍රියාපටිපාටි සංශෝධනය කිරීම'' යනුවෙන් ඉදිරිපත් කිරීමක්.

ජුලි 13 වැනි දා කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී ශ්‍රී ලංකාවේ වානිජ සහ කර්මාන්ත මණ්ඩල සම්මේලනය සහ ෆෙඩ්රික් නෞමාන් ස්ටිෆ්ටුන්ග් සමග සාර්ක් වානිජ සහ කර්මාන්ත මණ්ඩලය සංවිධානය කළ '' දකුණු ආසියාවේ වෙළඳාම පහසුකරණය: වෙළඳ දාමය පෝෂණය කරනු සඳහා බාධක ඉවත් කිරීම'' පිළිබඳ සමුළුවක දී ''ශ්‍රී ලංකාවේ වෙළඳ ක්‍රියාවලීන් සහ ක්‍රියා පටිපාටි වැඩි දියුණු කිරීම'' ගැන ඉදිරිපත් කිරීමක්.

සැප්තැම්බර් 10 - 14 දක්වා භූතානයේ තිම්පු හි පැවති කොන්රාඩ් ඇඩිනෝර් ස්ටිෆ්ටුන්ග් (KAS) සහයෝගයෙන් සාමය හා ගැටුම් අධ්‍යයන ආයතනය (IPCS) සංවිධානය කළ දකුණු ආසියාවේ භෞතික, භාවාත්මක සහ ආර්ථික සම්බන්ධතා ශක්තිමත් කිරීම පිළිබඳ සමුළුවක දී ''දකුණු ආසියාව තුළ ආර්ථික සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම'' ගැන ඉදිරිපත් කිරීමක්.

ඔක්තෝබර් 2 වැනි දා කොළඹ ගලදාරි හෝටලයේ දී ILO ජාත්‍යන්තර පුහුණු කේන්ද්‍රයෙන් ( ITC ) සංවිධානය කළ දකුණු ආසියානු සේව්‍ය සංවිධාන රැස්වීමේ දකුණු ආසියාවේ සේව්‍ය සංවිධාන වල අනාගතය ගැන සාකච්ඡා මණ්ඩපයක දී '' ගෝලීයකරණය සහ මතුවෙමින් පවතින දකුණු ආසියාව: අවස්ථා සහ අභියෝග'' ගැන ඉදිරිපත් කිරීමක්.

# ප්‍රතිපත්ති සංවාදයක් පෝෂණය කිරීම

නොවැම්බර් 16 දින කොළඹ සිට ස්කයිප් හරහා නව දිල්ලියේ ICKIER ශ්‍රවනාගාරයේ පැවති අන්තර්ජාතික ආර්ථික සබඳතා ගැන පර්යේෂණ සඳහා වූ ඉන්දියානු කවුන්සලය ( ICRIER ) සංවිධානය කළ දකුණු ආසියාවේ රෙදිපිළි සහ ඇඟළුම් අංශය ශක්තිමත් කිරීම පිළිබඳ අවසාන වැඩ මුළුවේ දී ''දකැුණු ආසියාවේ රෙදි පිළි සහ ඇඟළුම් අංශය ශක්තිමත් කිරීම'' ගැන ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 24 සහ 25 බංග්ලාදේශ් ඩකා බ්‍රැක් සෙන්ටර් ඉන් හි දී නව දිල්ලියේ මානව සංවර්ධනය සඳහා වූ ආයතනය සහ මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලයේ Capturing the Gains Research Network සංවිධානය කළ ''ඇතුළත් වූ සංවර්ධනය සඳහා වටිනාකම් දාමයන්: දකුණු ආසියාව සඳහා පාඩම් සහ ප්‍රතිපත්ති'' පිළිබඳ සමුළුවේ දී'' වටිනාකම් දාමයන් සහ ඇතුළත් වූ සංවර්ධනය: ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය'' ගැන ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 29 සහ 30 කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් සංවිධානය කළ පළමු ශ්‍රී ලංකා ආර්ථික පර්යේෂණ සමුළුවේ දී GSP + ඉවත් කිරීම ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තය. බලපෑම් සහ ඉදිරිය'' ගැන ඉදිරිපත් කිරීමක්

**චන්දන කරුණාරත්න පර්යේෂණ සහායක.**

ජනවාරි 21 - 27 දක්වා කොළඹ සහතික ලත් සමායතන ලේකම් ආයතනය සංවිධානය කළ '' ප්‍රාග්ධන වෙළඳ පොළ ප්‍රතිපත්ති ගැටුම්'' පිළිබඳ සම්මන්ත්‍රණයේ දී '' ශ්‍රී ලංකාවේ වෙළඳ ගිවිසුම් ප්‍රාග්ධන වෙළඳ පොළ ඇති කරන බලපෑම්'' ගැන ඉදිරිපත් කිරීමක්.

මාර්තු 30 වැනි දින IPS ශ්‍රවනාගාරයේ දී වියට්නාම් තානාපති කාර්යාලය සමග IPS සංවිධානය කළ ශ්‍රී ලංකා වියට්නාම් ආර්ථික සහයෝගිතාවය සඳහා ඇති විභවයන් ගවේෂණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණයේ දී '' ශ්‍රී ලංකා වියට්නාම් වෙළඳ ප්‍රගතිය හා ඉදිරි අපේක්ෂා' සහ ශ්‍රී ලංකා වියට්නාම් ආයෝජන අවස්ථා'' ගැන ඉදිරිපත් කිරීම්.

නොවැම්බර් 1 සහ 2 දින කොළඹ ගලදාරි හෝටලයේ දී UNESCAP ARTNet සම්මන්ත්‍රණයේ දී '' ශ්‍රී ලංකාවේ අපනයන සකස් කිරීමේ කලාප සහ වෙළඳ පහසුකරණය හා දරිද්‍රතාවය අඩු කිරීමට ඇති බලපෑම'' පිළිබඳ ඉදිරිපත් කිරීමක්.

නොවැම්බර් 7 IPS ශ්‍රවනාගාරයේ පැවති IPS වාර්ෂික ජාතික සමුළුවේ දී ''පෞද්ගලික ව්‍යවසාය සංවර්ධනය'' ගැන ඉදිරිපත් කිරීමක්.

## ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ දීර්ග කාලයක් සේවය කල සේවකයින් ඇගයීම



වාර්ෂිකව පැවැත්වෙන සුහද හමුවේ ආයතනයේ දීර්ග කාලයක් (අවුරුදු 15 සහ 10) සේවය කල සේවකයින්ට සම්මාන පිරිනැමීම ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සභාපති සහ විධායක අධ්‍යක්ෂක විසින් 2012 දෙසැම්බර් මස 7 දින සිදු කරන ලදී.

# Talking Economics Blog Articles 2012

## JANUARY

**India's Middle Class Boom: Sri Lanka Must Cash In**
*Anushka Wijesinha, Insights, January 18*

**Mainstreaming Migration into the Development Process - Budget 2012 Takes Vital Steps**
*Roshini Jayaweera, Insights, January 04*

## FEBRUARY

**Numbers Matter to People: Lessons from "OWS" for Researchers?**
*Anushka Wijesinha, The Note Pad, February 27*

**World Economy Health Check: Mixed Bag of Prospects in 2012**
*Chandana Karunaratne Global View February 21*

## MARCH

**Consumers' Voice Missing in Sri Lanka's Debates on Deeper Regional Integration**
*Ashani Abayasekara Feature March 14*

**How Can we Create More and Better Jobs in Sri Lanka? - What the Public had to Say**
*Editorial Team Feature March 13*

**Sri Lanka's Youth Employment Challenge: A Dilemma of Attitudes and Aspirations**
*Kaushalya Attygalle The Note Pad March 11*

**Sri Lanka's Female Workers and the Challenge of 'Precarious Work'**
*Nisha Arunatillake Feature, Insights March 08*

**Towards Better Jobs in Sri Lanka**
*Kalpana Kochhar Guest Articles March 02*

**An Ocean of Wealth: Sri Lanka Must Make Good Use of It**
*Kanchana Wickremasinghe Insights March 01*

## APRIL

**Malaysia and Sri Lanka: Dilemmas of the Development Process**
*Kaushalya Attygalle The Note Pad April 29*

**Latest 'Talking Economics Digest' available online**
*Editorial Team Feature April 26*

**A New 'World's Banker'**
*Anushka Wijesinha Global View, Insights April 23*

**Divi Neguma - A Closer Look**
*Dilani Hirimuthugodage Insights April 17*

**What Really is a 'Better Job' in the Sri Lankan Context?**
*Nipuni Perera The Note Pad April 09*

## MAY

**Microinsurance in Sri Lanka: Combating Multiple and Overlapping Vulnerabilities**
*Editorial Team Insights May 30*

**Tight and Trim Now, Lean and Mean Later?: The Debate on Austerity and Adjustment in Tough Times**
*Anushka Wijesinha Global View May 21*

**Read 'Talking Economics' on your iPad!**
Editorial Team Uncategorized May 08

**Expanding Tertiary Education Critical to Sri Lanka's 'Knowledge Hub' Aspirations**
*Priyanka Jayawardena Insights May 08*

## JUNE

**Rio+20: Towards a 'Green Growth' Path**
*Kanchana Wickremasinghe Insights June 22*

**Facing the Fallout of a Possible 'Grexit' and a Euro Break-up: Time for Preparation for Developing Countries**
*Research Team Global View June 12*

**Multidimensional Poverty Index: A New Way of Assessing Poverty in Sri Lanka**
*Editorial Team Feature June 10*

**'Talking Economics' with Tan Tai Yong, Director of Singapore's Institute for South Asian Studies**
*Editorial Team Feature June 05*

## JULY

**Economic Freedom and the Asian Century**
*Razeen Sally Guest Articles July 20*

**Nanotechnology in Sri Lanka: A New Beginning with a New Technology but Commitment is Key**
*Ajith De Alwis Guest Articles, Talk Nanotech July 02*

## AUGUST

**Read the Latest 'Talking Economics Digest' Online**
*Anushka Wijesinha Insights August 27*

**Lankan University Graduates: Late Birds, No Worms?**
*Harshanee Jayasekera Insights August 22*

**TE Digest Editorial - 'It's All About Jobs'**
*Editorial Team - The Note Pad August 20*

**Greening Jobs in Sri Lanka: Getting Things Started**
*Kanchana Wickremasinghe - The Note Pad August 13*

# Talking Economics Blog Articles 2012

## September

**Giving Tourism a Green Shade: Studying Environmental Practices in Sri Lanka's Hotels**
*Kanchana Wickremasinghe - The Note Pad September 27*

**Free Downloads of Policy Briefs – 'Sri Lanka: State of the Economy 20102**
*Editorial Team - The Note Pad September 26*

**5th South Asia Economic Summit – Video Interview with Dr. Saman Kelegama**
*Editorial Team - The Note Pad September 17*

**OOP(s)! – Struggling for Equity in Sri Lanka's Health Sector amidst Rising Out of Pocket Expenditure**
*G D Dayaratne - Insights September 06*

## November

**Releasing 375 pages of content – free download of SOE Policy Briefs (2005-2009)**
*Editorial Team Feature November 28*

**Fiscal Imperatives for Growth and Stability**
*Dushni Weerakoon Insights November 20*

**'Sri Lanka: State of the Economy 20122 e-book released**
*Editorial Team Feature November 14*

**Mind the Gap: How Will Sri Lanka Finance its Development Needs?**
*Anushka Wijesinha Insights November 06*

## October

**Gender Equality in Human Development: What's Holding Sri Lanka Back?**
*Sunimalee Madurawala - Insights October 30*

**'The Jobs Challenge' – Videos from our Expert Voices Panel Discussion**
*Editorial Team Feature October 23*

**Global Trade Protectionism is Rising Discreetly: Sri Lanka Must Stay Alert**
*Ashani Abayasekara Global Perspectives October 18*

**Video: Sri Lanka National Human Development Report 2012**
*Editorial Team Feature October 17*

**The Narrow Human Resource Base in Science and Technology Could Constrain Sri Lanka's Knowledge Economy Ambitions**
*Harshanee Jayasekera Insights October 10*

## December

**Healthy Public Policies Begin with Health in All Policies**
*Samanthi Bandara Feature December 14*

Blog 'Talking Economics': www.ips.lk/talkingeconomics

# මූල්‍ය වාර්තා

## 2012 දෙසැම්බර් 31 වැනි දාට

The Auditor General's Final Report was not available at the time of publication of the Annual Report. This report will be uploaded in the IPS website (www.ips.lk) when it is available.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No : එල්එස්/බී/අයිපීඑස්/එෆ්ජ්/2012

ඔබේ අංකය / உமது இல / Your No. :

දිනය / திகதி / Date : 2013 සැප්තැම්බර් 30 දින

සභාපති,

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

**ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වු ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන 1999 අංක 09 දරන පනතින් සංශෝධිත 1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජීතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone : 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail : oaggov@sltnet.lk

Received 2/10/13.


# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / துலைவா / My No } එල්එස්/බී/අයිපීඑස්/එෆ්ඒ/2012

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2013 සැප්තැම්බර් 30 දින

සභාපති,

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්. සමරවීර,

විගණකාධිපති.

පිටපත :-ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.


අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887028 -34

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී . ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ . එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

-----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2011 දෙසැම්බර් 31 දිනට ආයතනයේ නමින් පෞද්ගලික බැංකුවක ස්ථාවර තැන්පතුවක රු.82,900,000 ක මුදලක් ආයෝජනය කර තිබුණත් එම වටිනාකම 2012 මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එම මුදල පරිත්‍යාග අරමුදලට (Endowment Fund) අයත් බව විගණනය වෙත දන්වා තිබුණ ද, එම අරමුදල පිළිබඳ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ කිසිදු තොරතුරක් ඇතුළත් කර නොතිබුණි.

(ආ). 2010 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු බවට ගිණුම්ගත කර තිබුණද, භාණ්ඩාගාරයෙන් අදාළ වර්ෂයෙන් පසුව නොලැබෙන මුදලක් වූ රු.793,845 ක් වර්ෂයේ වියදම් ලෙස කපාහැර තිබුණි.

2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශය ගිණුම්කරණ ප්‍රමිත අංක 1.

ඡේද අංක 77, 78, 79 හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සඳහන් වන ආකෘතිය අනුව භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පත් නිසියාකාරව වර්ග කර දක්වා නොතිබුණි.

2.2.3 ලැබිය යුතු ගිණුම්

(අ) ණයගැතියෝ

ලැබිය යුතු ගිණුම්වල එකතුව රු.7,402,111 ක් වූ අතර, එය තුළ දීර්ඝ කාලයක සිට පැවත එන රු.1,311,005 ක ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්ය මණ්ඩල ණය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ සියලුම කාර්ය මණ්ඩලය වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබුව ද එම නිලධාරීන්ට වසරකට වඩා වැඩි කාලයක් සඳහා ණය ලබාදී තිබුණි.

2.2.4 නිතී,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.6 ඡේදය ප්‍රකාර වාර්ෂික, අර්ධ වාර්ෂික හා කාර්තුමය ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.916,970 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.343,442 ක් වූ බැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.573,528 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) මුළු ආදායම

2011 වර්ෂයේ රු. 101,197,612 ක් වූ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මුළු ආදායම 2012 වර්ෂයේදී රු. 121,441,978 ක් දක්වා රු.20,244,366 කින් එනම් සියයට 20 ක් වැඩි වී තිබුණි. එම වැඩි වීම කෙරෙහි බලපෑ විෂයයන් පහත දැක්වේ.

| විෂයය | ආදායම් | | වැඩි වීම |
|---|---|---|---|
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| භාණ්ඩාගාරයේ දායකත්වය | 13666000 | 1,2701,000 | 965,000 |
| පරිත්‍යාග අරමුදලේ දායකත්වය | 22,000,000 | 7,500,000 | 14,500,000 |
| වැඩමුළු හා සම්මන්ත්‍රණ ආදායම | 7,651,720 | 3,996,181 | 3,655,539 |
| පොළී ආදායම | 20,386,916 | 14,569,419 | 5,817,497 |
| ශ්‍රවණාගාරය කුලියට දීම | 1,172,320 | 222140 | 950,180 |

(ආ) ව්‍යාපෘති ආදායම

---

ආයතනයේ ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත වූ අධ්‍යයන ව්‍යාපෘති වලින් සමාලෝචිත වර්ෂයේ ලද ආදායම රු.49,355,732 ක් වූ අතර, පෙර වර්ෂයේ රු.54,160,812 ක් වූ ආදායම සමඟ සැසඳීමේ දී රු.4,805,080 ක් හෙවත් සියයට 9.8 ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

---

4.1 කාර්ය සාධනය

---

1988 අංක 53 දරන ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 6 වගන්තියේ සඳහන් ආයතනයේ අරමුණු හා පරමාර්ථ අතරින් (අ) උප වගන්තිය අනුව ජාතික සංවර්ධන සැකසුම්වලට හා ප්‍රතිපත්තිවලට අදාළව අධ්‍යයන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම කළ යුතු වුව ද, සමාලෝචිත වර්ෂය තුළ එවැනි තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

(අ) <u>පර්යේෂණ වියදම්</u>

2011 වසරේ රු.13,289,655 ක් වූ පර්යේෂණ වියදම් 2012 වසරේදී රු.20,623,821 ක් දක්වා රු.7,334,166 කින් එනම් සියයට 60 කින් ඉහළ ගොස් තිබුණි. ව්‍යාපෘති ආදායම සියයට 10 කින් පහළ යාමේදී පර්යේෂණ වියදම සියයට 60 කින් ඉහළ යාමට හේතුව ආයතනයට ලැබී තිබුණු ව්‍යාපෘති ආයතනයෙන් බාහිර සමාගම් හෝ පුද්ගලයින් ලවා ඉටු කරවා ගැනීමට යොමු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) <u>අධ්‍යයන ව්‍යාපෘති</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අධ්‍යයන ව්‍යාපෘති වෙනුවෙන් අත්සන් කළ ගිවිසුම් නොතිබුණි.

(ii) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය හා දේශීය හෝ විදේශීය සේවා යෝජක ආයතන සමඟ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම අවබෝධතා ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(iii) අධ්‍යයන ව්‍යාපෘතිවල අවසන් වාර්තාව නිකුත් කිරීම ප්‍රමාද වීම.

(iv) පර්යේෂණ අංශය ඉටු කළ අධ්‍යයනවල ප්‍රගතිය අනුව නියමිත දිනවකවානු තුළ ඉන්වොයිස් නිකුත් නොකිරීම හා ඒ පිළිබඳ පර්යේෂණ අංශය හා ගිණුම් අංශය අතර නිසි සම්බන්ධීකරණයක් නොතිබුණි.

(v) සම්පූර්ණ කළ ව්‍යාපෘති සඳහා ඉන්වොයිස් නිකුත් කර නොතිබුණි.

(ඇ) <u>අධ්‍යයන ව්‍යාපෘති පෞද්ගලික සමාගම් මගින් ඉටු කරවා ගැනීම</u>

(i) ශ්‍රී ලංකා රජය හා ඉන්දියාව අතර විදුලිබල සම්ප්‍රේෂණ ජාල අනුපූරක අධ්‍යයන පිළිබඳ අන්තර් සබඳතාව (Feasibility study on the interconnection between India and Sri Lanka power transmission Grids complementary studies to be conducted for the Government of Sri Lanka) හා සම්බන්ධ සක්‍යතා අධ්‍යයන ව්‍යාපෘතිය සඳහා විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් රු.6,036,820 ක මුදලක් ලැබී තිබුණු අතර, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ එකඟතාවය සහිතව හා එම අමාත්‍යාංශයේ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි අධ්‍යයනය නිසි පරිදි නිම කළ බවට, ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ වගකිව යුතු නිලධාරියෙකු හෝ කමිටුවක නිර්දේශ කිරීම්වලින් තොරව ගෙවීම් කටයුතු නිම කර තිබුණි.

- ආයතනය වෙත ලැබෙන විවිධ අධ්‍යයන බාහිර ආයතනවලට පැවරීමේදී මුල්‍ය දායකත්වය වෙනුවෙන් අය කරන මුදල පිළිබඳව සැලකිල්ලක් නොදක්වමින් පිරිවැය ඇස්තමේන්තු සකස් කර ඇති බවට විගණනයේදී තහවුරු විය.
- මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ප්‍රසම්පාදන විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම හා ඉන්දීය වෙළෙඳ ප්‍රජාව සඳහා ශ්‍රී ලංකාව තුළ තිබෙන වෙළෙඳ අවස්ථා පිළිබඳ අත්පොත ( Hand book on the Indian –SL free trade Agreement/Trade opportunities in SL for the Indian business community) යන අධ්‍යයන දෙකම ඉන්දීය මහ කොමසාරිස් සමඟ අත්සන් කළ ගිවිසුමක් මත ආරම්භ කර තිබුණි. ගිවිසුම් අනුව පිළිවෙලින් රු.700,000ක් හා රු.705,000 ක් වශයෙන් එකතුව රු.1,405,000 ක් කොන්ත්‍රාත්තුව අවසානයේදී ගෙවිය යුතු විය. ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා ගිවිසුම් අත්සන් කළ 2011 මාර්තු 07 දින සිට දින 14 ක් ඇතුළත එනම් 2011 මාර්තු 21 දින ඉන්දියානු මහ කොමසාරිස්වරයා විසින් රු.700,000 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

* ගිවිසුම ප්‍රකාරව 2011 මැයි 31 දින වන විට අවසන් කෙටුම්පත හා අත්පොත් 1,000 ක් මුද්‍රණය කර භාර දිය යුතු වුවත්, නියමිත දිනට කටයුතු කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

* ඉන්දියානු මහ කොමසාරිස්ගෙන් අය කර ගත යුතු ඉතිරි රු.705,000 ක මුදල අය කර ගැනීම සම්බන්ධව ප්‍රමාණවත් සැළකිල්ලක් දක්වා නොතිබුණි.

(iii) උතුරු - නැගෙනහිර පළාත් සේවා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පළාත් පාලන සමීක්ෂණ පැවැත්වීම සඳහා උපදේශන සේවා සැපයීමේ අධ්‍යයන ව්‍යාපෘතියට ( consultancy service for local authority survey for Northern and Eastern province North East local service Improvement project) අදාළ ක්ෂේත්‍ර වැඩ සඳහා රු.1,382,500 ක් වටිනා කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ප්‍රසම්පාදන විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ඈ) <u>ලිඛිත ඉල්ලීම් රහිතව ඉටු කළ ව්‍යාපෘති</u>

අවිධිමත් ක්ෂේත්‍ර පිළිබඳ සමීක්ෂණය සහ සේවයේ නියුක්ත කළ හැකි ආබාධිතයින් පිළිබඳ සමීක්ෂණය ( Survey of informal sector Enterprises and survey of employable disables) පිළිබඳව පවත්වාගෙන ඇති ගොනුව අනුව ඉහත ව්‍යාපෘතිය කම්කරු දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ඉටු කර කෙටුම්පත් වාර්තා ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත ආදායම රු.564,163 කි. මෙම අධ්‍යයන සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙන් කරන ලද කිසිදු ලිඛිත ඉල්ලීමක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) පර්යේෂණ ව්‍යාපෘති ඉටු කළ හැකි පුද්ගලයින් හා ආයතන ලියාපදිංචි කර ගැනීම පිළිබඳ තොරතුරු ලේඛන ගත කර නොතිබුණි.

(ඊ) ඉන්වොයිස් වටිනාකම රු.1,725,733 ක් වූ ගනුදෙනු සඳහා එකතු කළ අගය මත බදු රු.184,900ක් ගනුදෙනුකරුවන්ගෙන් අය කර නොතිබුණි.

(උ) ✓ සේවක සුභ සාධන කටයුතු වෙනුවෙන් අරමුදලක් වසර 9 කට පෙර පිහිටුවා තිබුණු අතර සමාලෝචිත වසර අවසානය වන විට එම අරමුදලේ රු.1,300,225 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. 2012 මැයි 31 දින වනවිටත් අරමුදල විසින් නිලධාරීන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් කිසිදු වියදමක් කර නොතිබුණි.

(ඌ) ✓ 2011 වසරේ රු.1,425,719 ක් වූ දේශන හා වැඩමුළු වියදම සමාලෝචිත වර්ෂයේ රු.5,574,930ක් දක්වා රු.4,149,211 කින් එනම් සියයට 291 කින් වැඩි වී තිබුණි. වැඩමුළු වියදම් ඉහළ ගිය ද පෙර වර්ෂයේ වැඩමුළු ආදායම වූ රු.3,996,181 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.7,651,720 ක් වූ බැවින් ආදායම වැඩි වී තිබුණේ සියයට 91 කින් පමණි.

4.3 දැශාස අක්‍රමිකතා

------------------

අ) පෞද්ගලික අංශයේ ආපදා අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීම සඳහා උපදේශන සේවා ලබාදීමේ (PJ 65 – F Consultancy for a study on private sector disaster Risk Reduction) ව්‍යාපෘතිය UNISDR ආයතනයේ අධ්‍යයන ව්‍යාපෘතියක් වන අතර, මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම ආයතනයේ නිලධාරීන් තිදෙනෙක් වෙත පවරා තිබුණි. ඇමෙරිකානු ඩොලර් 10,000 ක මුදල අධ්‍යයන ව්‍යාපෘතිය භාරව කටයුතු කළ නිලධාරිනියකගේ පෞද්ගලික බැංකු ගිණුමට ලැබී පසුව ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ගිණුමට බැර කර තිබුණි. පර්යේෂණ කාර්ය මණ්ඩලය සේවාදායක ආයතනවලට පෞද්ගලික බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු ලබාදීමේ අවශ්‍යතාවය විගණනයේදී පැහැදිලි නොවීය.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

-------------------------------

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ කාර්ය මණ්ඩල වියදම රු.49,860,529 ක් වූ අතර, එය පසුගිය වසරේ කාර්ය මණ්ඩල වියදම වූ රු.46,371,858 ට සාපේක්ෂව රු.3,488,671 කින් වැඩි වී තිබුණි.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 (බී) ඡේදය අනුව සෑම ආයතනයක්ම අනුමත කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතු වුවද, ආයතනයේ කාර්ය මණ්ඩල (Cardre) සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදය අනුව වැටුප් හා දීමනා සම්බන්ධව, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පර්යේෂණ කාර්ය මණ්ඩල සාමාජිකයින් 20 දෙනෙකු වෙත 2012 වසර තුළ පවරා ඇති ව්‍යාපෘති, එම ව්‍යාපෘතිවල ප්‍රගතිය හා කාර්ය මණ්ඩලය නිරත වූ වෙනත් රාජකාරී වෙතොත් ඒ පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණත් අසම්පූර්ණ විස්තරයක් විගණනය සඳහා ඉදිරිපත් විය. 1988 අංක 53 දරන ශ්‍රී ලංකා අධ්‍යයන ආයතන පනතේ 6(අ) වගන්තිය අනුව ආයතනය එහි මෙහෙයුම් අත්පොතක් සැලසුම් කර එහි ප්‍රතිපාදන අනුව කටයුතු කරන බව සභාපතිවරයා දන්වා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2013 වර්ෂයෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණ ද එය කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර තිබූ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණි.

5.3 විගණන කමිටු

2012 වර්ෂය තුළ විගණන කමිටුව රැස්වීම් එකක් පවත්වා තිබුණත් විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙකු නිරීක්ෂකයෙකු ලෙස සහභාගි කරවාගෙන නොතිබුණි.

5.4 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.5 අයවැය පාලනය

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය 2012 වර්ෂය සඳහා සකස් කළ අයවැය ලේඛනයක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණු අතර, රාජ්‍ය අයවැය දෙපාර්තමේන්තුවට යැවීම සඳහා ගිවිසුම් ගත සේවා සඳහා යන වියදම පමණක් ගණන් බලා ඉදිරිපත් කර තිබුණි.

5.6 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

(අ) පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව 2012 ජූලි 26 දින රැස්වීම් නියෝග.

(i) මානව සම්පත් කළමනාකරණ කාර්ය පරිපාටිය සඳහා නියෝග අංක 10 පරිදි භාණ්ඩාගාරයේ ලිඛිත අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ii) මෙහෙයුම් අත්පොත් සඳහා නියෝග අංක 12 පරිදි භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(iii) නියෝග අංක 20 පරිදි පරිත්‍යාග අරමුදලේ කළමනාකරණ මණ්ඩලය විසින් ගිණුම් පිළියෙල කොට විගණනය සඳහා ඉදිරිපත් කිරීම අධීක්ෂණය කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ටොරින්ටන්හි පිහිටි සමෘද්ධි පැළ තවාන ඉඩමෙන් අක්කර ½ ක් ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට ලබා දී තිබූ අතර ඒ සඳහා බදු කුලී ලෙස රු.5,460,000 ක මුදලක් දැනට ගෙවා තිබුණ ද ඒ සඳහා මෙතෙක් දීර්ඝ කාලීන බදු ඔප්පුව ලැබී නොතිබුණි.

6. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) අධ්‍යයන ව්‍යාපෘති.

(ආ) ණයගැති පාලනය.

(ඇ) කාර්ය මණ්ඩල ණය.

(ඈ) පුස්තකාල පොත් පරිහරණය.

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති

# ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

## 2012 විගණන වාර්තාවට ප්‍රතිචාර

යොමු අංකය අංක LS/B/01/IPS/FA/2012

### 2.2 මූල්‍ය වාර්තා පිළිබඳ නිරීක්ෂණ

2.2.1 ගිණුම් අඩුපාඩු

(අ) එන්ඩොව්මන්ට් අරමුදල ස්වාධීන අරමුදලක් වන අතර එය විගණනය කරන්නේ වෙනමය. එහි කළමනාකරණය භාර ගැනීමට දැනටමත් හඳුනාගෙන ඇති භාරකාර මණ්ඩලයක් සූදානම්ය. භාරයේ ගිණුම් වෙනම පවත්වා ගෙන යනු ඇත.

(ආ) 2010 වසරේ රජයේ ප්‍රදානයක් වූ රු.793,845 එම වසරේ දී ලැබුණේ නැත. එය 2012 දී වියදමක් වශයෙන් කපා හැර ඇත. ආයතනයේ ශුද්ධ වත්කම් හා සසඳන විට එම සංඛ්‍යාව වැදගත් නොවන නිසා සංසන්දනාත්මක සංඛ්‍යාව නැවත සඳහන් කර නැත.

2.2.2. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්

සියලුම ආයෝජන ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් යටතේ වර්ග කර ඇත. කෙටි කාලීන සහ දීර්ඝ කාලීන වශයෙන් වර්ග කිරීමක් අනුගමනය කෙළේ නැත. විගණනයේ දී පෙන්වා ඇති ආකාරයට නිවැරදි වර්ග කිරීම ඉදිරියේ දී අනුගමනය කරනු ඇත.

2.2.3 ලැබිය යුතු ගිනුම්

(අ) ණයගැතියෝ

මෙම මුදල් අයකර ගැනීමට සියලු පියවර ගනු ඇත. ඉතිරිවී ඇති ප්‍රමාණයන්ගේ වර්තමාන තත්වය මෙසේය.
ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය. රු.753,760

ඉදිරියට කරගෙන යන වැඩ

මුදල් අමාත්‍යාංශය රු. 216,172

මෙය අදාල වන්නේ වාර්තාව මුද්‍රණය කිරීමේ වියදම්ය. එම ප්‍රමාණය ලබා ගැනීමට සියලු උත්සාහය දරනු ඇත.

ඉන්දියානු කවුන්සලය රු. 341,073

මෙම ගාස්තුව 2013 වසරේ දී අය කර ගෙන ඇත.

(ආ) කාර්ය මණ්ඩල ණය

අරමුදල් වල ස්වභාවය නිසා කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගන්නේ කොන්ත්‍රාත් පදනම යටතේය. (ඒ රජයේ අරමුදල් මත නොව ව්‍යාපෘති අරමුදල් මත රැඳී සිටින නිසාය.) ආයතනයේ මෙහෙයුම් කාර්ය සංග්‍රහය (MOO) අනුව වසර දෙකක සේවා කාලය සම්පූර්ණ කළ කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට ඔහුගේ සේවා කොන්ත්‍රාත්තුව තව දුරටත් දීර්ඝ කිරීමේ හැකියාවක් පවතින්නේ නම් ණයක් ලබා ගත හැකිය. ආපසු ගෙවීමේ කාලය වසර තුනකට වඩා දීර්ඝ නොවේ.

2.2.4. නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.
(අ) එක් එක් කාර්තුව සඳහා වාර්තා පාලන මණ්ඩලයට ඉදිරිපත් කරන අතර ඒවා විගණනයට ලබා ගත හැකිය.

### 3. මූල්‍ය වාර්තා.

3.1 මූල්‍ය ප්‍රතිඵල

මෙම වසර සඳහා රු. 916,970 ක අතිරික්තයක් වාර්තාවේ. මෙය කලින් වසර හා සසඳා බලන විට රු. 573,528 ක වැඩි වීමකි.

3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය නිරීක්ෂණය

(අ) මුළු ආදායම

මුළු ආදායම කලින් වසරට වඩා සියයට 20 ක් වැඩිවීමක් පෙන්නුම් කරයි.

(ආ) ව්‍යාපෘති ආදායම්

2012 වසර ව්‍යාපෘති 33 හා සසඳන විට 2011 වසරේ දී ව්‍යාපෘති 31 ක් අලුතින් ආරම්භ කර ඇත. 2012 වසරේ දී ආදායම සියයට 9 කින් පහත වැටීමට මූලික වශයෙන් හේතු වන්නේ සැලකිය යුතු ආදායමක් ගෙන දුන් විශාල ව්‍යාපෘති කීපයක් 2011 වසරේ දී වසා දැමීමයි. ඒවා 2012 වසරට පවත්වා ගෙන ගියේ නැත.

**4. මෙහෙයුම් නිරීක්ෂණය.**

4.1 කාර්ය සාධනය

නිරීක්ෂණයට ලක්ව ඇති කාල පරිච්ඡේදය තුළ ජාතික සංවර්ධන සැලසුම් සහ ප්‍රතිපත්ති වලට අදාල කරුණු සම්බන්ධයෙන් ව්‍යාපෘති ගණනාවක් සිදු කෙරිණ. නිදසුන් කීපයක් වන්නේ 2012 ආර්ථිකයේ තත්වය, ඉන්දු ශ්‍රී ලංකා බලශක්ති ජාලක අන්තර් සම්බන්ධතාවය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය, ළමා යහපැවැත්ම සහ සාධාරණත්වය සහ පැලෑටි වර්ග සහ ගොවීන්ගේ පාරම්පරික දැනුම ආරක්ෂා කිරීම යි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතාවය

(අ) පර්යේෂණ වියදම්

විශේෂයෙන්ම තාක්ෂණය හා සම්බන්ධ කටයුතු වලදී ආයතනයට බාහිර සම්පත් යොදා ගැනීමට සිදු වේ. 2012 වසරේ දී පර්යේෂණ වියදම් සියයට 60 කින් ඉහළ යෑමට හේතුව වන්නේ ඉන්දු ශ්‍රී ලංකා බලශක්ති ජාලක අන්තර් සම්බන්ධතාවය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය සඳහා බාහිර සම්පත් යොදා ගැනීමට සිදුවීමයි. එම ව්‍යාපෘතිය ඉටු කරන ලද්දේ බල ශක්ති අමාත්‍යාංශයේ ඉල්ලීම අනුවය.

(ආ) අධ්‍යයන ව්‍යාපෘති

ස සහ සස අමාත්‍යාංශ වලින් කොන්ත්‍රාත්/ අවබෝධතා ගිවිසුම් අත්සන් කරන්නේ නැත. මෙම ආයතනයට ව්‍යාපෘතියක් ලබා දුන් විට ඒ පිළිබඳව ලිපියක් නිකුත් කෙරේ. '' නොවිධිමත් අංශයේ ව්‍යවසායන් සහ සේවයේ යෙදවිය හැකි ආබාධිතයන් පිළිබඳ සමීක්ෂණය'' ආරම්භ කරන ලද්දේ කම්කරු දෙපාර්තමේන්තුවෙන් කරන ලද වාචික ඉල්ලීමක් අනුවය. ( පිරිනැමීමේ ලිපියක් නිකුත් කර නැත.)

iii, iv සහ V කම්කරු අමාත්‍යාංශය ප්‍රතිව්‍යුහ ගත කොට අංශ දෙකක් පිහිටුවන ලදී. එම අංශ දෙකම මෙම සමීක්ෂණය ගැන දැන සිටියේ නැත. එමනිසා සමීක්ෂණය සහ වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. වාචික ඉල්ලීමක් මත සමීක්ෂණය කළ නිසා ඉන්වොයිසියක් ඉදිරිපත් කළ යුත්තේ කුමන අංශයටද යන්න පැහැදිලි නැත. එමනිසා ප්‍රතිව්‍යුහ ගත කිරීමෙන් පසුව ඉන්වොයිසියක් ඉදිරිපත් කෙළේ නැත.

(ඇ) පෞද්ගලික සමාගම් විසින් කරන ලද අධ්‍යයන ව්‍යාපෘති.

(i ) පෞද්ගලික උපදේශන සමාගමට ගෙවීම සිදු කරන ලද්දේ කෙටුම් පත් වාර්තාවක් ඉදිරිපත් කොට එය බලශක්ති අමාත්‍යාංශයෙන් පිළිගත් පසුය.

මෙම ව්‍යාපෘතිය බල ශක්ති අමාත්‍යාංශය වෙනුවෙන් කරන ලද්දේ සහන මිල ගණනක් යටතේය. අප ආයතනයට සාමාන්‍ය ආදායමක් ලැබෙන ආකාරයට අයවැය ගණනය කරන ලද අතර එසේ ගණනය කළ ආදායම ආයතනයට ලැබිණ.

මෙම ව්‍යාපෘතිය කරන ලද්දේ බල ශක්ති අමාත්‍යාංශයේ ඉල්ලීමක් අනුවය. මිල ගණන් කැඳවන ලදී. ඇගයීම සහ තෝරා ගැනීම සිදු කරන ලද්දේ අමාත්‍යාංශයෙනි.

(ii ) මෙම අධ්‍යයනයට සම්බන්ධ පර්යේෂකයන් දෙදෙනා වැඩි වැටුප් සඳහා ආයතනයෙන් ඉවත් වී විදෙස් ගත වූහ. එමනිසා ව්‍යාපෘතිය අවශ්‍ය නිපුණතා ඇති වෙනත් පර්යේෂකයන්ට පැවරීමට සිදු වූ අතර ඉන් ව්‍යාපෘතිය ප්‍රමාද විය.

2012 දෙසැම්බර් 31 වන විට කර ගෙන යන ව්‍යාපෘති, ව්‍යාපෘතියේ තත්වය සහ ශේෂව ඇති ප්‍රමාණය පර්යේෂකයාගෙන් විමසා බලන ලදී. එම ලිපි ලේඛන විගණනයට සාක්ෂි වශයෙන් ලබා ගත හැකිය.

( iii ) මෙය 2010 පටන් ගත් ව්‍යාපෘතියකි. ක්ෂේත්‍ර වැඩ කළ යුතුව තිබුණේ උතුරු හා නැගෙනහිර වන අතර සමීක්ෂණය කළ යුතු වූයේ දෙමළ බසිනි. Field ලංකා ආයතනයට දෙමළ බසින් සමීක්ෂණ කිරීමේ පළපුරුද්දක් ඇති නිසා ඔවුන්ට සමීක්ෂණ කටයුතු භාර දෙන ලදී.
(ඈ ) ලිඛිත ඉල්ලීමක් නැතිව කරන ලද ව්‍යාපෘති

නොවිධිමත් අංශයේ ව්‍යවසාය සහ සේවයේ යෙදවිය හැකි ආබාධිතයන් පිළිබඳ සමීක්ෂණය සිදු කරන ලද්දේ කම්කරු අමාත්‍යාංශයේ වාචික ඉල්ලීමක් අනුවය. (පිරිනැමීමේ ලිපියක් ලැබී නැත.)

(ඉ) අරමුදල් සැපයීමේ ලැයිස්තුවක් ඇත. එය ගිණුම් පද්ධතියට ඇතුළත් වේ. ප්‍රදානකයන් ලියා පදිංචි කිරීමේ ක්‍රියා පටිපාටියක් ප්‍රායෝගික නොවන්නේ ඒ ආයතන බොහොමයක් අමාත්‍යාංශ හෝ කුඩා ප්‍රදානකයන් වන නිසාය.

(ඊ) මෙය 2012 ජුනි වසරේදී අභ්‍යන්තර විගණක අංශයෙන් මතු කරන ලද විගණක විමසුමකි. අදාල අවස්ථා වල වැට් පනත යටතේ බදු ඉන්වොයිස් නිකුත් කිරීමට පියවර ගෙන ඇත.

(උ) කාර්ය මණ්ඩල සුභ සාධන ආයෝජන සුදුසු හා අවශ්‍ය අවස්ථා වලදී සිදු කෙරිණ. 2012 දී අවශ්‍යතාවයක් නොවූ බැවින් එය භාවිතා නොකෙරිණ. ඒ ෂෂෂක ඔඹෂ මුල පිරුම යටතේ ලැබුණ දීර්ඝ කාලීන ප්‍රදානය කාර්ය මණ්ඩල වියදම් සඳහා යොදා ගත හැකි වූ නිසාය. එමනිසා සුභ සාධන අවශ්‍යතා (පුහුණු වැනි) IDRC TTI වියදම් ශීර්ෂය යටතේ සිදු කෙරිණ.

(ඌ) සම්මන්ත්‍රණ සහ වැඩමුළු වියදම් වලින් සියයට 59 ක්ම '' වෙළඳාම, දේශගුණික වෙනස්වීම් සහ ආහාර සුරක්ෂිත භාවය පිළිබඳව මතු වෙමින් පවතින ගැටලු'' පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගි වූ විදේශ නියෝජිතයන්ගේ නවාතැන් සහ ගුවන් ටිකට් පත් වියදම්ය. ඒවා සැබෑ වියදම් පදනම යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයට ප්‍රති පූරණය කෙරිණ. සියලුම පර්යේෂණ ආයතන වල සම්මන්ත්‍රණ වියදම් සහ ආදායම් වසරින් වසරට වෙනස් වේ.

4.3 දෘෂ්‍යමාන විෂමතා

(අ) ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මෙහෙයුම් කාර්ය සංග්‍රහය අනුව (MOO) පෞද්ගලික උපදේශනයක වැඩ කටයුතු ආයතනයේ පර්යේෂණ වැඩ සටහනට අදාල වන්නේ නම් සහ ආයතනයේ පර්යේෂණ පදනමට දායක වන්නේ නම් පෞද්ගලික උපදේශනයට පැවරීමේ බලය හා අධිකාරිය විධායක අධ්‍යක්ෂක සතුය.

පෞද්ගලික උපදේශන වැඩ පිළිවෙළ යටතේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය ගිවිසුමේ පාර්ශ්වකරුවෙක් නොවන නිසා එයට අරමුදල් සපයන ආයතනයට ඉන්වොයිස් නිකුත් කළ නොහැකිය. ලැබිය යුතු මුදල් ප්‍රදානක ආයතනයෙන් ලබා ගෙන අප ආයතනයට ප්‍රතිපූරණය කිරීම උපදේශක ගේ වගකීමයි. මෙවැනි පෞද්ගලික උපදේශන වැඩ පිළිවෙළ යටතේ උපදේශක ගේ දීමනා සියල්ල සම්පූර්ණයෙන්ම ආයතනයට ප්‍රතිපූරණය කළ යුතුය. ඒ සඳහා උපදේශක ගේ බැංකු ගිණුම් විස්තර ලබා දී ඇත.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය.

(අ) සහ (ආ) මෙම ආයතනය ශ්‍රී ලංකාණ්ඩුවේ පරිපාලන රෙගුලාසි යටතට ගැනෙන්නේ නැත. 1988 අංක 53 දරන ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 6 (අ) ඡේදය අනුව ආයතනයේ පාලන මණ්ඩලයට සහ කළමනාකාරිත්වයට තමන්ගේම රීති සහ රෙගුලාසි සකස් කිරීමට බලය පවරා ඇත. ඒ අනුව ආයතනයේ මෙහෙයුම් සංග්‍රහයෙන් ආචාර ධර්ම පද්ධතියක් සකස් කොට ඇත. ඒ අනුව කාර්ය මණ්ඩල කේඩරය, බඳවා ගැනීම්, උසස්වීම් හා දීමනා නියම කරන්නේ මෙහෙයුම් කාර්ය සංග්‍රහය යටතේ සහ පාලන මණ්ඩලයේ විධානයන් යටතේය.

(ඇ) පර්යේෂණ කාර්ය මණ්ඩලය ව්‍යාපෘති යෝජන සහ ප්‍රකාශන යනාදි වශයෙන් සිදු කරන කාර්යන් කාර්තු වශයෙන් විමසා බලයි. මෙම විස්තර විගණනයට ලබා දී ඇත. විගණනය සඳහා වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් එය ආයතනයට දැනුම් දුන් විට විගණයට අවශ්‍ය ආකාරයට සකස් කොට ලබා දිය හැකිය.

**5. වගවීම සහ යහපාලනය**

5.1 ආයතන සැලැස්ම (Corporate Plan)

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ, ආයතන සැලැස්ම ලබා ගත හැකිය. උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමේ ක්‍රියාවලිය ඇරඹී ඇති අතර එය 2013 දී අවසන් වනු ඇත.

5.2 ක්‍රියාත්මක සලැස්ම

2012 සහ 2013 සඳහා ක්‍රියාත්මක සැලසුම් ( අයවැය) සකස් කිරීමෙන් පසු පාලන මණ්ඩලය විසින් අනුමත කර ඇත.

5.3 විගණන කමිටුව

රජයේ විගණන දෙපාර්තමෙන්තුව කැඳවිය යුතුයැයි කෝප් කමිටුවෙන් උපදෙස් ලැබුණේ 2012 ජුලි මාසයේ දීය. ඉන් පසු විගණන කමිටු රැස්වීම් පවත්වා විගණන දෙපාර්මෙන්තුවට කෝප් කමිටු තීරණය දන්වා යවන ලදී.

5.4 ප්‍රසම්පාදන සැලසුම.

සියලු භාණ්ඩ මිලදී ගැනීමේ දී මිල කැඳවීම් තුනක් ලබා ගන්නා ලදී. මේවා විශ්ලේෂණය කොට අවශ්‍යතාවයන්ට ගැලපෙන්නේ නම් අනුමත කර ඉදිරිපත් කිරීමෙන් පසු විධායක අධ්‍යක්ෂක විසින් පත් කරන කොමිටියකින් ද අනුමත කරයි.

5.5 අයවැය පාලනය.

අය වැය සහ සැබෑ වියදම් ප්‍රකාශනය වාර්ෂිකව පාලන මණ්ඩලයට ඉදිරිපත් කරන අතර එය වාර්ෂික වියදම් සැලසුම අනුමත කරයි. ඉන්පසුව සැබෑ වියදම් කාර්තු වශයෙන් මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.

5.6 නිරාකරණය නොකළ විගණන ඡේද ගැන නිරීක්ෂණ

(අ) 2012 ජූලි මාසයේ පැවති රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ කමිටු රැස්වීමේ මගපෙන්වීම්.
1) මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ක්‍රියා පටිපාටිය මෙම ආයතනයේ කාර්ය මෙහෙයුම් සංග්‍රහයේ ඇත. එම කාර්ය මෙහෙයුම් සංග්‍රහය පාලන මණ්ඩලයෙන් අනුමත කර ඇති අතර භාණ්ඩාගාරයේ ලේකම් එහි සාමාජිකයෙකි.

2) කාර්ය මෙහෙයුම් සංග්‍රහය අනුමැතිය සඳහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇති අතර එය මෙතෙක් ආපසු ලැබී නැත.

3) එන්ඩොව්මන්ට් අරමුදලේ කළමනාකරණය, දැනටමත් හඳුනා ගෙන ඇති භාරකාර මණ්ඩලයකට පැවරෙනු ඇත. භාරය සඳහා වෙනම ගිණුම් පවත්වා ගෙන යනු ඇත.

(ආ) 2011 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා මූල්‍ය වාර්තා පිළිබඳ විගණකාධිපති ගේ වාර්තාව පිළිබඳව.
ඉඩමේ දීර්ඝ කාලීන කල්බදු ගිවිසුම මෙතෙක් ලැබී නැත.

**(6) පද්ධති සහ පාලනය**

(අ) අධ්‍යයන ව්‍යාපෘති

4.2 (ආ) සහ (ඇ) පිළිතුර බලන්න.

(ආ) ණයගැති පාලනය

2.2.3. (අ) පිළිතුර බලන්න. වැඩි දුරටත් කළමනාකාරිත්වය දීර්ඝ කාලීන ණයගැතියන් විශේෂයෙන්ම අමාත්‍යාංශ සහ රජයේ ආයතන වලින් අයවිය යුතු මුදල් ගැන දැනුවත්ව සිටින අතර ඒවා ලබා ගැනීමට සියලු උත්සාහයන් දරමින් සිටී.

(ඇ) කාර්ය මණ්ඩල ණය

2..2.3 (ආ) පිළිතුර බලන්න

(ඈ) පුස්තකාලයේ පොත් භාවිතය.

පුස්තකාලයේ රීතීන් සහ මගපෙන්වීම් දැඩිව අනුගමනය කරන අතර පොත් නැතිවූ හෝ ආපසු භාර නොදුන් අවස්ථා වල අදාල පුද්ගලයාට දඩයක් නියම වෙන අතර එය ඔහුගේ/ඇයගේ වැටුපෙන් අඩු කර ගැනේ.

# ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

මූල්‍ය කාර්ය සාධන වාර්තාව

| දෙසැම්බර් 31 දායින් අවසන් වසර සඳහා | සටහන | 2012 | 2013 |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| ශ්‍රී ලංකාණ්ඩුවේ දායකත්වය | 2 | 13,666,000 | 12,701,000 |
| එන්ඩොව්මන්ට් ෆන්ඩ් දායකත්වය | | 22,000,000 | 7,500,000 |
| ව්‍යාපෘති ආදායම් | 3 | 49,355,732 | 54,160,812 |
| සම්මන්ත්‍රණ/වැඩමුළු ආදායම් | 4 | 7,651,720 | 3,996,181 |
| පොලී ආදායම් | | 20,836,916 | 14,569,419 |
| ගොඩනැගිල්ලේ ණය හිලව් කිරීමෙන් ආදායම් | | 6,242,012 | 6,274,023 |
| ශ්‍රවනාගාරය කුලියට දීමෙන් ආදායම් | | 1,172,320 | 222,140 |
| විවිධ ආදායම් | 5 | 967,278 | 1,774,036 |
| මුළු ආදායම් | | 121,441,978 | 101,197,612 |
| **වියදම්** | | | |
| සේවක පිරිවැය | 6 | 49,860,529 | 46,371,858 |
| දේපොළ යන්ත්‍ර හා උපකරණ ක්ෂයවීම් | 13 | 19,872,701 | 16,521,793 |
| පර්යේෂණ පිරිවැය | 7 | 20,623,821 | 13,289,655 |
| සම්මන්ත්‍රණ හා වැඩමුළු පිරිවැය | | 5,574,930 | 1,425,719 |
| උපයෝගිතා වියදම් | | 16,466,197 | 15,450,470 |
| ගමන් වියදම් | | 785,121 | 1,212,923 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 8 | 6,800,219 | 3,485,215 |
| ශ්‍රවනාගාර කුලී | | 622,511 | 75,677 |
| විනිමය පාඩු (ලාභ) | | (81021) | 3020860 |
| මුළු වියදම් | | 120,525,008 | 100,854,170 |
| බදු ගෙවීමට පෙර අතිරික්තය (හිඟය) | | 916,970 | 343,442 |
| ආදායම් බදු වියදම් | 9 | 0 | 0 |
| අදාල කාලය සඳහා අතිරික්තය (හිඟය) | | 916,970 | 343,442 |

# ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

## මූල්‍ය කාර්ය සාධන වාර්තාව

| දෙසැම්බර් 31 වන විට | | 2012 | 2011 |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| මුදල් සහ මුදල් සමාන | 10 | 4,048,958 | 18,064,518 |
| වෙළඳ උපචිත ආදායම් | | 7,402,111 | 1,311,005 |
| වට්ටෝරු ප්‍රකාශන | | 1,369,944 | 1,535,187 |
| තැන්පත් සහ පූර්ව ගෙවීම් | 11 | 18,666,394 | 2,240,133 |
| පොලී උපචිත | | 7,320,247 | 3,839,901 |
| වැට් උපචිත | | 1,204,187 | 710,098 |
| වෙනත් උපචිත ආදායම් | 12 | 3,062,502 | 4,085,528 |
| | | **43,074,343** | **31,786,369** |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපොළ, යන්ත්‍ර හා උපකරණ | 13 | 341,505,506 | 60,016,948 |
| ආයෝජන | 14 | 203,132,036 | 88,586,304 |
| මුළු ජංගම නොවන වත්කම් | | **544,637,542** | **48,603,252** |
| මුළු වත්කම් | | **587,711,885** | **80,389,621** |
| වගකීම් | | | |
| ජංගම වගකීම | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් | 15 | 9,326,549 | 13,389,653 |
| ව්‍යාපෘති සඳහා අත්තිකාරම් ලැබීම් | 16 | 33,221,579 | 17,091,061 |
| මුළු ජංගම වගකීම් | | **42,548,128** | **30,480,713** |
| ජංගම නොවන වගකීම් | | | |
| සේව්‍ය සුභ සාධන | 17 | 9,484,256 | 9,027,633 |
| කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදල | | 1,287,671 | 1,164,402 |
| විලම්බිත ආදායම් ප්‍රාග්ධන ප්‍රදාන | 18 | 299,616,613 | 05,858,626 |
| මුළු ජංගම නොවන වගකීම් | | **310,388,540** | **6,050,660** |
| මුළු වගකීම් | | **352,939,668** | **46,531,374** |
| ශුද්ධ වත්කම් | | **234,775,217** | **233,858,248** |
| ශුද්ධ වත්කම්/ හිමිකම් | | | |
| දායක ප්‍රාග්ධනය - සමුච්චිත අතිරික්තය | | 232,631,073 | 31,714,104 |
| රජයෙන්/ප්‍රදානකගෙන් ලැබුණ මුල් ප්‍රාග්ධන පැවරුම | | 2,144,144 | 2,144,144 |
| | | **234,775,217** | **233,858,248** |

මූල්‍ය ප්‍රකාශන වලට එකතු කරන ලද ඇමිණුම් මෙම මූල්‍ය වාර්තා වලට අන්තර්ගත වූ කොටස් ය. මෙම මූල්‍ය වාර්තා ශ්‍රී ලංකාවේ රාජ්‍ය ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත.

ප්‍රධාන මූල්‍ය නිලධාරි

ප්‍රධාන විධායක නිලධාරි

සභාපති

මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමට සහ ඉදිරිපත් කිරීමට ආයතනයේ පාලන මණ්ඩලය වග කියන්නේය.

2013 මාර්තු 27

# ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

## හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2012 දෙසැම්බර් මාසයෙන් අවසන් වූ වසර සඳහා

| | ප්‍රාග්ධනය | අතිරික්තය(හිඟය) | එකතුව |
|---|---|---|---|
| 2010 දෙසැම්බර් 31 ට ශේෂය | **2,144,144** | **231,370,662** | **233,514,806** |
| වසර තුළ අතිරික්ත ආදායම් | 0 | 343.442 | 343.442 |
| 2011 දෙසැම්බර් 31 ට ශේෂය | **2.144.144** | **231.714.104** | **233.858.248** |
| වසර තුළ අතිරික්ත ආදායම | 0 | 916.970 | 916.970 |
| 2012 දෙසැම්බර් 31 ට ශේෂය | **2,144,144** | **232.631.074** | **234.775.218** |

# ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා | 2012<br>රුපියල් | 2011<br>රුපියල් |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය | | |
| බදු ගෙවීමට පෙර අතිරික්තය/(හිඟය) | 916,970 | 343,442 |
| ගැලපීම් | | |
| කාර්ය මණ්ඩල සුභ සාධන අරමුදලෙන් ලත් දායකත්වය | 123,269 | 181,766 |
| දේපොළ යන්ත්‍ර සහ උපකරණ ක්ෂයවීම් | 19,872,701 | 16,521,793 |
| ගොඩනැගිල්ල ණය හිලව් කිරීමෙන් ලත් ආදායම | (6,242,012) | (6,274,023) |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 2,004,182 | 2,117,104 |
| පොලී ආදායම් | (20,386,916) | (14,569,419) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබීම්(පාඩුව) | 0 | (860000) |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර | | |
| ශුද්ධ මුදල් ලැබීම් (ගෙවීම්) | **(3,711,806)** | **(2,539,537)** |
| වෙළඳ අයවිය යුතු (වැඩිවීම්) අඩුවීම් | (6,091,106) | 1,476,931 |
| බදු ලේඛන (වැඩිවීම්) අඩුවීම් | 165,243 | (14,858) |
| තැන්පතු සහ පෙර ගෙවීම් (වැඩිවීම) අඩුවීම | (16,426,261) | 652,741 |
| වැට් සහ අනෙකුත් අයවීම් (වැඩිවීම්) අඩුවීම් | 528,924 | 4,164,141 |
| අත්තිකාරම් අයවීම් වැඩිවීම් (අඩුවීම්) | 16,130,518 | (9,588,215) |
| වෙළඳ සහ වෙනත් ගෙවීම් වැඩිවීම් (අඩුවීම්) | (4,063,102) | 4453031 |
| මෙහෙයුම් ශුද්ධ මුදල් ලැබීම් (ගෙවීම්) | (13,467,591) | (1,393,567) |
| පාරිතෝෂික ගෙවීම් | (1,547,559) | (568,123) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් | | |
| ගලා ඒම (ගලායෑම) | (15,015,150) | (1,961,690) |
| ආයෝජන කටයුතු වලින් මුදල් ලැබීම් | | |
| දේපොළ, යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම් | (6,529,061) | (44,925,938) |
| ගිණුම් ගැලපීම් | 5,167,801 | 0 |
| නොනිමි වැඩ ප්‍රාග්ධන (වැඩිවීම්) අඩුවීම් | 0 | 9,314,164 |
| පොලී ලැබීම් | 16,906,569 | 1 1,957,665 |
| දේපොළ යන්ත්‍ර සහ උපකරණ අලෙවියෙන් ලැබීම් | 0 | 860,000 |
| ආයෝජන මිලදී ගැනීම් | (28,461,019) | 57,899,593 |
| ආයෝජන අලෙවියෙන් ලැබීම් | 13,915,301 | (28,017,573 |
| ආයෝජන කටයුතු වලින් ශුද්ධ මුදල් | | |
| ගලාඒම /(ගලා යෑම) | 999,591 | 7,087,912 |
| මූල්‍ය කටයුතු මුදල් ප්‍රවාහය | | |
| ප්‍රදාන ලැබීම් | 0 | 0 |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ | | |
| මුදල් ගලා ඒම/(ගලායෑම) | 0 | 0 |
| මුදල් හා මුදල් සමාන දේ ශුද්ධ (අඩුවීම)/ වැඩිවීම | (14,015,559) | 5,126,222 |
| වසර මුලදී මුදල් සහ මුදල් සමාන ( සටහන10) | 18,064,517 | 12,938,296 |
| වසර අගදී මුදල් සහ මුදල් සමාන ( සටහන 10) | 4,048,958 | 18,064,517 |
| අ) මුදල් සහ මුදල් සමාන සැසඳීම | | |
| බැංකුව | 4,008,958 | 18,024,517 |
| අත ඉතිරි | 40,000 | 40,000 |
| | 4,048,958 | 18,064,517 |

# ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

## මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

### 2012 දෙසැම්බර් 31 න් අවසන් වන වසර සඳහා

### 1. ස්ථිර වාසය සහ නෛතික ආකාරය

ප්‍රතිපත්ති අධ්‍යයන් ආයතනය 1988 දෙසැම්බර් මාසයේ දී අංක 53 දරන පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලද අතර 1990 ගැසට් නිවේදනයකින් නෛතික ඒකකයක් ලෙස විධිමත්ව ප්‍රකාශයට පත් කෙරිණ. ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ලියා පදිංචි කාර්යාලය සහ මූලික සේවා ස්ථානය කොළඹ 7නිදහස් පටුමග අංක 100/20 දරන ස්ථානයේ පිහිටුවා ඇත.

### 1.1 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ ශ්‍රී ලංකාවේ ආර්ථික පර්යේෂණ කෙරේ යොමු වූ ආර්ථික ප්‍රතිපත්ති ප්‍රවර්ධනය සහ මධ්‍යම කිලීන ප්‍රතිපත්ති විශ්ලේෂණයි.

### 1.2 සූදානම් කිරීමේ පදනම:

#### 1.2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සමන්විත වන්නේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මූල්‍ය තත්වයේ ප්‍රකාශනය, හිමිකම් (ශුමසළුහ ) වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශනය හා මූල්‍ය ප්‍රකාශන වලට සටහන් ආදී වශයෙනි. මෙම ප්‍රකාශන සකස් කොට ඇත්තේ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය සහ මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශය ඒකාබද්ධව ප්‍රකාශයට පත් කළ රාජ්‍ය අංශයේ ආයතන සඳහා වන රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූල වන ආකාරයටය.

#### 1.2.2. මැනීමේ පදනම - මූල්‍ය වාර්තා සකස් කොට ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනම යටතේය.

#### 1.2.3. පවත්වා ගෙන යන ආයතනයක්

ඉදිරියට සැලකිය යුතු කාලයක් ආයතනයේ මෙහෙයුම් කටයුතු පවත්වා ගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ආයතනය සතුව ඇතැයි පාලන මණ්ඩලය සෑහීමට පත්ව ඇත. ඒ අනුව මූල්‍ය වාර්තා සකස් කොට ඇත්තේ ඉදිරියටත් පවත්වා ගෙන යන ආයතනයක මට්ටමෙනි.

### 1.3 වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය

#### (අ) විදේශ මුදල් ගනුදෙනු.

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ ආයතනයේ මුදල් ගනුදෙනු කරන ශ්‍රී ලංකා රුපියල් වලිනි. විදේශ මුදල් ගනුදෙනු ඒ අවස්ථාවේ පවතින විනිමය අනුපාතය අනුව සටහන් කෙරෙන අතර එවැනි ගනුදෙනු වලින් සිදුවන වාසි හෝ අවාසි ඒ අනුව සටහන් කෙරේ. විදේශ මුදල් ඒකක වලින් සඳහන් වන මූල්‍ය වත්කම් සහ වගකීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ඇතුළත්ව ඇත. එවැනි ශේෂ මුදල් වසර අවසානයේ පවතින විනිමය අනුපාතය අනුව පරිවර්තනය කර ඇතුළත් කෙරේ.

#### (ආ) දේපොළ, යන්ත්‍ර සහ උපකරණ

දේපොළ, යන්ත්‍ර සහ උපකරණ එකතු වූ ක්ෂයවීම් අඩු කරන ලද පිරිවැයෙන් හා හානියට පත්වීමෙන් වූ පාඩුව අඩු කර දක්වේ.

#### අනතුරුව කරන ලද වියදම්

වෙනම ගිණුම් ගත කළ දේපොළක්, යන්ත්‍ර සහ උපකරණ වල කොටසක් ඉවත් කොට වෙනත් කොටසක් යෙදීමේ වියදම් ඇතුළු ප්‍රධාන පරික්ෂාවන් සහ අලුත්වැඩියා කිරීමේ වියදම් ප්‍රාග්ධනයට එකතු කර ඇත.

ක්ෂය කිරීම් වත්කමේ ගණන් බලන ලද ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් කාලය පදනම්ව පහත සඳහන් වාර්ෂික අනුපාත යටතේ සෘජු රේඛා ක්‍රමය අනුව ගණනය කර ඇත.

| | |
|---|---|
| පරිගණක උපකරණ | 33% |
| වෙබ් පිටු සැලසුම | 33% |
| මෝටර සයිකලය | 20% |
| ලී බඩු | 20% |
| කාර්යාලීය උපකරණ/ විදුලි ජනකය | 20% |
| මෝටර් රථ | 20% |
| පුස්තකාල පොත් | 25% |
| ගොඩනැගිලි | 2% |

වත්කමක් ක්ෂය කිරීමට ගණක් ගන්නේ එය ප්‍රයෝජනයට ගත් දින සිටය. වත්කමක් ඉවත් වන්නේ එය අලෙවිය සඳහා වෙන් කළ විට සහ එය භාවිතයෙන් ඉවත් කළ දිනයේ සිටය.

**හානියට පැමිණීම:**

දේපොළ, යන්ත්‍ර හෝ උපකරණ එහි සඳහන් වටිනාකම ආපසු ලබා ගැනීමට නොහැකි ආකාරයෙන් හානියට පත්ව ඇති අවස්ථාවක ඒ ගැන සමීක්ෂණයක් කරනු ඇත. ආපසු ලබා ගැනීමේ වටිනාකමට වඩා සඳහන් වටිනාකම වැඩිනම් එය ආපසු ලබා ගැනීමේ වටිනාකම මට්ටමකම දක්වා පහත දමයි.

**(ඇ) කල්බදු.**

අවදානම හා ප්‍රතිලාභ අයිතිකරු වෙත පැවරෙන ආකාරයෙන් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වත්කම් මෙහෙයුම් කල්බදු වශයෙන් හැඳින්වෙනු ඇත. මෙහෙයුම් කල්බදු යටතේ කරන ගෙවීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ කල් බදු සීමාව තුළ ඍජු රේඛා පදනම යටතේ සඳහන් කෙරේ.

මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගත් වත්කමක් එහි කල්බදු සීමාවට පෙර අවසන් කරන්නේ නම් ඒ සඳහා කිසියම් දඩුවම් වශයෙන් කෙරෙන ගෙවීමක් එම කාල පරිච්ඡේදය තුළ කරන ලද වියදමක් සේ සටහන් කෙරේ.

**(ඈ) ආයෝජන.**

ආයෝජන වලට ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල් පත්, බැඳුම්කර හා ආපසු මිලදී ගැනීමේ ගිවිසුම් වලින් (Repurchase agreements ) අයත්ය.

i ස්ථාවර තැන්පතු

ස්ථාවර තැන්පතු එහි මිලදී ගැනීමේ මුදලෙන් සටහන් කෙරේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ උපචිත පොලී වශයෙන් සඳහන් වන්නේ එදිනට ලැබිය යුතු පොලී ප්‍රමාණයයි.

ii භාණ්ඩාගාර බිල් පත්/ භාණ්ඩාගාර බැඳුම්කර / ආපසු මිල දී ගැනීමේ ගිවිසුම්

භාණ්ඩාගාර බිල් පත් හා බැඳුම්කර ආයෝජන මූල්‍ය තත්ව ය පිළිබඳ ප්‍රකාශයේ දිනට සඳහන් වන්නේ එහි පිරිවැය සහ පොලිය වශයෙනි.

**(ඉ) ප්‍රාග්ධන ප්‍රදාන**

දේපොළ, යන්ත්‍ර, උපකරණ මිලදී ගැනීමට අදාලව ලැබෙන ප්‍රදාන, උපචිත ආදායම් වශයෙන් ජංගම නොවන වගකීම් යටතේ ඇතුළත් වන අතර ඒවා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයට අදාල වත්කම් ක්ෂය කිරීමේ පදනමට ගැලපෙන ආකාරයට බැර කෙරේ.

**(ඊ) වට්ටෝරු බඩු ලේඛනය**

වට්ටෝරු බඩු ලේඛනයට ප්‍රකාශන තොග අයත්ය. ප්‍රකාශන එහි පිරිවැය අනුව සඳහන් කෙරේ. වසර 10 කට වඩා පරණ ප්‍රකාශන සෙමින් අලෙවි වන ප්‍රකාශන සේ සලකා කපා හරිනු ලැබේ.

**(උ) උපචිත ලැබීම්**

උපචිත ආදායම් අපේක්ෂිත ලබා ගත හැකි වටිනාකම අනුව සටහන් වේ. ණය ගැතියන් කලින් කලට නිරීක්ෂණය කරයි. ලබා ගත නොහැකියැයි හඳුනා ගන්නා ණය කපා හරිනු ඇත. අපත්‍ය වූ ණය ඒවා හඳුනා ගත් වසරේ දී කපා හැරේ.

**(එ) මුදල් හා මුදල් සමාන**

මුදල් ප්‍රවාහය ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන වශයෙක් ගැනෙන්නේ බැංකුවේ ඇති මුදල්, අතේ ඇති මුදල් සහ බැංකු අයිරා අඩු කළ බැංකුවේ ඇති ඇරයුම් තැන්පතුය. (Call Deposits) ශේෂ පත්‍රයේ බැංකු අයිරා ජංගම වගකීම් යටතේ සඳහන් කෙරේ.

**(ඒ) වගකීම් සහ ප්‍රතිපාදන**

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් වශයෙන් දක්වෙන්නේ ඉල්ලීමක් කළ විට ගෙවිය යුතු ඒවා සහ මූල්‍ය තත්ව ප්‍රකාශනය දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතු ඒවාය. ජංගම නොවන වගකීම් වන්නේ ශේෂ පත්‍ර දිනයට වසරකට පසුව ගෙවීමට නියමිත වගකීම්ය. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී දැන ගන්නට ඇති සියලුම වගකීම් ඇතුළත් කර ඇත.

වගකීම් සඳහා ප්‍රතිපාදන වෙන් කරන්නේ පසුගිය සිද්ධියක් නිසා නෛතික හෝ සම්ප්‍රයුක්ත වගකීමක් (Coitructive Obligation) පවතින විට සහ එම වගකීම නිරාකරණයේ දී ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යෑමක් සිදු විය හැකියැයි පෙනෙන අවස්ථාවක දීය.

**(i) සේවක ප්‍රතිලාභ**

i නිශ්චිත දායකත්ව සැලසුම් (Defined Contribution Plans )

ආයතනයේ සියලු සේවකයන් අර්ථ සාධක අරමුදලේ සහ සේවා භාරකාරත්ව අරමුදලේ දායකයන් වන අකර ඒ සඳහා සේවයන්ගේ මූලික වැටුපෙන් හෝ වේතනයෙන් පිළිවෙළින් සියයට 12 ක් හා 3 ක් ආයතනයෙන් දායක කරයි.

**ii නිශ්චිත ප්‍රතිලාභ සැලසුම**

මෙම ආයතනය විශ්‍රාම පාරිතෝෂ ප්‍රතිලාභ වත්මන් වටිනාකම අනුව ගණනය කරයි. එය ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය (PUC) යොදා ගන්නා ආයුගණක නිවේදන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. ආයුගණක වාසි හෝ අවාසි මෙම සැලැස්මට සහභාගි වන අයගේ වැඩ කරන ඉතිරි කාලය අනුව අපේක්ෂිත ආදායම් හෝ වියදම් වශයෙන් හඳුනා ගනී.

**(ඕ) ආදායම් හඳුනා ගැනීම.**

i ශ්‍රී ලංකාණ්ඩුවෙන් ලැබෙන දායකත්වය.

ශ්‍රී ලංකාණ්ඩුවේ දායකත්වය උපචිත පදනමක් යටතේ සඳහන් කරනු ඇත.

ii ව්‍යාපෘති ආදායම්

ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියේ සම්පූර්ණ කරන ලද අදියර පදනම්ව ආදායම හඳුනා ගනු ඇත. ව්‍යාපෘතියකින් ලැබෙන අත්තිකාරම් ලැබීම් මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ විලම්බිත ආදායමක් සහ ජංගම වගකීමක් ලෙස දක්වේ.

**iii සම්මන්ත්‍රණ/ වැඩමුළු ආදායම්.**

සම්මන්ත්‍රණ හා වැඩමුළු ආදායම් උපචිත පදනමක් යටතේ වැඩමුළු සහ සම්මන්ත්‍රණ සම්පූර්ණ කළ පසු හඳුනා ගැනේ.

**සඩ පොළී ආදායම්**

පොළී ආදායම් උපචිත පදනමක් යටතේ ගණනය කෙරේ.

**(I) ප්‍රාග්ධන වියදම් හඳුනා ගැනීම**

ව්‍යාපාරය පවත්වා ගැනීමට හෝ ව්‍යාපාරයේ ඉපයීමේ හැකියාව වැඩි කිරීම සඳහා ස්ථාවර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, දීර්ඝ කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන වියදම්, ප්‍රාග්ධන වියදම් වශයෙන් හඳුනා ගැනේ.

**වියදම් වර්ගීකරණය.**

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය ඉදිරිපත් කිරීම සඳහා වියදම් ක්‍රමයේ ස්වභාවය ආයතනයේ කාර්ය සාධනයේ ලක්ෂණ සාධාරණව ඉදිරිපත් කරන්නේයැයි පාලන මණ්ඩලයේ අදහස වන බැවින් මෙම ඉදිරිපත් කිරීමේ ක්‍රමය යොදා ගන්නා ලදී.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

දෙසැම්බර් 31 දා වන විට

## 1. ශ්‍රී ලංකාණ්ඩුවේ දායකත්වය

ආයතනයේ උපයෝගිතා සහ නඩත්තුව වෙනුවෙන් ශ්‍රී ලංකාණ්ඩුවෙන් ලැබුණු ප්‍රතිපාදන නියෝජනය කරයි.

## 3. ව්‍යාපෘති ආදායම්

| | 2012 | 2011 |
|---|---|---|
| ව්‍යාපෘති ආයතන වලින් ලත් ආදායම | 29,683,684 | 32,713,173 |
| අන්තර්ජාතික සංවර්ධන පර්යේෂණ කේන්ද්‍රයෙන් ලත් ආදායම | 19,672,048 | 21,447,639 |
| | 49,355,732 | 54,160,812 |

## 4. සම්මන්ත්‍රණ හා වැඩමුළු වලින් ලැබුණු ආදායම

මෙය සමන්විත වන්නේ ප්‍රදානකයන්ගේ ඉල්ලීම සහ කරන ලද පර්යේෂණ වැඩ පතුරුවා හැරීම සඳහා පවත්වන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු වලින් ලැබුණු ආදායමෙනි.

## 5. විවිධ ආදායම්

| | | |
|---|---|---|
| ප්‍රකාශන අලෙවියෙන් | 896,333 | 746,289 |
| ස්ථාවර වත්කම් අලෙවියෙන් | 0 | 860,000 |
| වෙනත් ආදායම් | 70,945 | 167,747 |
| | 967,278 | 1,774,036 |

## 6. සේවක පිරිවැය

| | | |
|---|---|---|
| IPS කාර්ය මණ්ඩල වැටුප් | 36,522,531 | 32,626,503 |
| අර්ථ සාධක අරමුදල් | 4,012,203 | 3,916,461 |
| සේවා භාරකාරත්ව අරමුදල් | 1,107,577 | 981,008 |
| ගරු දීමනා ( සටහන 6.1) | 4,051,670 | 3,388,887 |
| කාර්ය මණ්ඩල සුභ සාධන වැය | 1,394,048 | 1,563,973 |
| වෙනත් ප්‍රතිලාභ | 768,318 | 1,777,922 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ( සටහන 17) | 2,004,182 | 2,117,104 |
| | 49,860,529 | 46,371,858 |

## 6.1 ගරු දීමනා

| | | |
|---|---|---|
| පාලන මණ්ඩලයට කරන ලද ගෙවීම් ඇතුළත් වේ | 600,000 | 544,000 |

## 7. පර්යේෂණ පිරිවැය

| | | |
|---|---|---|
| අකුරු සැකසුම හා මුද්‍රණ ප්‍රකාශන වැය | 2,509,889 | 2,571,472 |
| අන්තර්ජාල වැය | 2,375,748 | 1,907,138 |
| උපදේශන වැය | 10,025,331 | 7,362,336 |
| වෙනත් පර්යේෂණ වැය | 5.714,853 | 1,448,709 |
| | 20,623,821 | 13,289,655 |

## 8. වෙනත් මෙහෙයුම් වියදම්

| | | |
|---|---|---|
| ලියාපදිංචි සහ සාමාජික ගාස්තු | 200,880 | 604,525 |
| මුද්‍රණ වියදම් | 0 | 58,993 |
| කාර්යාල වැය | 1,642,137 | 737,389 |
| පාරිභෝජ්‍ය භාණ්ඩ | 287,752 | 476,042 |
| වෘත්තීය සහ නීති ගාස්තු | 1,072,849 | 306,861 |
| විගණන ගාස්තු | 461,941 | 90,244 |
| වෙළඳ දැන්වීම් | 126,675 | 60,200 |
| බැංකු ගාස්තු/ කොමිස් | 1137,007 | 206,870 |
| පරිපාලනයට අදාල වෙනත් වැය | 80,902 | 119,089 |
| කල්බදු කුලී | 1,950,000 | 780,000 |
| විවිධ වියදම් | 20,995 | 45,000 |
| බොල් ණය | 819,081 | 0 |
| | 6,800,219 | 3,485,215 |

9. ආදායම් බදු වියදම්- ජංගම බදු වියදම්

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ ආදායම් සහ ලාභ 1988 අංක 53 දරන ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතන පනතේ 19(4) ඡේදයෙන් හා 1990 අංක 42 දරන දේශීය ආදායම් පනතේ (සංශෝධන) 2(3) (LIX ) ඡේදය අනුව බදු වලින් නිදහස්ය.

10. මුදල් සහ මුදල් සමාන

| | | |
|---|---|---|
| බංකුවේ මුදල් | 2,714,529 | 6,024,617 |
| ඇරයුම් ගිණුමේ මුදල් (Call Account ) | 1,274,971 | 11,999,900 |
| විදෙස් මුදල් වලින් ඇති මුදල් (10.1 සටහන) | 22,458 | |
| සුළු මුදල් | 40,000 | 40,001 |
| | 4,048,958 | 18,064,518 |

10.1 බැංකුවේ ඇති විදෙස් මුදල්

| | | |
|---|---|---|
| යුරෝ ගිණුම | 22,485 | 0 |
| | 22,458 | 0 |

11. තැන්පතු සහ පෙර ගෙවුම්

| | | |
|---|---|---|
| පෙර ගෙවුම් (සටහන 11.1) | 973,968 | 1,676,423 |
| තැන්පතු | 306,000 | 296,000 |
| වෙනත් අත්තිකාරම් (සටහන 11.2) | 17,386,426 | 267,710 |
| | 18,666,394 | 2,240,133 |

11.1 පෙර ගෙවීම්

| | | |
|---|---|---|
| වෛද්‍ය රක්ෂණය | 0 | 855,957 |
| වෙනත් රක්ෂණ | 441,032 | 397,484 |
| වෙනත් පෙර ගෙවීම් | 532,936 | 422,982 |
| | 973,968 | 1,676,423 |

11.2 වෙනත් අත්තිකාරම්

මෙයට සර්වර්ස් ( Servers ) මිලදී ගැනීම සඳහා කරන ලද රු.16,917,358.00 ක අත්තිකාරම් මුදලක් ඇතුළත් වේ.

| | | |
|---|---|---|
| 12. වෙනත් අයවිය යුතු - වෙනත් අයවිය යුතු ( සටහන 12.1 ) | 338,698 | 1,914,624 |
| කාර්ය මණ්ඩල ණයගැති | 2,723,804 | 2,107,903 |
| | 3,062,502 | 4,085,528 |

12.1 වෙනත් අයවිය යුතු -

| | | |
|---|---|---|
| 4 වැනි කාර්තුව සඳහා ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන දායකත්වය0 | 793,845 | |
| ප්‍රදානකයින්ගෙන් කාර්ය මණ්ඩල ගමන් ගුවන් පත් ප්‍රතිපූරණ | 338,698 | 851,475 |
| වෙනත් අයවිය යුතු | 0 | 269,304 |
| | 338,698 | 1,914,624 |

මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2012 දෙසැම්බර් 31 වන විට

13. දේපොළ, යන්ත්‍ර සහ උපකරණ

| | කල්බදු ඉඩමේ ගොඩනැගිල්ල | පරිගණක උපකරණ | මෝටර් වාහන | ලී බඩු සහ සවි කිරීම් | කාර්යාල උපකරණ | පුස්තකාල පොත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| වැය | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් | රුපියල් |
| 2012 ජනවාරි 1 ට ශේෂය | 324,068,979 | 33,890,844 | 10,604,125 | 18,976,606 | 22,205,231 | 1,239,866 | 410,985,651 |
| එකතුවීම් | 1,167,910 | 5,117,178 | 0 | 127,885 | 112,838 | 3,250 | 6,529,061 |
| අඩුකළා ගිණුම් ගැලපීම් | (5167801 | 0 | 0 | 0 | 0 | 0 | (5167801* |
| අඩු කළා ඉවත් කිරීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2012දෙසැම්බර් 31ට ශේෂය | 320,069,088 | 3,900,8022 | 10,604,125 | 19,104,491 | 22,318,069 | 1,243,116 | 412,46,911 |
| සමුච්චිත ක්ෂයවීම් | 6,141,990 | 25,978,562 | 9,284,125 | 4,583,564 | 3,760,042 | 1,220,421 | 50,968,704 |
| ක්ෂයවීම් | 6,495,379 | 4,170,319 | 1,320,000 | 3,713,996 | 4,383,378 | 4,954 | 20,088,026 |
| අඩු කළා ඉවත් කිරීම් | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 2012 දෙසැම්බර් 31 ට ශේෂය | 12,422,044 | 30,148,881 | 10,604,125 | 8,297,560 | 8,143,420 | 1,225,375 | 70,841,405 |
| ඉදිරියට ගෙන ආ වටිනාකම | 307,674,044 | 8,859,141 | 0 | 10,806,931 | 14,174,649 | 17,741 | 341,505,506 |
| 2011 දෙසැම්බර් 31 ට | 317,926,989 | 7,912,283 | 1,320,001 | 14,393,042 | 18,445,189 | 19,445 | 360,016,948 |

දෙසැම්බර් 31 වන විට

14. ආයෝජන

| | 2012 රුපියල් | 2011 රුපියල් |
|---|---|---|
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම් | 0 | 13,915,303 |
| භාණ්ඩාගාර බිල් පත් (සටහන 14.1) | 110,463,617 | 95,679,986 |
| භාණ්ඩාගාර බිල් පත් ( සටහන 14.1) පාරිතෝෂික අරමුදල | 9,386,520 | 11,065,712 |
| භාණ්ඩාගාර බිල් පත් ( සටහන 14.1) කාර්ය මණ්ඩල | | |
| සුභ සාධන අරමුදල | 1,300,225 | 1,176,955 |
| ස්ථාවර තැන්පත | 81,981,674 | 66,748,349 |
| | 203132036 | 188,586,304 |

| | | |
|---|---|---|
| 14.1 ආයෝජන වෙළඳ පොළ වටිනාකම | | |
| භාණ්ඩාගාර බිල් පත් | 126,588,081 | 107,616,895 |
| | 126,588,081 | 107,616,895 |

| | | |
|---|---|---|
| 15. වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | | |
| ණයහිමියන් | 5,479,138 | 10,561,838 |
| උපචිත (සටහන 15.1 ) | 3,816,327 | 2,105,649 |
| රඳවා ගැනීම් බදු ගෙවිය යුතු | 0 | (25,237) |
| අර්ථ සාධක ගෙවිය යුතු | 0 | 636,032 |
| භාර්ඹ ගෙවිය යුතු | 31,084 | 18,042 |
| ඡශෘ ගෙවිය යුතු | 0 | 93,329 |
| | 9,326,549 | 13,389,653 |

| | | |
|---|---|---|
| 15.1 උපචිත | | |
| පර්යේෂණ ව්‍යාපෘති වියදම් | 1,639,637 | 628,179 |
| දුරකතන/අන්තර්ජාල ගාස්තු | 292,833 | 280,000 |
| විගණක ගාස්තු | 655,678 | 415,000 |
| විදුලිය | 643,840 | 578,832 |
| වෙනත් කාර්යාල ගාස්තු | 474,874 | 94,462 |
| ඉන්ධන | 109,465 | 109,175 |
| | 3,816,327 | 2,105,649 |

16. ව්‍යාපෘති සඳහා අත්තිකාරම් ලැබීම්

| | | |
|---|---|---|
| ජනවාරි 1 ට ශේෂය | 17,091,061 | 26,679,276 |
| වසර තුළ ලැබීම් | 89,681,643 | 48,568,778 |
| හඳුනා ගත් ආදායම | (73,551,125) | (58,156,993) |
| දෙසැම්බර් 31 ට ශේෂය. | 33,221,579 | 17,091,061 |

සම්පූර්ණ නොකරන ලද ව්‍යාපෘති ආදායම් ව්‍යාපෘති කාල සීමාවේ දී ආදායම් වශයෙන් හඳුනා ගන්නා අතර ඒවා ශේෂ පත්‍රයේ විලම්බනය කර ඇත. ව්‍යාපෘති වල අනාගත අපේක්ෂිත ලැබීම් සමග ඉදිරියට ගෙන ආ ශේෂය මෙම ව්‍යාපෘති වල අනාගත වියදම් සඳහා ප්‍රමාණවත්යැයි ගණනය කර ඇත.

## 17.සේවක සුභ සාධන

| | | |
|---|---|---|
| ජනවාරි 1 ට ශේෂය | 9,027,633 | 7,478,652 |
| වසර තුළ හඳුනාගත් වියදම් (සටහන 17.1) | 2,004,182 | 2,117,104 |
| වසර තුළ කරන ලද වැය | (81,981,674) | (568,123) |
| | | 9,027,633 |
| දෙසැම්බර් 31 ට ශේෂය | 9,484,256 | 9,027,633 |

2012 දෙසැම්බර් 31 වන විට ආයතනයේ සේවක සංඛ්‍යාව 53 කි. (2011දී 56)

2012 දෙසැම්බර් 31 වන විට ආයතනයේ සේවක ප්‍රතිලාභ ලැබීමට සුදුසු සේවක සංඛ්‍යාව 48 කි. (2011 දී 46) වගකීමට බාහිරව අරමුදල් ලබා නැති අතර එය වෘත්තීය ආයුගණක සමාගමක් විසින් තක්සේරු කර ඇත. මෙම ප්‍රතිලාභ ලබා දීමේ දී ආයතනයට වන පිරිවැය තීරණය කිරීමේ දී පහත සඳහන් උපකල්පන යොදා ගෙන ඇත.

| | |
|---|---|
| වට්ටම් ප්‍රමාණය | 11% |
| වැටුප් වැඩිවීමේ අනුපාතය | 6% |
| කාර්ය මණ්ඩල පිරිවැටුම | 7% |

17.1 වසර තුළ හඳුනාගත් වියදම්

| | 2012 | 2011 |
|---|---|---|
| ජංගම සේවා වැය | 834,161 | 811,998 |
| පොලී වැය | 902,763 | 785,258 |
| ආයුගණක වාසි/අවාසි | 267,258 | 519,848 |
| | 2,004,182 | 2,117,104 |

18 විලම්බනය කළ ආදායම් - ප්‍රාග්ධන ප්‍රදාන

| | | |
|---|---|---|
| ජනවාරි 1 ට ශේෂය | 305,858,626 | 312,132,649 |
| වසර තුළ ලබා ගත් ප්‍රදාන නියෝජනය කරන්නේ | 0 | 0 |
| නෙදර්ලන්ත රාජ්‍යයෙන් ලැබුණු ප්‍රදාන | 0 | 0 |
| එන්ඩොව්මන්ට් අරමුදලෙන් ප්‍රදාන | 0 | 0 |
| වසර තුළ ක්‍රමක්ෂය (mortized) | (6,242,013) | (6,274,023) |
| දෙසැම්බර් 31 ට ශේෂය | 299,616,613 | 305,858,626 |

19. කල්බදු පොරොන්දු

මෙම ආයතනය ඉඩම් කොමසාරිස්ට අයත් ඉඩමේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම වෙනුවෙන් වසර 30 ක කාලයක් මෙහෙයුම් කල්බදු පොරොන්දුවකට එළඹ සිටී. ඒ අනුව 2005 සිට 2009 දක්වා වසරකට රුපියල් 780,000 බැගින් ද 2010 සිට ඉදිරියට වසරකට රුපියල් 1,170,000 බැගින්ද ගෙවීමට බැඳී සිටී. කෙසේ වුවත් මෙම ඉඩම සම්පූර්ණයෙන්ම පවරා ගැනීම සඳහා ශ්‍රී ලංකාණ්ඩුව සමග සාකච්ඡා කිරීමට පියවර ගෙන ඇත.

දැනට බලපැවැත්වෙන කල්බදු ගිවිසුම අනුව පහත සඳහන් එක් එක් කාල පරිච්ඡේද සඳහා ගෙවිය යුතු අවම කල්බදු මෙසේය:

| | |
|---|---|
| වසරකට අඩු | රු. 1,170,000 |
| වසර1- 5 අතර | රු. 5,850,000 |
| වසර 5 ට වැඩි | රු. 18,720,000 |

20. ප්‍රාග්ධන පොරොන්දු.

2012 දී සර්වර්ස් ( Servers ) මිලදී ගැනීම සඳහා රු. 16,917, 358 ක් ගෙවන ලදී. 2013 දී ගෙවිය යුතු ශේෂය රු. 16,917,358 කි.

21. අදාල පාර්ශ්ව ගනුදෙනු

ආයතනය සහ Endowment Fund පාලනය වන්නේ එකම පාලන මණ්ඩලයකිනි. වසර තුළ දී ආයතනයට එහි මෙහෙයුම් සඳහා දායකත්වය වශයෙන් රු. 22,000,000 ක් ලැබිණ. ආයතනයට ශ්‍රී ලංකාණ්ඩුවෙන් රු. 13,666,000 ක් වර්තන වියදම් සඳහා ප්‍රදානය කෙරිණ. භාණ්ඩාගාරයේ ලේකම් ප්‍රතිපත්ති ආයතනයේ පාලන මණ්ඩලයට නිල සාමාජිකයෙක් වශයෙන් පත් වේ.

22. අවිනිශ්චිත වගකීම්
ශේෂ පත්‍ර දිනය වන විට අවිනිශ්චිත වගකීම් තිබුණේ නැත.

23. ශේෂ පත්‍ර දිනයට පසු සිද්ධීන්
ශේෂ පත්‍ර දිනයට පසුව ගැලපීම් සිදු කිරීමට හෝ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීමට අවශ්‍ය කරන සිද්ධීන් සිදු වූයේ නැත.

24. පාලන මණ්ඩලයේ වගකීම
SLPSAS ට අනුකූල වන ආකාරයට මෙම මූල්‍ය වාර්තා සකස් කිරීමට හා ඉදිරිපත් කිරීමට පාලන මණ්ඩලය වගකිව යුතු වන්නේය.




ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය, 100/20 නිදහස මාවත, කොළඹ 7
Tel: +94-11-2143100/2665068, Fax: +94-11-2665065, URL: http://www.ips.lk, Blog 'Talking Economics': www.ips.lk/talkingeconomics
Twitter: @TalkEconomicsSL, Facebook: www.facebook.com/instituteofpolicystudies